මධුර මනොහර කථාවස්තූන්

සඋදාහරණ කොට සන්න කරණලද

# පරාභව සූත්‍රය.

---

කළුතර සාරානන්ද ස්ථවිරයන් වහන්සේ ලවා

ශුද්ධ කරවා ගෙණ

කොළඹ වෙල්ල වීථියේ

නොම්මර 37 දරණ ස්ථානයේ

සුදර්ශන යන්ත්‍රාලයෙහි අද්‍රියන් කුරේ විසින්

අච්චු ගසා ප්‍රසිද්ධකරණලදී.

---

ශ්‍රී බුද්ධ වර්ෂ 2434.

---

COLOMBO—PRINTED BY A. COORAY

1891

ස න් න ස හි ත

# පරාභවසූත්‍රය.

මෙය ඛුද්දකනිකායෙහි (කුදුගොත්සඟියෙහි) සුත්තනිපාතයට ඇතුළත් සූත්‍රාන්තදේශනාවකි.

සම්මාසම්බුදුරජාණන්වහන්සේ විසින් දේශනාකරණලද මඞ්ගලසූත්‍රය ඇසූවාවූ දෙවතාවෝ භාග්‍යවතුන්වහන්සේ විසින් මඞ්ගලසූත්‍රයෙහිදී සත්ත්වයන්ගේ වැඩීමද සැපද ප්‍රකාශකරමින් එක්ප්‍රකාරයකින් වැඩීමම දෙසනලද්දේය. පිරිහෙන්නාවූ කාරණය නොවදාරණ ලද්දේය. එබැවින් දැන් සත්ත්වයෝ යම් හෙයකින් පිරිහෙද්ද විනාසවෙද්ද ඒ ඔවුන්ගේ පිරිහීම විචාරම්හයි මඞ්ගලසූත්‍රය දෙසූ දෙවනදවස් දසදහසක් සක්වළ දෙවියෝ බුදුහු මඞ්ගලසූත්‍රයෙන් අභිවෘද්ධිකාරණම වදාළේය පරිහානිකාරණයන් විචාරම්හයි එක සක්වළකට රැස්වූහ. එකල්හි ශක්‍රයාගේ නියෝගයෙන් එක් දෙවියෙක් බුදුන්කරා එළඹ 'පරාභවන්තං'' යනාදී ප්‍රශ්නයන් විචාළකල්හි බුදුහුන් පුච්ඡාවසිකවශයෙන් මේ සූත්‍රය වදාරණලද්දේය. මේ දෙසුන් කෙළවර උපන්නාවූ සංවේගයට අනුරූප පරිද්දෙන් නුවණින් විදසුන්වඩා සෝවාන් සකෘදාගාමී අනාගාමී ඵලයට පැමිණියෝ ගණන්මග ඉක්මූනෝයයි ප්‍රකාශකරණලදී.

මේ සූත්‍රදේශනාවෙහි ප්‍රකාශවන්නාවූ ධර්ම නම් ප්‍රධානවශයෙන් ඉහලොක පරලොක දෙක්හි පිරිහීමට මුඛ මාත්‍රයි.

සකලබෞද්ධ ස්ත්‍රී පුරුෂයෝ මේ ධර්මයන් සාරකොට භාවිතොද්ග්‍රහණය කලහොත් ඉහලොකාභිවෘද්ධියට සිතුම්ණිරුවණක් සමානවෙයි, පරලොව දෙව්මිනිස් සැපහා නිවන්සැප ස්වකර ගැණීමටද අතිසයින් පිටිවහල් වෙයි.

එබැවින් උභයලෝක ශ්‍රීසිද්ධි ප්‍රදාන පූර්වාඞ්ගමවූ මේ උත්තරීතර ධර්මය නිතර භාවිතාකිරීමෙන් නින්දා ගර්හා විපත්ති භඞ්ගතාදී මෙලෝ පිරිහීමද පරලෝ නරකාදී සතරඅපායදුකද වලක්වා, ස්වර්ගාපවර්ග සම්පත්ති ප්‍රතිලාභය අත්පත්කරගන්ට උත්සාහකට යුතුයි.

A. C.

# පරාභව සුත්තං.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

එවම්මෙ සුත්තං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ—අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

පරාභවන්තං පුරිසං මයං පුච්ඡාම ගොතමං,
භගවන්තං පුට්ඨු මාගම්ම කිං පරාභවතො මුඛං.

සුවිජානො භවං හොති සුවිජානො පරාභවො,
ධම්මකාමො භවං හොති ධම්මදෙස්සී පරාභවො.

ඉතිහෙතං විජානාම පඨමො සො පරාභවො,
දුතියං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

අසන්තස්ස පියා හොන්ති සන්තෙ න කුරුතෙ පියං,
අසතං ධම්මං රොචෙති තං පරාභවතො මුඛං.

ඉතිහෙතං විජානාම දුතියො සො පරාභවො,
තතියං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

නිද්දාසීලී සභාසීලී අනුට්ඨාතා ච යො නරො,
අලසො කොධමඤ්ඤණො * තං පරාභවතො මුඛං.

ඉතිහෙතං විජානාම තතියො සො පරාභවො,
චතුත්ථං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

යො මාතරං වා පිතරං වා ජිණ්ණකං ගතයොබ්බනං,
පහු සන්තො න භරති තං පරාභවතො මුඛං.

ඉතිහෙතං විජානාම චතුත්ථො සො පරාභවො,
පඤ්චමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

යො බ්‍රාහ්මණං වා සමණං වා අඤ්ඤං වාපි වනිබ්බකං,
මුසාවාදෙන වඤ්චෙති තං පරාභවතො මුඛං.

---

* කොධපඤ්ඤණො-කත්ථචි.

ඉතිහෙතං විජානාම පඤ්චමො සො පරාභවො,
ඡට්ඨමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

පහූතවිත්තො පුරිසො සහිරඤ්ඤො සභොජනො,
එකො භුඤ්ජති සාදූනි තං පරාභවතො මුඛං.

ඉතිහෙතං විජානාම ඡට්ඨමො සො පරාභවො,
සත්තමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

ජාතිත්ථද්ධො ධනත්ථද්ධො ගොත්තත්ථද්ධො ච යො නරො,
සඤ්ඤාතිං අතිමඤ්ඤෙති තං පරාභවතො මුඛං.

ඉතිහෙතං විජානාම සත්තමො සො පරාභවො,
අට්ඨමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

ඉත්ථිධුත්තො සුරාධුත්තො අක්ඛධුත්තො ච යො නරො,
ලද්ධං ලද්ධං විනාසෙති තං පරාභවතො මුඛං.

ඉතිහෙතං විජානාම අට්ඨමො සො පරාභවො,
නවමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

සෙහි දාරෙහි සන්තුට්ඨො වෙසියාසු පදිස්සති,
දිස්සති පරදාරෙසු තං පරාභවතො මුඛං.

ඉතිහෙතං විජානාම නවමො සො පරාභවො,
දසමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

අතීතයොබ්බනො පොසො ආනෙති තිම්බරුත්ථනිං,
තස්සා ඉස්සා න සුපති තං පරාභවතො මුඛං.

ඉතිහෙතං විජානාම දසමො සො පරාභවො,
එකාදසමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

ඉත්ථිසොණ්ඩිං විකිරණිං පුරිසං වාපි තාදිසං,
ඉස්සරියස්මිං ඨපාපෙති තං පරාභවතො මුඛං.

ඉතිහෙතං විජානාම එකාදසමො සො පරාභවො,
ද්වාදසමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

අප්පභොගො මහාතණ්හො ඛත්තියෙ ජායතෙ කුලෙ,
සො ච රජ්ජං පත්ථයති තං පරාභවතො මුඛං.

එතෙ පරාභවෙ ලොකෙ පණ්ඩිතො සමවෙක්ඛිය,
අරියො දස්සනසම්පන්නො සලොකං භජතෙ සිවන්ති.

නිට්ඨිතං.

සන්න සහිත

# පරාභව සූත්‍රය

**නමො තස්ස භගවතො අරහතො**

**සම්මාසම්බුද්ධස්ස.**

එවම්මෙසුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

මෙ, (ප්‍රවරතරාතිවිසුද්ධ සද්ධර්ම ගගනප්‍රවාහවූ අප්‍රතිලොකගුරු භාග්‍යවත් සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන්වහන්සේවිසින් කරවීක සකුණරවානුසාරමධුරොදාරගම්භීරාලාපයෙන් සර්වසුරාසුර ගණ හෘදයානන්දකොට වදාරණලද අසාසිත දරාගතයුතුවූ මේ පරාභව සූත්‍රාන්ත ධර්මදෙශනාව) මාවිසින්; එවං සුතං, මෙසේ මේ ආකාරයෙන් අසනලදී; එකං සමයං, එක්සමයෙක්හි; භගවා, (භග්නාකරණලද රාගඇතිහෙයින්) භගවත්නම්වූ සර්වඥයන් වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර සමීප යෙහිවූ; ජෙතවනෙ, (පූර්වස්වාමී හුගේ වශයෙන්) ජෙතවන නම්වූ; අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ, (සිවුපණස් කෙළක් ධනවියදම් කොට කරවා පිළිගන්වන ලදහෙයින් පශ්චිම ස්වාමීහුගේ වශයෙන්) අනාථපිණ්ඩිකනම් (විවිධතරුවරාභිරාමවූ) ජෙතවනාරාමයෙහි; විහරති, (දිව්‍යබ්‍රහ්මාර්යෙර්යාපථසඞ්ඛ්‍යාත චතුර්විධ විහරණයෙන් යුක්තව සකලවෛනෙය ජනයන්ට පීඩාකරණ ක්ලේශශත්‍රූන් සාධන නෛර්යාණික සද්ධර්මනැමති ඛඩ්ගපත්‍රදරා අභීත්වූනැමති මිණිඔටුනු පැලඳ අමිතශ්‍රමණගණපරිවෘතව මුළුලොව ලීලොපෙතකෙරෙමින්) වැඩවාශයකර වදාරණසේක.

අථඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසංකමි.

අථඛො, ඉක්ඛිත්තෙන්; අඤ්ඤතර දෙවතා, (නාමගොත්‍රවශයෙන්අප්‍රසිද්ධවූ) එක්තරා දෙවතාවෙක්; අභික්කන්තාය රත්තියා, ප්‍රථමයාමය ඉකුත්වූකල්හි (හෙවත්) මධ්‍යමරාත්‍රියෙහි; අභික්කන්තවණ්ණා, නොයෙක්වර්ණයෙන් (හෙවත්) තමන්ගේ ශරීරාලෝකයෙන්; කෙවලකප්පං ජෙතවනං, හාත්පසින් සියලු ජෙතවනය; ඔභාසෙත්වා, (චන්ද්‍රසූර්‍ය්‍යයන්මෙන් එකාලෝකකොට) බබුලුවා; භගවා, (කාමභවවිභව වශයෙන් පැවති තෘෂ්ණාගමනයන් අභිත්මාර්‍ගඥානනැමති මුඛයෙන් වාන්තකළ හෙයින්) භගවත්නම්වූ ලෝකස්වාමීන්වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතන්හි; උපසංකමි, එළඹියේය; (කොහොත් නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධවූ ඒ දිව්‍යපුත්‍රතෙම භාග්‍යවත්වූ සර්‍වඥරාජෝත්තමයානන් වහන්සේ කරා කුමක්පිණිස එළඹියේද යත්?.)

එක්සමයෙක දඹදිව සාගල සුංසුමාරගිරි කුසිනාරාදී නොයෙක් ඒ ඒ නුවරවල වැසි මහජනයෝ සන්ථාගාරශාලාදියෙහි රැස්ව සීතාරාමාදී බාහිර කථාවන්කියවන්නාහුය එකල ඔවුන් අතුරෙන් එකෙක් අද මාගේ මගුලෙක්ඇතැයි කියා නැගී ගියේය, ඒ වචනය මුල්කොටගෙණ මේ ලොව උතුම්වූ මගුල්නම් කවරේද? යන ප්‍රශ්නයක් උපදවා ඇසින්දුටු පැන්පිරූකල එළ ඇත් අස්රථආදී යහපත්දෙය මගුලැයිකියා ගත්හෙයින්, දෘෂ්ටමංගලික නම් වූද, කණට ඇසුණු සිරිවඩ්ඪය ධනවඩ්ඪය සුභය යනාදී යහපත්දෙය මගුලැයිකියා ගත්හෙයින්, ශ්‍රැතමංගලික නම් වූද, ඇඟ ගැල්වූ අතින් ඇල්වූ සඳුන් සුවඳ මල්ආදිය මගුලැයිකියා ගත්හෙයින්, මෘතමංගලික නම් වූද, යනමේ දෘෂ්ට ශ්‍රැත මෘත මංගලික වශයෙන් සියලුම ජනයෝ තුන්කොටසක්ව එකක් නියමකොට අදහානොගෙණ ඔවුනොවුන් විවාදකෙරෙමින් මංගලකොලාහලයක් ලොවපහළ කළාහුය * ඉක්බිති, ඔවුන්ට අධිගෘහිතවූ දෙවතාවෝද ඔවුන්ට මිතුවූ භූමාටුදෙවතාවෝද ඔවුන්ට මිත්‍රවූ ආකාශස්ථදෙවියෝද්දයි මෙසේ දසදහසක් සක්වළ සැටදහසක් කාමාවචර දිව්‍යලෝකවල දෙවියෝද අසන්ට කන්නැති හෙයින් හා සිතන්ට සිත්නැති හෙයින් අරූතල අසංඥතලයන් හැර එක්ලක්ෂ පණස්දහසක් බ්‍රහ්මලෝකවල රූපීබ්‍රහ්මයෝද යනමේ දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්ම

* කොලාහලපසක් ලෝකයෙහි කලින්කල පවත්නේය ඒ බව. "කොලාහලං නාම පංචවිධං කප්පකොලාහලං චක්කවත්තිකොලාහලං බුද්ධකොලාහලං මඞ්ගලකොලාහලං මොනෙය්‍යකොලාහලන්ති,, යනුයි.

මෙහි විස්තර මඞ්ගලසූත්‍ර අටුවාවෙන් දතයුතු.

සෙනාව දෘෂ්ට ශෘත මෘත මංගලිකවශයෙන් තුන්කොටසක්ව දොළොස් අවුරුද්දක් මුලුල්ලෙහි ඔවුනොවුන් විවාදකොට ඇවිදත් උතුම්වූ මඟුල්නම් මේයයි කියා එකක් නියමකොටගත නුහුණුවාහුය, ඉක්බිති මේසක්වල තව්තිසාදෙව්ලොව වැසි දෙවියෝ සමගිව ගමට ග්‍රාමභොජකයා යම්සේ නායක වේද රටවැස්සන්ට පෘථිවීශ්වරවූ මහරජ්ජුරුවෝ යම්සේ නායකවන සේද එමෙන් අපගේ ශක්‍රදෙවෙන්ද්‍රයෝ නුවනින් ගුණෙන් ඉසුරෙන් අපටවැඩිතරම්ව සිටිසේක උන්වහන්සේ කරාගොස් මේ ප්‍රශ්නය අසා අපසිත් සැක දුරුකොට ගණුම්හයි කථාකොට එකලට සුදුසුවූ ආභරණයෙන් සැරහී අඩුතුන්කෙළක් දෙවගනන් පිරිවරා පඬුපුල්සල අස්නෙහි දිලිහිදිලිහී උන් සක්දෙව්රජ කරා පැමිණ නිදුකානෙනි ලොවදූන් සත්වයෝ උතුම්වූ මඟුල්නම් කවරේදැයි? යන මංගලප්‍රශ්නයක් උපදවා දොළොස් අවුරුද්දක් මුලුල්ලෙහි විමසාඇවිද තවඑකක් නියමකොටගත නුහුණුවාහුය එහෙයින් ඒ ප්‍රශ්නය තෝරාකියා අපසිත සැක දුරුකරවයි යාඥ කළාහුය_ඉක්බිති සක්දෙව්රජතෙම පියවිම් පැණවත්හෙයින් තොපි මේ වචනය පළමුකොට කාගෙන් අසා දූනගතුදූයි සව් මහරජයෙහි දෙවියන් පටන් ක්‍රමයෙන් විචාරාගොස් මිනිස්ලොව මිනිසුන් අතිනැයි අසා දූන මෙකල දශබලධාරිවූ අපබුදුහු කොතැන්හි වැඩවසන සේක්දැයි විචාරා දෙව්රම් වෙහෙර වැඩවසන සේකැයි යනු අසා කිමෙක්ද ගම්භීරතර ප්‍රඥාණෙවවූ උතුමා විචාලෝද නොවිචාලෝදැයි අසා නොවිචාළ බැව් දූන තොපි තාරදිය තිබැදී අතින්කිරන්නාසේ ගිනිඅඟුරු තිබැදී කණමැදිරියන් අල්වාගෙණ ගිනිදල්වණ පිණිස පිඹ වෙහෙසෙන්නාවූන්සේ සනරාමර ලොකවාසීන්ගේ සිතළපන් සැක දුරුකොට ප්‍රශ්න විසර්ජනය කිරීම් ආදී වශයෙන් ධර්මදෙශනාකොට සියලු ලොකවාසීන් අජරාමර නිවන්පුර පමුණුවන පිණිස දසපෙරුමන් පුරා ලොවුතුරා බුදුවූ සර්වමංගල දෙශකවූ සර්වඥයන් වහන්සේ අතින් නොවිචාරා මා අතින් කුමටවිචාරව් ද? මේ කාරණය ඒ ලොකස්වාමීන් අතින් විචාරා දූනගන්නා පිණිස තොපි අපහා සමග එවයි කියා දසදහසක් සක්වල දිව්‍යබ්‍රහ්ම සෙනාව කැඳවාගෙණ මේ මඟුල් සක්වලට රැස්ව අස්ලොමයක් හෙලාලන පමණ තැන සැට සත්‍යා අසූ අනූ බැගින් ඉතාසියුම් වෙස්මවා හිවී ගැවසී සිටගෙණ සක්දෙව්රජහුගේ නියොගයෙන් එක්තරා දෙවතාවෙක් ශරීරප්‍රභා විහිදුවමින් ත්‍රෛලොකෛකතිලකවූ භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ වැඳ එකත්පස්ව සිට ගෞතම ගොත්‍රොද්භූතවූ බුදුරජානන්වහන්ස බොහෝ දිව්‍යමනුෂ්‍යයෝ මේලොව උතුම් මඟුල්නම් කවරේදෝ

හෝසි ; සිතා තවඑකක් නියමකොට ගත ආශුඤ්ඤුවායුය ස්වාමීනි
වැඩ කැමැත්තාවූ ඒ දෙවිමිනිසුන්ට උතුම් වූ ඒ මඟුල් නම් කව
රේද ? වදාළමැනවැයි යාඥා කෙළේය මෙසේ යාඥා කළාවූ දෙවිය
න්ට "අසෙවනා ච බාලානං" * යනාදීන් මඟුල් වදාරණ බුදුරජාන
න්වහන්සේ ආත්මාර්ථ පරාර්ථ භජක ප්‍රඥජීවිකාවක් නැති පූරණ
කාශ්‍යපාදී බාලජනයන්ගේ අසෙවනය ආත්මාර්ථ පරාර්ථ සාධක
ප්‍රඥාගතිඇති බුද්ධාදී පණ්ඩිත ජනයන්ගේ සෙවනය පූජාවට සුදුසුවූ
බුදු පසේබුදු මහරහත් ආදීන්ට දානශීලාදී ප්‍රත්‍යය ප්‍රතිපත්තීන්
පූජාකිරීමය බුද්ධාදී තුනුරුවන් පවතින භික්ෂු භික්ෂුන්‍යාදී සිවුව
ණක් පිරිස් හැසිරෙණ දානශීලාදි දසපින් කිරියවත් පවතින සුදුසු
පියසෙක විසීමය පෙරබුද්ධාදීන් උදෙසා කරණලද කුසල් ඇතිබ
වය ශ්‍රද්ධාශීලාදී සම්පත්තියෙහි මනාකොට පිහිටීමය බොහෝ
ඇසූපිරූතැන් ඇතිබවය අකුශලකර්මපථ විරහිත මණිකාර ස්ව
ර්ණකාරාදී අගාරිකවූද චීවර විචාරණසිබ්බනාදී අනගාරිකවූද ද්විප්‍ර
කාරවූ සිල්ප දන්නාබවය අගාරිකවූද අනගාරිකවූද ශීලාදි ගුණ
යෙහි මනාකොට හික්මීමෙන් ද්විප්‍රකාර විනය ඇති බවය මුසාවා
දාදීන් දුරුවූ කර්ණරසායනසුභාෂිතවූ යම් තෙපුලක් ඇතිබවය
අන්නපානාදිය සපයා දීමෙන් මවු පියන්ට උපකාර කිරීමය අඹු
දරුවන්ට වස්ත්‍රාභරණාදිය දීමෙන් සංග්‍රහ කිරීමය අකුශලකර්ම
පථයෙන් දුරුව ගොවිකම් වෙළඳාම් ආදීවූ නිරවුල් කර්මාන්තකිරී
මය අමිසදාන ධර්මදාන දීමය දශකුශල ධර්මයෙහි හැසිරීමය මවු
පිය දෙපක්ෂයෙහි දුප්පත් නෑසින්ට ධනධාන්‍යාදිය දීමෙන් සංග්‍රහ
කිරීමය ශීලසමාදාන වතාවත් කිරීම්ආදී නිරවද්‍ය කර්මාන්ත කිරීමය
ප්‍රාණඝාතාදී චතුර්විධ පාපයෙහි නොඇලී දුරින්දුරුව වැලකීමය
උමතු භාවයට පමුණුවන සුරාපාන යෙන් වැලකීමය කුශලධර්ම
යෙහි අප්‍රමාදවීමය බුද්ධාදීන් කෙරෙහිද මවුපිය ආදීන්කෙරෙහිද
ගෞරව කිරීමය ගුරුවරාදීන් කෙරෙහි යටත්වූ පැවතුම් ඇතිබවය
ලදදෙයකට උඩඟුනොව නොකිපී සතුටුවීමය ස්වල්ප වූවත් අනුන්
විසින් කරණලද උපකාර සැලකීමය කාමවිතර්කාදී අකුසල් දුරු
කරණු පිණිස බණ ඇසීමය අනුන් කළ වරද සහණය කිරීම
ලක්ෂණ කොට ඇති ක්ෂාන්තිය, අවවාදයක් කී කල යහපත ස්වාමීනි
කියා ආදර යෙන් කීකරුවන බවය, සන්හිඳුවන ලද කෙලෙ
සුන් ඇති ශ්‍රමණයන්ගේ දර්ශනය උවමනා කලට ධර්ම සාකච්ඡා
කිරීමය කෙලෙසුන් තවන වීර්‍ය්‍යඇතිබවය ශ්‍රමණ ධර්මයෙන් යුක්තව

* මෙහි මඞ්ගලසූත්‍රයෙහි සංක්ෂේප අදහස ප්‍රකාශිතයි.

ශ්‍රේෂ්ඨව හැසිරීමය දුඃඛාදී චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ දර්ශනය නිර්වාණයාගේ සාක්ෂාත් කිරීමය අෂ්ට ලෝකධර්මයෙන් මඩනාලද යමක්හුගේ සිත කම්පා නොවීමය ශෝකනැති බවය පහවූ රාගාදී රජස් ඇති බවය ක්ෂෙමවූ අමාමහනිවණට පැමිණි මෙන් සංසාර භය නැති බවය යන අටතිසක් පමණ කාරණයෝ ඓහ ලෞකික පාරලෞකික සම්පත් සාධාදී කෙළවර අජරාමර අමාමහනිවන් සිරිසැප ගෙණ දෙන හෙයින් උතුම්වූ මගුල්නම් වන්නාහුය මාවිසින් කියනලද මෙබඳු අභිවෘද්ධි දායකවූ මංගල්‍ය කාරණාවන් කොට කෙලෙස් සතුරන් විසින් නොපරදවන ලදුව හැමතන්හිම සුවයට පැමිණෙන්නාහුය එබැවින් සනරාමරලෝකවාසීන්ට අටතිසක් පමණ කාරණයෝ උතුම්වූ මගුල්නම් වන්නාහුයයි කියා ධර්මදෙශනා කොට මංගලකෝලාහලය සන්හිඳුවා වදාළසේක. දෙශනාවගේ කෙළවර කෙළලක්ෂයක් දෙවියෝ සකලක්ලේශයන් නසා රහත් බවට පැමුණුනාහුය· අසංඛ්‍යයක් දෙවියෝ සොවාන් සකෘදාගාමි ඵලාදියට පැමිණ අමාමහනිවන්පුර දක නිවීසැනහී ගියාහුය. මෙසේ මාගේ තිලෝගුරු බුදුරජානන්වහන්සේ මේ මංගල සූත්‍රාන්ත ධර්ම දෙශනාවෙන් සත්වයන් අමාමහනිවන් සිරිසැපතට පමුණුවා වදාළ දවසට දෙවෙනිදා දෙවියෝ ඒසේදවස් අප බුදුහු අභිවෘද්ධි දායකවූ මංගල්‍ය කාරණාවෝම වදාළසේක. සත්වයා පිරිහෙන කාරණ නොවදාළසේක ඒ අසා දැනගනුම්හයි කලපනාකොට දසදහසක් සක්වළ සතළිස් දහසක් අරූපාවචර තලයන්හා දසදහසක් අසංඥ තලයන් හැර සැටදහසක් කාමාවචර දිව්‍යලෝකවල දෙවියෝද එක්ලක්ෂ පණස්දහසක් රූපාවචරවල බ්‍රහ්මයෝද යනමේ සියලුම දිව්‍යබ්‍රහ්මසෙනාව මේ සක්වළට රැස්ව ඉදිකටු අගක් බහාලන පමණ තැන් සැටසත්‍යා අසූ අනූ බැගින් හිඳී ගැවසී සිටගත් දෙවියන්ගේ නිඝෝෂයෙන් පරාභවකාරණ විචාරණ පිණිස සුරාසුරගණමැද සරහිරුමඬලක්සේ බබලන දශබලධාරීන් වහන්සේ කරා එළඹියේය.

උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

උපසඞ්කමිත්වා, උපසඞ්ක්‍රමණ ක්‍රියාව අවසන්කොට (නොහොත් යම්තැනකට ගියේ උපසඞ්ක්‍රාන්තනම් වීද. එබඳු උපගන්තස්ථානයෙන් ප්‍රශ්න විචාරණ ධර්මශ්‍රවණාදී කෘත්‍යයට යෝග්‍යවූ ආසන්නතරස්ථානයට) පැමිණ; භගවන්තං, (භාග්‍ය වන්තතාදී අනන්තගුණ

ගණ්ඩයෙන්යුක්තවූ) ගෞතමබුද්ධපදෙනාමයානන්වහන්සේට; අභිවාදෙත්වා, නමස්කාරකොට; එකමන්තං, (අතිදූරාසන්නාදිප්‍රතිවා කොහනාතප්‍රදෙශ පශ්චාභිමුඛ ෂට් නිශද්‍ය දෙෂයන් වර්ජිතකොට සවත්පිරිසෙයින් වැඩලුන් තෙනට පස්රියනකින් දුරුව) එකත් පස්ව; අඨාසි, සිටියේය; එකමන්තං ඨිතා ඛො, එකත්පස්ව සිටියාවූ; සා දෙවතා, ඒ දිව්‍යපුත්‍ර තෙම; භගවන්තං, (සනරාමරලොකපූජනීයවූ) භාග්‍යවතුන්වහන්සේට; ගාථාය (''පරාභවන්තං'' යනාදී අක්ෂරපදනියමිත) ගාථාවෙන්; අජ්ඣභාසි, කීයේය; (නොහොත් මෙසේ විචාළේය).

පරාභවන්තං පුරිසං මයං පුච්ඡාම ගොතමං
භගවන්තං පුට්ඨුමා'ගමම කිං පරාභවතො මුඛං.

ගොතමං, (ගෞතම සෑකීනුගේ ගොත්‍රවශයෙන්) ගෞතම නම් වූ (ශාක්‍යකුලතිලකවූ) සර්වඥයන්; මයං, අපි හැමදෙනම; පරාභවන්තං, පිරිහෙන්නාවූ; පුරිසං, පුරුෂයා (උපලක්ෂණ කොට ඇතිහෙයින් යම් කිසි) සතෙකු; පුච්ඡාම, (අසා දැනගන්නා පිණිස) විචාරම්හ; (අපිත්වනාහි) භගවන්තං, (තුන්ලොව එකහෙලා පැවති කීර්තිඝොෂා ඇති) භාග්‍යවතුන් වහන්සේ; පුට්ඨුං, විචාරණ පිණිස; ආගමම, (ඒ ඒ සක්වළින් රැස්ව) ආම්හ; පරාභවතො, පිරිහෙන්නාවූ සත්ත්වයාහට; මුඛං, වාරය; කිං, කවරේද ? (හෙවත් පිරිහීම් කාරණ කවරේදැයි විචාළේය).

එකඑකම සත්වයෙකුනිසා යොදුන්ගණන් සවකීය ශ්‍රීපාදයෙන්ම වැඩ දහම්නැමති රුවන් බෙදදී සතුන් සපතායී ධනයෙහි පිහිටුවවා සුවපත්කරණ මහිම්වූ තිලොගුරු බුදුරජානන් වහන්සෙ දසද හසක් සක්වළින් එකතැනට රැස්වූ මේසා දිවසෙනගට බෙද නොදී කුමට සහවා තබනසේක් ද එහෙයින් මෙසේ පරිහානිකාරණ විචාළ දෙවියන්ට දහම්නැමති රුවන් ගබඩාවෙහි ශ්‍රීමත් ශ්‍රීමුඛ නැමති සඳුර මධුරවූ මිහිරිනාදයෙන් හැර මෘදු කොමල ජිහ්වාධාතු නැමති ශ්‍රීහස්ත තලයෙන් මනාපලෙස හැරගණුවයි කියා දහම් නැමති රුවන් බෙද දෙනසේක් පුද්ගලාධිෂ්ඨාන වශයෙන් ''සුවිජානො භවං හොති,, යනාදී ගය වදාළසේක.

සුවිජානො භවං හොති සුවිජානො පරාභවො
ධම්මකාමො භවං හොති ධම්මදෙස්සී පරාභවො.

ධම්මකාමො, දශකුශලකර්මපථධර්මය අසා පිළිපදනෝ; භවං හොති, (ලෞකික ලොකොත්තර සම්පත්තියෙන්) වැඩෙන්නෝ වෙයි; ධම්මදෙස්සී, (ඒ) දශකුශලකර්මපථධර්මයට වෛරීව නො

කාමැතිව අසා පිළිනොපදනේ; පරාභවො හොති, (දිව්‍ය මනුෂ්‍ය
සම්පත්හා නිර්‍වාණසම්පත්තියෙන්) පිරිහී සතරඅපායෙහිවැටී නස්
නේය.

"කායකම්මං තිධා වුත්තං වාචාකම්මං චතුබ්බිධං
මනසා තිවිධං වෙති දසකම්මපථා ඉමෙ".

යන්නුහෙයින් කායකර්‍මයයි කියනලද ප්‍රාණඝාත අදත්තාදාන
කාමමිථ්‍යාචාර යන ත්‍රිවිධවූ කායදුශ්චරිතය වාක් කර්‍මයයි කිය
නලද මුසාවාද පිසුනාවාච ඵරුෂාවාච සම්ඵප්‍රලාප යන මේ චතු
ර්විධවූ වාක් දුශ්චරිතය මනොකර්‍මයයි කියනලද අභිද්‍යා ව්‍යාපාද
මිථ්‍යාදෘෂ්ටි යන ත්‍රිවිධවූ මනොදුශ්චරිතය යන මේ දශඅකු
ශලකර්‍මපථධර්‍මයෙහි හැසිරෙන්නාවූ ධර්‍මද්වෙෂීවූ අසත්පුරුෂ
බාලජනයෝ මෙලොව රජදරුවන්විසින් පමුණුවනලද අත් පා
කන් නාසා හිස් කැපීම් ආදී නොවින්දහැකි නොබැලියහැකි
නරකදුක්හා සමාන ඉතාදරුණුවූ දෙතිස්කම්කටුලට පැමිණ ඒ
සින් චුතව ගියකල යමපලුන්විසින් දිලියෙන නානායුධ ගෙණ කඩ
කඩකොට සිඳුනාලද සතුන් නැවතනැවත දිවිඇතිවන "සංජීව"
නම් නරකය—එසේම යමපලුන්විසින් ප්‍රජ්වලිත විවිධායුධ ගෙණ
මහහඬින්හඬා දිවගොස් නිරිසතුන් දිලියෙන යපොලොවහෙලා
කළුහුයගසා දිලියෙන එරසුවෙන් අටපැති සොළොස්පැති කොට
සස්නාලද නිරිසතුන් ඇති "කාලසූත්‍රනම්" නරකය_ගිනිගෙණ දිලි
යෙන නවයොදුන් යපොලොව කටිප්‍රදෙශයදක්වා ගැලී නිශ්ච
ලව සිටිකල සතරදිගින් නැඟී පෙරලාඑන ගිනිගෙණ දිලියෙන
අයොමය පර්‍වතකූටවලින් සියුම්කොට වටනලද හඹ තල සේද
උක්දඬු කලඹක්සේද සුන්සුන්කොට මිරිකී නස්නාලද නිරිසතුන්
ඇති "සංඝාත" නම් නරකය—නවවාරයෙන් වැද නුසන ක්‍ෂාරධූම
යෙන් පැසෙනලද නිරිසතුන් ඇති "රෞරව" නම්නරකය_රක්ත
ලොහිත ජ්වාලාවෙන් පිරුණාවූ බලවත් දුඃඛයෙන් මඩනාලද
නිරිසතුන් ඇති "මහාරෞරව" නම් නරකය—යමපලුන්විසින්
දිලියෙන යපොලොව දිලියෙන යවුල්හී හිඳුවනලද සතුන් නිශ්ච
ලව දිලිහිදිලිහී පැසෙන "තාප" නම් නරකය—භෛරවරූපඇති
රාක්‍ෂසයන්විසින් භයානක නාදයෙන් හඬගසා දිලියෙන ආයුධ
යෙන් පැහැර නිරිසතුන් නගනලද අයොමය පර්‍වතයද එහි නැංගූ
සතුන් සිටිපියනොහී කර්‍මජවූ ක්‍ෂාරවාතයෙන් යටහිස්බලා හෙ
නකල අයොමය පොලොවින් නැඟී විනිවිද ඇනෙන තල්කඳන්සා

සවුල්ද එහි ඇනී දුක්විඳින සතුන් ඇති ප්‍රකෘතියෙන්ම ගිනිගෙණ දිලියෙන "ප්‍රතාප" නම් නරකය—පූර්ව දක්ෂිණ පශ්චිමොත්තරාදී සදිසායෙන් සියක්යොදුන් නරකමණ්ඩලය පුරා ගුගුරාගෙණ ගොස් පිටතටනික්ම සියක්යොදුන්තැන පැතිරෙණ ගිනිකඳු ඇති නලෙ කපුරළු සහුණුසේ නිරිසතුන්ගෙන් ගැවසීගත් ඔවුන්විඳින බලවත්දුක්න් අතුරුනැති "අවීචි" මහනරකය—යන මේ නව නව යොදුන් ගොල සපොළොව උඩපියන සතරබිත ඇති සතර සතර දොරටු ඇති එකිඑකී නරක දොරටුවෙහි සතර සතර උත්සදනරක වශයෙන් එක්සිය විසිඅටක් උත්සදනරක ඇති ඝොරතරත් භයානකවූ අටමහානිරයාදී එක්සියසතිස් නරකවල ඉපද එහි අනෙක වර්ෂ කොටි ශතසහස්‍රයෙහි පැසී එයින්මිදී ගියකල බලු බලල් කැනහිල් ගරවිල් දියබරණ ගඩවිල් කෝඳුරු මැසි මදුරු කවුඩු පැනි පණු මස් කැසුප් ආදී නොයෙක් තිරිසන් ජාතිවල ඉපිද ප්‍රමාණාතික්‍රාන්ත කාලයක් මුලුල්ලෙහි අපමණ දුක්විඳ එයිනුත්මිදී ගියකල සෙම්සොටු පමණවත් ආහාරයක් නොලැබ ඇතුල ගිනිගත් සිදුරු රුකක්සෙ සාපිපාශයෙන් කුසඇවිල දවණ ගිනි ඇති සියලඟ ගින්දූල් වෙලි වෙලී මහදුක් අනුභවකරණ ප්‍රෙතනිකායෙහිද එබඳුම ඝොරතර දුක්ඇති "කාලකඤ්ජ" නම් අසුරනිකායෙහි ඉපිද අනෙකවර්ෂකොටි ශතසහස්‍රයක් මුලුල්ලෙහි ඉතා නොවින්දහැකි නොසිතියහැකි කෲරතර භයානකදුක් අනුභවකරන්නාහුය.

එබඳු මහානර්ථදායකවූ ප්‍රාණඝාතාදි දශඅකුශලකර්මපථාදීන් දුරුව දානශීලාදී දශකුශලකර්මපථධර්මයෙහි හැසිර සිතුමිණිරුවන් ආදී සියලුම රත්නජාතීන්ටවඩා ශ්‍රෙෂ්ඨතරවූ විසුද්ධබුද්ධාදී තුනුරුවන්ම සරණකොටගෙණ වසන ධර්මකාමීවූ ශ්‍රද්ධාදී පඤ්ච ධර්මයෙන් යුක්ත සත්පුරුෂ පණ්ඩිත ජනයෝ.

"යො ධම්මචාරී කායෙන වාචාය උද චෙතසා
ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදති"

යනු වදාළබැවින් ඔහු තමන්ගේ නිරවද්‍ය භාවයනිසා ලොකයෙහි රජයුවරාජාදීන්විසින් පමුණුවනලද වධ බන්ධනාදියක්නැතිව නුවනැති බොහෝදෙනාගෙන් කීර්තිප්‍රශංසාදියලදින් ස්වකීය විභවානුරූපවූ සමපත් අනුභවකොට එයින්චුතව ගියකල මිනිස් ලොව අවුරුදුගණනාවෙන් අනූලක්ෂයකට ආයුෂඇති ශරීරප්‍රභාවයෙන් බබලන මහත්වූ සැපඇති සතරවරම්ආදී දිව්‍යගණයාගෙන් ආකූලවූ "චාතුර්මහාරාජික" දිව්‍යලොකය_තුන්කෙල සැටල

ක්‍ෂයකට ආයුෂඇති සුන්‍දරතරෙද්‍ර ශරීරාලෝකයෙන් බබලන අඩුතුන්කෙළක් දෙවඟනන් පිරිවර සැටයැලක් පුරලනලද අභරණයෙන් සැරහී යෙළුයාලක් සුවඳවිලවුන් ඇඟ ගල්වා අපමණ දිව්‍යතෙජසින් බබලන ශ්‍රේදෙව්ලොවදෙවියන්ට අධිපතිවූ සක්දෙව්රජආදී අමරනිකරාකුල ස්වර්ණමෙරුරාජයාපිට පිහිටි "තව්තිසා" දිව්‍යලොකය_තුදුස්කෙළසතලිස්ලක්‍ෂයකට ආයුෂඇති වර්ණවත් සැපබහුල නෙජිරාකුලවූ "යාම" නම් දිව්‍යලොකය_සත්පණස්කෙළ සැටලක්‍ෂයක් අවුරුද්දට ආයුෂඇති බුඩබොධිසත්‍වවරයන්ට නිවාශභූමිවූ අපමණ සෞඛ්‍යානුභාවයෙන් බබලන වර්ණවත් අමරගණකුල සකලසම්පත්තීන් උසිතවූ "තුෂිත" දිව්‍යලොකය-දෙසියතිස්කෙළ සතලිස්ලක්‍ෂයක් අවුරුද්දට ආයුෂඇති දශවිධස්ථානයකින් දිව්‍යප්‍රාප්ත සුරගණකීර්ණවූ "නිර්මානරති" දිව්‍යලොකය–නවසිය එක්විසිකෙළ සැටලක්‍ෂයක් අවුරුද්දට ආයුෂඇති දශවිධස්ථානයකින් අග්‍රප්‍රාප්ත මාරශ්‍රවසහ දිව්‍යාඞ්ගණකීර්ණවූ "පරනිර්මිත වසවර්ති" දිව්‍යලොකය-යන සදිව්‍යලොකයෙහි අපමණවූ දිව්‍යසම්පත්තියද බ්‍රහ්මපාරිසද්‍යාදී බ්‍රහ්මලොකවල ප්‍රීතිසැපආදීවූ බ්‍රහ්මසම්පත්තියද මිනිස්ලොව ක්‍ෂත්‍රියබ්‍රාහ්මණාදී උතුම් වංශවල ඉපද විඳයුතු සක්විතිරජඉසුරුආදී මනුෂ්‍යසම්පත්තියදැයි යන මේ අනන්තාප්‍රමෙය සුරබඹනරසිරිවිඳ කෙළවර අජරාමරවූ අමාමහනිවන්සිරිසැපතාවද පැමිණෙන්නාහුය එසේහෙයින් තමහට වැඩකැමති සාධුජනයන්විසින් ධර්මවෙශිනොව ධර්මකාමීව දානශීලාදී කුශලක්‍රියාවෙහි හැසිර ස්වර්ගාපවර්ගාසම්පත් අත්පත්කර ගැණිමට උත්සාහ කටයුතු.

භවං, වැඩෙන්නාවූ පුරුෂතෙම; සුවිජානො හොති, (ධර්මකාමී ප්‍රතිපත්ති දර්ශනයෙන් ශ්‍රවනයෙන්) සුවසේ දතහැකි වන්නේය; පරාභවො, පිරිහෙන්නාවූ පුරුෂතෙම; සුවිජානො හොති, (ධර්මවෙෂී ප්‍රතිපත්තිදර්ශනයෙන් ශ්‍රවනයෙන්) සුවසේ දතහැකි වන්නේයයි; (වදාළසේක) මෙසේ සුවසේ දතහැකි වන්නේයයි වදාළ කුශලධර්මයෙන් වැඩෙන්නාවූ පින්වත් කල්‍යාණ සත්පුරුෂ ජනයන් හා අකුශල ධර්මයෙන් පිරිහෙන්නාවූ ලාමක අසත්පුරුෂ බාලජනයෝ නුවනැත්තන් විසින් සුවසේ හැඳිනගත හැකිබව මේ මතු කියන ධර්මාධර්ම ජාතකයෙන් අසා දතයුත්තේය.

ඒ කෙසේද යත් ?

යටගියදවස දඹදිව බරනැස බඹදත්නම් නරපති කෙනෙක් ජනරජනය කරණකල අපමහ බෝසතාණෝ දෙව්ලොව ධර්ම නම්

දිව්‍ය රාජව උපන්සේක අතිකුදුකෙණෙක් අධර්ම්ම නම් දෙව්පිත්ව උපන්නේය. මොහු දෙදෙනා අතුරෙන් ධර්මනම් දිව්‍යරාජතෙම සර්වාලඞ්කාරයෙන් සරහනලද දිව්‍යරථයකට නැගී දිව්‍යසෙනග සමග මිනිස්ලොවට බැස දඹදිවට දකුණත්පසින් සව්‍යයෙනි ප්‍රාණඝාතාදී අකුසල් නොකරව දෙමව්පියන් කුලදෙටුවන් පුදව අම්බලම් ගොනවු කරව ඒදඬුලව යනාදීන් කියාගණ යන්නේ අධර්ම්ම නම්වූ දෙවියාද රථයකට නැගී දිව්‍යසෙනග සමග දඹදිවට වම්පසින් සව්‍යයෙනි ප්‍රාණඝාතාදී අකුසල් කරව කුසල් නොකරව දෙම්ව්පියන් කුලදෙටුවන් නුපුදව යනාදීන් අවවාද කියාගෙණ යන්නේය මෙසේ කියාගණ යන්නාවූ දිව්‍යරාජයෝ දෙදෙන දෙසෙනග සමග එකතැනකට හමුව මූනගැසී අධර්මයව පළමු කොට ධර්මය ලොව පහළවූයේය මම ධර්මයෙන් ලොවට අනුශාසනා කෙරෙමි එහෙයින් මට බාල කණිෂ්ඨවූ තෝ මට මගහරුවයි කීකල්හි අධර්මනම් දිව්‍යපුත්‍රද ධර්මයටවඩා අධර්මය බලවත එහෙයින් තොපි මට මගහරුවයි කීයේය මෙසේ දෙදෙනා බසින් බස කියා ගොස් අපදෙදෙනාගේ කියමනෙන් මාර්ගය ගැණිම සුදුසුනොවෙයි යුධකොට ජයගත් කෙනෙකුන්ට මාර්ගය වෙයි කියා අධර්මනම් දිව්‍යපුත්‍රතෙම කීයේය ධර්මනම් දිව්‍යරාජ තෙම තොපි කෙසේ ජයගණිදැයි විචාලකල්හි යකඩින් ලොහොයෙන් රත්රන් නස්නාසේ මගේ අධර්මතාවයෙන් තොපගේ ධර්මය නසා ජයගණිමියි කීයේය ඉක්බිති ධර්මනම් දිව්‍යරාජතෙම ලොව තොපට වැඩිකෙනෙකුත් නැත්නම් ධර්මයකුත් නැත්නම් තොපට මගහරිමි තොපි කී රළු පරළු තෙපුලටත් ක්ෂමාවෙමියි කියා මගින් ඉවත්වූයේය එකෙණෙහි දෙලක්ෂ සතලිස්දහසක් යොදුන් ඝනකඩ බොල් ගැඹුරඇති මහපොළොව පලාගෙණ ගිනිදැල්නැඟී අධර්මනම් දෙවියාගේ සියලඟ වෙලා අවීචිමහනරකයට ඇදගෙණ ගියේය, ධර්මනම් දිව්‍යරාජතෙම ධර්මයෙන් අධර්මය ජයගෙණ දිව්‍යසෙනග සමග තමුන් වසන දෙව්ලොවට ගියේය. තවද පෙර නුවතැත්තෝ ධර්මකාමිවූද ධර්මද්වෙෂීවූද සත්පුරුෂ අසත්පුරුෂයන් සුවසේ දැන හැඳිනගත් බව මෙහි මතු කියන සිරිකාලකණ්ණි ජාතකයෙනුදු සංක්ෂෙපයෙන් අසා දතයුතු.

කෙසේද යත්?.

පොළෝතෙලෙහි පටන් දෙසාළිස් දහසක් යොදුන් උස ඇති යුගන්ධරගිරිමුදුනෙහි පිහිටි තරුපෙණෙළ දෙව්ලොව පූර්වදිග වසන ගන්ධර්වාධිපතිවූ ධෘතරාෂ්ට්‍ර නම් දිව්‍යරාජයාගේ දූවූ සතලශ්‍රීක මීවූ ශ්‍රීකාන්තාවද දකුණුදිග වසන කාලපමණ අණඩ

ඇති කුම්භාණ්ඩයන්ට අධිපතිවූ විරූළ්හක නම් දිව්‍යරජයාගේ දූවූ නිශ්‍රිකවූ කාලකන්නීද යන මේ දෙවඟනෝ දෙදෙන බුදු පසේබුදු මහරහතන් තවුසන් සදෙව්ලොව දෙවියන් දෙවඟනන් බැස නානා වෙන වෙන තොටඇති තපනාතපයෙන් නොතැවෙන සුනිර්මල ජලඇති අනවතප්තවිල දෙවඟනන් බැස නානා තොටට නානාපිණිස ගොස් තොපට පළමුකොට මම බැස නාමි යනාදීන් දෙදෙන නානා වචන කියා ඩබරකොට ගෙණ නඩුවට සතරවරම් රජදරුවන් කරා ගොස් සිටියාහුය එවිට නාග සෙනාධිපති යක්‍ෂසෙනාධිපති දිව්‍යරජයෝ දෙදෙනා අපට වැඩිතරම් රජදරුවන් දෙදෙනාගේ දූවූ මුන්දෙදෙනාගේ ගුණ අගුණ කීම අපට සුදුසුනොවෙයි සිතා නොවිචාරම හැරපූහ උන්ගේ පියවූ දෙව්රජ දෙදෙනාද අප අපගේ දූන්ගේ ගුණ අගුණකීම අපටත් සුදුසුනොවෙයි සිතා දෙදෙව්ලොවට අධිපති අපස්වාමිවූ සක්දෙව්රජහු කරා ගොස් කියවයි කියා ඇරපූහ ශක්‍රදිව්‍යරජයාද මාඇමතියන් දූවූ මුන් දෙදෙනාගේ ගුණ අගුණකීම මටත් නොවටනේයයි සිතා තොපට මම උපායක් කියමි බරනැස වසන නිති පන්සිල් පොහොය අටසිල්රකිණ අඹුදරුදූසකම්කරුආදී සුපිරිස් ඇති සුචිපරිවාර නම් සිටානන්ගේ ගෙයි ඔහට වැඩිතරම් කෙනෙකුට දෙනපිණිස පනවාතිබෙන නොසිඳුල් අස්නෙක් ඇත තෙපි දෙදෙන ඒ සිටානන්ගේ ගෙට ගොස් ආසනය ඉල්වාගෙණ එකරුයක් එහි හුන්කෙනෙක් තොප දෙදෙනාගෙන් වැඩිතරම් බව තෙපිම දැනගණුවයි කීහ එකල නිලමැසි කවුඩු ශෘගාල සුනබාදීන් කැඳවන පිරිවරණ ගෙරිකුණපයක්වැනි නිශ්‍රික කාලකන්නී නීලවස්ත්‍රාභරණාදිය හැඳ පැළඳගෙණ සුචිපරිවාර සිටානන්ගේ ගෙට ගොස් පෙනී සිටියාහ ඈ දුටු සිටානෝ තෙපි කිනම්දූසි විචාළකල මම විරූළ්හක නම් දිව්‍යරජයාගේ දූවූ කාලකන්නීයයි කීවාය ඉක්බිති කුමක්නිසා මෙහි ආදූසි විචාළකල්හි නුබගේ නොසිඳුල් අස්න ඉල්වාගෙණ එකරුයක් එහිලැග යනපිණිස ආමි කීවාය එවිට සිටානෝ තීගේ ආචාරගුණ කවරේදූසි? විචාළේය එවිට මම කේලාම් කීම් කලඋපකාර නොසැලකීම්මෙර මාගේ ගුණමැකීම් ආදී අකුසල්කරණ යම් පමණ ලොව අසත්පුරුෂකෙනෙක් ඇත් නම් ඔවුන්කෙරේ ඇලී වසමි යනාදීන් තමාගේ ඇතිපමණ අගුණ ප්‍රකාශකොට කීවාය ඒ ඇසූ සිටානෝ තී මාගේ ගෙයි තබා මේ නුවරවත් සිටින්ට නොකැමැත්තෙමි වහා මාගේ ගෙන් යවයි කී හෙයින් කාලකන්නී මේ සිටානෝ මම කැමති අයට එකතුකෙනෙක්

නොවෙයි සිතා තමා ආකාරිය සිදුනුවූහෙයින් මුසුප්පුව පළා
ගියාය. ඉක්බිති හස්ත්‍යශ්වරථ ස්වර්ණධ්වජචාමරාදීයෙහි ඇලී
වසන සකල කුශලශ්‍රීකාමීවූ ශ්‍රීකාන්තාතොම රන්වන් වස්ත්‍රාභර
ණාදිය හැඳ පැලඳගෙණ සුවිපරිවාර සිටානන්ගේ ගෙට ගොස්
පෙනී සිටියාහ ඒ දුටු සිටානෝ ප්‍රෙමනීයවූ දැකුම්ඇති තෙපි කිනම්
දූයි විචාළේය එවිට ශ්‍රීකාන්තාතොම ශ්‍රිය ලක්ෂ්මිය පද්මාලය
යනාදී නම් ඇති ශ්‍රීකාන්තාව මමයයි කීවාය තෙපි කුමක්නිසා
මෙහි අවුදූයි විචාළේය එබසට ශ්‍රීකාන්තාතොම පළමු කාලකන්නී
කීකල ලෙසම කීවාය ඉක්බිති සිටානෝ තොපගේ ආචාරගුණ
කවරේදැයි? විචාළකල්හි මම අධිකතරශීතොෂ්ණසිංහව්‍යාඝ්‍රසර්ප
කටුකනුආදිය තෘණලවයක් කොටත් නොසලකා පුරුෂයන් විසින්
කටයුතුවූ ගොවිකම් වෙළඳම් ආදිය කරණ වීරවත් සත්වයන්කෙ
රෙහිද කෝලාම් නොකිම් මෙරමාගේ ඇතිගුණ ප්‍රකාශකිරීම් කළ
උපකාර සැලකීම් ආදී කුසල්කරණ යම් පමණ ලොව සත්පුරුෂ
කෙනෙක්ඇද්ද ඔවුන්කෙරෙහි ඇලී වසමි යනාදීන් තමාගේ ඇතිප
මණ ගුණ ප්‍රකාශකොට කීවාය ඒ ඇසූ සිටානෝ ඉතා ප්‍රසන්නව
තොපවැනි සිල්වත් ගුණවත් උත්තම සත්පුරුෂයන්ට මාගේ
මේ නොසිඳුල් අස්න හොබනේයයි කියා ආසනයෙන් පූජාකෙ
ළේය. මෙසේ ආසනයෙන් පූජාලත් ශ්‍රීකාන්තාතොම සංසාරසා
ගරයෙහි බැස නොනානාපමණක්මිස අනවතප්තවිලට පළමුකොට
බැස නානාබව කියනුම කවරේද? තව එපමණකිනුත් පිරිසිදුනුවූ
ශේය එතැන්පටන් අපමණ සුරමනුජසිරිවිඳ අවුත් අපමහදිප
දෘතනම ගෞතම බුදුන්ගේ කාලයෙහි සසුන්වැද මහණව සුවි
මලාතිසීතලශීලනැමති ජලයෙන් කෙලෙස්නැමති කුණුකසල
සොදාහැර පිරිසිදුව රහත්ව උපුල්වන් මහාසථවිරීයයි යන
නමින් ලොව ප්‍රසිද්ධව බුදුසසුන් බැබලවූවාය නිශ්‍රිකවූ ලාමක
කාලකන්නී අනවතප්තවිලට පළමුකොට බැස නාන්ට නොහැ
කිවූවත් අනන්තකාලයක් මුලුල්ලෙහි ඝොරතිගම්භිරතරවූ සං
සාරසාගරයෙහි ගැලිගැලී නහමින් සතරඅපාදුක් විඳින්නීය.

මෙසේ ධර්මකාමීවූ සත්වයන්ගේ සත්පුරුෂගුණයද ධර්මවෙෂීවූ
සත්වයන්ගේ අසත්පුරුෂගුණයද ඔවුනොවුන්ගේ ක්‍රියාවෙන්ම ලො
ව ප්‍රකාශවූහෙයින් සියලු දෙවිමිනිසුන් විසින් සුවසේ දැන හැඳින
ගත්තාහුය .එබැවින් පින්වත් සත්පුරුෂජනයන් විසින් ධර්ම
වෙෂීනොව 'ධර්මකාමීව ධර්මවෙෂීවූ අසත්පුරුෂයන් දැන හැඳින
ඔවුන් දුරින්ම දුරුකොට ධර්මකාමීවූ සත්පුරුෂයන් සෙවනාය

භජනය පයුපාසනය කොට දනාදි කුසල්කිරීමෙන් ස්වර්ගාප වර්ගසම්පත් අත්පත්කොට ගැණීමට උත්සාහ කටයුතු.

මෙසේ ධර්මකාමීවූ පුද්ගලයා වැඩෙන්නේය ධර්මද්වේෂීවූ පුද්ගලයා පිරිහෙන්නේය ධම්මකාමී ධම්මදෙස්සීවූ පුද්ගලයෝ සුවසේ දත හැක්වන්නේයයි භාග්‍යවතුන්වහන්සේ වදාළවචනයට ඉතා සතුටුව පූර්වාර්ධයෙන් ඒ පරිහානි කාරණ දන සිතතබාගත්බව ප්‍රකාශකරමින් අපරාර්ධයෙන් දෙවෙනි පරිහානිකාරණ විචාරන්නාවූ දිව්‍යපුත්‍ර තෙම "ඉතිහෙතං" යනාදී ගය කීයේය.

ඉතිහෙතං විජානාම පඨමො සො පරාභවො
දුතියං භගවා බ්‍රෑහි කිංපරාභවතො මුඛං.

ඒතං, මේ පරිහානිකාරණය; ඉතිහි, වදාළපරිද්දෙන්ම; විජානාම, දනුම්හ (හෙවත් සිත තබම්හ;) සො පඨමො පරාභවො, ඒ පළමුවෙනි පරිහානිකාරණය; (නොහොත් දන්නාපිණිස පරිහානිකාරණයන් අතුරෙන් එකෙක;) භගවා, (න්‍යසකලද ඉෂ්ට රූප රාගඇති නොහොත් රූපරාගය නැසුවාවූ) භාග්‍යවත; දුතියං, දෙවෙනි පිරිහෙන කාරණය; බ්‍රෑහි, වදාරා; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං, කවරේද;? (හෙවත් පරිහානි කාරණ කවරෙදැයි විචාළේය.)

මෙසේ විචාළාවූ දෙවියාට දෙවෙනිකාරණය ප්‍රකාශකොට දක්වන්නාවූ තුන්ලොවට සිතුම්ණිරුවණක් වැනිවූ බුදුරජානන් වහන්සේ "අසන්තස්ස පියා හොන්ති" යනාදීගාථාව වදාළසේක.

අසන්තස්ස පියා හොන්ති සන්තෙ න කුරුතෙ පියං
අසතං ධම්මං රොචෙති තංපරාභවතො මුඛං.

අසස්ස, (සද්ධර්මයට කැමති නොවීමෙන් පිරිහීමට පැමිණෙන) පුරුෂයාහට; අසන්තො, (මිථ්‍යාදෘෂ්ටිගත් පූරණකාශ්‍යපාදී අසත් පුරුෂයන් හා අනිකුත් කයින් වචසින් මනසින් අකුසල් කරණ නොසන්හුන්) අසත්පුරුෂයෝ; පියා හොන්ති,( කුණපයක් අනුභවකොට ආ සුනඛයක් වටකොට ගෙණ කුණු උද්ගිරණය නොහොත් වමාරවා ගන්නාපිණිස වෙනි සලසලා ඇඟ වෙලීවෙලී ප්‍රියබව හඟවන සුනඛපැටවුන්සේ) ප්‍රියවෙති; (සො, ඒ පිරිහීමට පැමිණි පුරුෂතෙම;) සන්තෙ, (බුද්ධාදී මහොත්තමයන් හා අනිකුදු කුශලක්‍රියාවෙහි හැසිරෙණ සත්පුරුෂයන්; පියං, තමහට ප්‍රියඉෂ්ට කාන්තමනාපයන්; න කුරුතෙ, නොකරන්නේය; (නොහොත් සත්පුරුෂයන්කෙරෙහි ප්‍රියමනාපව භජනය නොකරන්නේය)

අසතං ධම්මං, (සටක්‍යනලද පූරණකාශ්‍යපාදී නිවටුන්ගේ දෙසැට මිථ්‍යාදෘෂ්ටි ධර්මය හෝ සිත සන්හිඳීමක්නැති) අසත්පුරුෂයන්ගේ ප්‍රාණඝාතාදී අකුශල ධර්මය හෝ; රොචෙති, කැමතිව රැස්කරන්නේය; (ඕහට) තං, (යථොක්ත අසත්පුරුෂයන් කෙරෙහි ප්‍රීතිය සත්පුරුෂයන් කෙරෙහි අප්‍රීතිය අසධර්මයට කැමතිවීමය යන) මේ තුන; පරාභවතො මුඛං, (එහි යුක්තවූ පුද්ගලයාහට දෙලොවින්ම) පිරිහීමට කාරණයයි වදාළසේක.

දෙව්මිනිසුන් සහිතවූ බොහෝ ලොකවාසී සත්ත්වයන් කුශලධර්මයෙන් උගුළුවා අකුශලධර්මයෙහි පිහිටුවනහෙයින් මහානර්ථදායකවූ පව්වූ අදහස්ඇති දෙසැටදෘෂ්ටිගතිකයෝද ඔවුන්ට ප්‍රියමනාපව ඔවුන්ගේ විපරීතදර්ශනසඞ්ඛ්‍යාත මිථ්‍යාදෘෂ්ටිධර්මයෙහි හැසුරුනාවූ සත්ත්වයෝද යනමේ දෙපක්ෂයෙහි බාල අඥාන ජනයෝ මෙලොවත් මහත්වූ නින්දාගර්හාදියට පැමිණ චුතිචිත්තයෙන් මත්තෙහි අපායදුර්ගති විනිපාත සඞ්ඛ්‍යාත නරකයෙහි උපදනාහුය.

කෙසේද යත් ?.

සධර්මදෙශනානැමති දිවමතුරෙන් කෙලවරක් නැති දෙව්මිනිසුන් දමා අමාමහනිවන්පුර පුරවන අප බුදුරජානන්වහන්සේ ගණ්ඩම්බ නම් අඹරුකමුලදී යමාමහ පෙළහරක්කර වදාරණසේකැයි යනු තීර්ථකයෝ අසා රජගහනුවර සිටානන් විසින් ලොව රහත්කෙනෙක් ඇත්නම් සෘද්ධියෙන් ගොස් ඇරගණීත්වයි කියා සැටරියන් උස උණයටය මුදුනෙහි තබනලද රත්සඳුන්ගැටපාත්‍රයටත් අපිම තරම්හයි කියා එදත් අපගේම නොතරම්කම් හැඟවූම්හ නැවත මහණභවත්ගෞතමයන්ගේම ශ්‍රාවකවූ පිණ්ඩොලභාරද්වාජමහතෙරහු පෙළහරකොට ඒ පාත්‍රය ගත්හෙයින් එතැන්පටන් මහණගොයුම් තමන්ගේ ශ්‍රාවකයන්ට පෙළහර නොපානාලෙස ශික්ෂාපද පැනවූ බැවින් තමනුත් පෙළර නොකරති සිතා අපි මහණගොයුම් හා සමග පෙළහරකරම්හයි කියාත් ඇවිද්දම්හ දැන් වනාහි තමන් පෙළහර කරණසේකැයි යෙති ආදී කුමක්වූවත් මෙවක්පටන් නැසීගියම්හ එතකුදුළුවත් එක් උපායෙක් ඇත මෙතැපන්ටන් අපිත් ඔවුන් අත්නොහැරම ඇවිදුම්හ බොහෝදෙනත් අප දැක මේ කිම්දැයි විචාරති අපි උන්ට කියනකල මහණගොයුම්හු හා සමග පෙළහරක් කරම්හයි බසක් කියාපූම්හ උෟ අප කෙරෙහි හයින් දිවෙති උන් ලුහුබඳවා අල්වන්ට යන නියායයි කියම්හයි කතිකාකොට ගෙණ සවිත්ථිජීවක ගජේන්ද්‍රාතිවිද්‍යරණහිත මෘගෙන්ද්‍රසනනිභවූ අප බුදුරජානන් වහන්සේ සමග පසුපස්සෙහි කැටිවම සැවැත්නුවරට ගොස් උන්ට උපාසකව හිඳිනවුන්

සම්මාදම්කරවා ගෙණ මසුලක්ෂයක් ලදින් කරණ පෙළහර අසාරවූ වත් සාරවූ කිහිරිහරම කස්වලට ස්වූවා සුරඉසුරු කරණ සතුරු බව නොදනම විසිතුරුකොට මණ්ඩපයක් කරවා වාදෙව්පුත් පවනින් උපුල්වා හරණබව නොමදන නිල්මහනෙල් මල්පෙත් තෙන් සොයවා මෙතනදී පෙළහර පාම්හයි කියා සැදී උන්හ. ඉක්බිති සක්දෙවිඳුගෙන් නියොගලත් වාදෙව්පුත් චණ්ඩානිලවෙගයෙන් ඒ අහිරිකයන්ගේ කිහිරිහර මණ්ඩප උගුලුවා සුණුවිසුණු කොට කඩා කසළගොඩට දැමීය හිරුදෙව්පුත් අවුරුස තදකොට ඇඟ ඩා සෙල්විය නැවත වාදෙව්පුත් මහත් ධූලිරුසක් ගෙණ ඇහගැසීය වස්සවලාහක දෙව්පිත් තුනීකොට දළදළ පොදපෙළක් ඇඟහෙලීය එකල උන්ගේ පෙළහරත් කබරඇති ගෙරිසරක් සේවිය. ඒ දැක ලෙව් තමනතුකල ගෞතමු අප දිපදෙතනම බුදුන්ගේ උපාසකවරු අතපතදීගුකොට ඉස සලසලා ඇඟමඩ වැකී ඌරන්සේ මුන්කල පෙළහරෙකලෙස බලව යනාදින් කියන කරණ කවට ඉවසාගතනොහී මහත්ලජ්ජාවට නිඳුවට ගණිවට පැමිණ පිටියකට එකතුව උඩබලාහිඳ මිනිසුන් දුවුකල ඒ ඒ අතදිවන සිවල්රැලක්සේ ඉස්ලූලූඅත දිවපුහ එදවස්ම සියකට ගොස් කල්තබා ගවසින් උනාහැර හුලුකැන් ගෙණගිය කලය සහ රැහැන ගෙණ පෙළහරබලම් කියා එනඋන්ගේ උපාසකයෙක් අනාථව දිවන නිඝණ්ඨනාථයා දැක ස්වාමීනි සානා සිත් අදට තබා නුඹවහන්සේලාගේ පෙළහර බලන්ට එම් ඇසි හිමියා නෙති නුබවහන්සේ කොතනකට වඩනාසේක්දැයි කීය. තාගේ ඉලවු පෙළහරතබා තෙල කලය සහ රැහැන මටගෙණෙවයි ඉල්වා ගෙණ ගඟට ගොස් කලය රැහැන්මලයෙන් අසුරා බොවුවෙහි බැදගෙණ කුඩමසුන් අල්ලන්ට බස්නා කොවුල්කොල්ලෙකුමෙන් දියබුබුළු නගනගා ගිලීගොස් දියබී මිය අවීචියෙහි උපන. මෙසේ පූරණකාශ්‍යපය මක්ඛලිගොසාලය අජිතකෙශකම්බලය නිගණ්ඨනාථපුත්‍රය කකුධකාත්‍යායනය සඤ්ජය බෙලට්ඨිපුත්‍රය යන තිවවුන් සඳෙනෙක් තමන්ගේ පව්වූ අදහසට සතුටුව එකතුවසිටි සාරලක්ෂ අසූදහසක්පමණ ජනයෝද හැරගෙණ අවීචියට ගියේය. එසේ හෙයින් විෂ්ණුමහෙශ්වරාදී භක්තිගත් දෙසැටදෘෂ්ටිගත්කයන්ට ප්‍රිය මනාපනොව ඔවුන්ගේ ලාමක අසත්පුරුෂ ධර්මයෙහි නොහැසිර ඒ දුරින්ම දුරුකොට සකලලොකසත්වසමූහයා කෙරෙහි පතළාතුළු කරුණා සීතල චෙතනාවක් ඇති ප්‍රඥාප්‍රදීපාලොකයෙන් නසනලද මොහඳුරු ඇති සනරාමරලොකගුරුවූ බුදුරුවන

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

කෙරෙහිද ඒ සුගත තථාගතයාණෝ ඖරසපුත්‍රවූ ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනාදිවූ තුන්ලොවට පින්කෙත්වූ සඟුරුවන කෙරෙහිද ප්‍රියමනාපව ආදරභක්තිඋපදවා ඒ උතුමන්ගේ සුවිසිඅසඞ්ඛ්‍යෙය කටත්වඩා සඞ්ඛයන් අපායට යානොදීදරා අජරාමර නිවන්පුර පැමිණවූ ප්‍රවරතරධර්මරත්නයෙහි හැසිර දානසීලාදී කුසල්කොට අපමණ සුරනරසිරිවිඳ කෙළවර අමාමහනිවන්පුරසිරිසැපතට පැමිණෙන්ට උත්සාහ කටයුතු.

මෙසේ බුධාදී මහොත්තමයන් කෙරෙහිද බුදුන්වදාළ අවවාදානුශාසනාවෙහි පිහිටා වසන සත්පුරුෂයන් කෙරෙහිද අප්‍රිය අමනාපව දෙසැට දෘෂ්ටිගතිකයන් කෙරෙහිද ප්‍රාණඝාතාදී අකුසල්කරණ පව්වූ පුද්ගලයන් කෙරෙහිද ප්‍රියමනාපව ඔවුන්ගේ ලාමක හීන අසත්පුරුෂධර්මයට කැමතිව එහි හැසිරෙන්නාවූ සඞ්යා දෙලොවින්ම පිරිහීමට විනාසයට පැමිණෙන්නේයයි කියා මෙසේ මේ ගාථාවෙන් වදාළකල්හි වෙළඳාම්පිණිසගිය පුරුෂයෙක් ලක්ෂයක් අගයඇති බඩුවක් දහසකටලබා මහත්වූ සතුටට පැමිණ තවතව බඩුගන්ට විචාරන්නාසේ දෙවෙනිකාරණය වදාළලෙසින්ම දැනගතුම්හ තුන්වෙනි කාරණය කවරේද? වදාළමැනවැයි යාඥාකරන්නාවූ දිව්‍යපුත්‍රතෙම "ඉතිහෙතං"යනාදී ගය කීයේය.

ඉතිහෙතං විජානාම දුතියො සො පරාභවො
තතියං භගවා බෲහි කිංපරාභවතො මුඛං.

එතං, මේ දෙවෙනි පරිහානිකාරණය; ඉතිහි, වදාළපරිද්දෙන්ම; විජනාම, දැනුම්හ; සො දුතියො පරාභවො, (අසත්පුරුෂයන්කෙරෙහි ප්‍රියවීම් ආදිය ලකුණුකොට ඇති) හේ දෙවෙනි පරිහානිකාරණය වන්නේය; භගවා, (නසනලද භෙරිවීණනාරිගීතිකාදී ශබ්දරාග ඇති නොහොත් යහපත්වූ ශබ්දරාගනැසූ) භාග්‍යවතුන්වහන්ස; තතියං පරාභවතො මුඛං, තුන්වෙනි පරිහානිකාරණය; බෲහි, වදාර; කිං; කවරේද ? නොහොත් පිරිහීමට කාරණ කවරේදැයි විචාළේයි. (මෙසේ විචාළ දෙවියාට තුන්වෙනි කාරණය ප්‍රකාශකොට වදාරන්නාවූ සියලුම දෙව්මිනිසුන්ට ශාස්තෘවූ ගෞතම දිපදෙත්තම බුදුරජානන්වහන්සේ "නිද්දාසීලී" යනාදී ගාථාව වදාළසේක).

නිද්දාසීලී සභාසීලී අනුට්ඨාතා ච යො නරො
අලසො කොධපඤ්ඤාණො තම්පරාභවතො මුඛං.

ඥයා නාරෙ. (මෙලොව ක්ෂත්‍රියබ්‍රාහ්මණාදීන් අතුරෙන්) යම්කිසි සත්තෙක්; නිද්දාසීලී, නිද්‍රාකරණ සුලුද (හෙවත් යෙමින් සිටිමින් හිඳිමින් හෝමින් නිදන්නේම වේද;) මෙහි දක්වනලද නිද්‍රාකිරීමෙහි ආදීනව නම් කවරහ යත්.? * නිද්‍රාකිරීම වනාහි මෙලොවත් ගොවිතැන් වෙළඳාම්ආදී කටයුතු නසා පරලොවත් දෙව් මිනිස්සැප හා නිවන් මග සාධාදෙන කුසල් මග වසා සිටිහෙයින් දෙලොවින්ම මහත්වූ පිරිහීමට කාරණාව පවත්නේය.

එහි කෙසේද යත්:?

සටගියදවස බරනැස බඹදත් නම් රජකෙණෙක් ජනරඤ්ජනය කරණකල එක්කෙලෙඹි පුත්‍රයෙකුගේ ඔහු විසින් දෙන බත්කා ඇනමස් වැඩී සිටි බල්ලෙක් පසල්ගම්වැසි පුරුෂයෙක් දැක මසුරන් දහසක් හා අඳින්ට කඩක්දී බල්ලා ගෙණ ගියේය ඒ බලුද සොරමායමින් ඒ පුරුෂයාහට සුවච කීකරුව හික්මුනු ආකාරයක් දක්වූ හෙයින් බල්ලා යසී යන සැකයක් නොසිතා එක්දවසක් බල්ලා ගෙණ වනාන්තරයට ගොස් වරපටකින් බල්ලා බැඳ තබා ඔහු එක් තැනක වැදහෙව නිදන්ටවන එවේලෙහි අපමහ බෝසතානෝ කිසි කාරියක් පිණිස ගොස් එතනට පැමිණ බැඳ සිටි බල්ලාදැක තෙල වරපට කපාගෙණ නොගොස් බැඳුම්කා කුමට හිඳුද තොපවැනි අන්දමන්දයෝ නැතැයි කීසේක. බලු එබස් අසා පණ්ඩිතයාණෙනි කීයේ ඉතායහපත මමත් එසේම සිතාගෙණ හිඳිමි මොහු නිද්‍රාවට පැමිණිකල ඒ අවකාශයෙන් යෙම් කියා සිට නිදිබරවූකල ඒ වරපට කපාගෙණ පෙර තමන් විසූ තැනටම ගියේය මසුරන් දහසක්හා පිලිකඩක් දී ගෙණ බල්ලාගෙන් එකමස්සක ප්‍රයොජනත් නොව නිද්‍රාවට පැමිණි ප්‍රමාදය නිසා මහත්වූ පිරිහීමට පැමිණියේය.

තවද ප්‍රධාන තිස්සනම් වූ එක්තෙර කෙණෙක් තුන්ලොව සිතුමිණි වූ අප බුදුරජානන්වහන්සේගෙන් කමටහන් ගෙණ පන්සියයක් භික්ෂූන් සමග වළට ගොස් දෙවස් වස්වැස ඇවැත්කි

* "ආලසීපවලාසිකාඝවනාව වූ කායචිත්ත දෙදෙනාගේ අකම්නාබව කරන්නාවූ "ථිනමිඩ,,යයි කියනලද නිද්‍රාකිරීම වනාහි, කියා සන්නපොත්වලැ පෙණේ. මේ පාඨය යම්කිසි ආකාරයකින් වැරදීවැටී තිබේයයි හැඟෙන නිසාත් අබුවාවට එක නනොවන නිසාත් හැර දැම්මු. "නිද්දාසීලී නාම යො ගච්ඡන්තොපි නිසින්නොපි ඨිතොපි සයානොපි නිද්දායතියෙව,, යනු අටුවායි "නිද්දාරාමතං එව සීලං නිද්දාසීලං තං අස්සඅත්ථි,, යි යනාදීන් මෙහි කියනලද නිද්‍රාව "ථිනමිඩ,. නොවනබව දතයුතු.

තික පුස්තකාලයී

බුදුන්ගෙන් කමටහන් ගෙණ මේ වලට අවුත් ප්‍රමාදව විසීම සුදුසු නොවෙයි රෑ තුන්යම නොනිදා අප්‍රමාදව භාවනා කරවයි අවවාද දී අනුන්ට එසේම අවවාදානුශාසනා කළනමුත් උන්වහන්සේ රෑ තුන්යම නිද්‍රාවට පැමිණ කල්යවීමෙන් විශේෂාධිගමයකට නොපැමිණ මාර්ගඵලාධිගමයෙන් පිරිහිමට පැමුණුනුසේක. මේ නිද්‍රාවීමෙන්වන පිරිහීමය.

එයින් වැළකීමෙන් වන ආනිසංස කෙසේද යත හොත්?

අපබුද්ධරජානන් වහන්සේ සැවැත්නුවර වැඩවසන එක්සමයෙක පන්සියයක් වෙළෙන්දෝ පන්සියයක් ගැල් බඩුපුරවා ගෙණ වෙළඳාම්පිණිස ගමින් නික්මගොස් සවස්වේලෙහි එක්තැනක ලැගුම් ගත්තාහුය ඒ දැක ඔවුන් මරා බඩුගන්නාපිණිස පන්සියයක් සොරු කැටමුගුරු ගෙණ වටකොට සිටිකල ඒ වෙළඳුන් අතුරෙන් එක් සෝවාන් උපාසකයෙක් නොනිදා සක්මන්කරණ හෙයින් ඔහු නිදානුකල මරා බඩු ගණුම්හයි බලබලා සිට පාන්ව ගියකල කැටමුගුරු දමා තොපගේ බඩුහා ජීවිත රැකුනේ නොනිදා සක්මන්කළ උපාසකයා නිසායයි අඩගා දිවපූහ වෙළෙන්දෝ සුවසේ ගොස් වෙළඳාම් කොට ගෙණ අවුත් එක්දවසක් විහාරයට ගොස් ලොව්තුරා බුදුන් දැක වැඳ එකත්පස්ව සිටියාහුය ස්වාමිදරුවෝ උපාසකවරුනි මෙතෙක්දවස් කොතනක ගියෝදැයි විචාරා වදාළකල්හි ස්වාමීනි අපි වෙළඳාම්පිණිස ගියම්හ අතරමගදී අප මරා බඩුගන්නා පිණිස පන්සියයක් සොරු කැටමුගුරු ගෙණ වටකළ දවසෙක නොනිදා පාන්වනතෙක් සක්මන්කළ උපාසකයකු නිසා දිවිරැකුණෝයයි යනාදීන් සියලුම වූ පවත් සැලකළාහුය. එකල ස්වාමිදරුවෝ උපාසකවරුනි මමද පෙර බ්‍රාහ්මණකුලයක ඉපිද ගිහිගෙන් නික්ම ගොස් තාපසව වනයෙහි නොනිදා සක්මන්කරණ එක්සමයෙක ඒ වනයෙහි වසන එක් දෙවතාදුවක් නිදන්නන් අතුරෙන් නොනිදන්නෝ කවුද නොනිදන්නන් අතුරෙන් නිදන්නෝ කවුද යන ප්‍රශ්නයක් විචාළිය. සීලසංයමය ඉන්ද්‍රියසංවරය නවලොව්තුරා ධර්‍මය මම දන්නාහෙයින් ඒ දහම් නොදැනීමෙන් නිදන්නාවූ සතුන් අතුරෙන් නොනිදන්නේත් මමය සකලක්ලේශයන් නසා රහත්ව සම්මොහනිද්‍රාව දුරුකිරීමෙන් නොනිදන්නාවූ රහතුන් අතුරෙන් සම්මොහනිද්‍රාව දුරුනොකළහෙයින් නිදන්නේත් මම යයි කියා ඒ ප්‍රශ්නය විසඳීමි. එවිට දෙවතාදුව මම දන්නාලෙසම ප්‍රශ්නය විසඳුයේ ඉතා යහපතැයි කියා සියලුම වනදෙවතාවන් හා සමග මට සාධුකාර දුන්නේත් වේදැයි යනාදීන් ධර්‍මදේශනාකොට වදා

ලෙස්ක එබැවින් නිද්‍රාකිරීමෙහි ආදීවූ දොෂහා එයින් වැලකීමෙන්
වන ආනිසංසය මේ ආදිවශයෙන් අසා සිත තබාගෙණ ශරීර කලා
නතනසනපිණිස මදක්කල් නිදිමතවනබව මුත මෙලොව පර
ලොව දෙකින්වන වැඩපිණිස කටයුතු කාරණ උවමනාකාලයට
නොනිඳ වීර්‍ය්‍යකොට දානශීලාදී කුසල් රැස්කිරීමෙන් සගමොක්
සිරිසැපත් අත්පත්කොට ගන්ට උත්සාහ කටයුතු.

සභාසීලී, සභාවනිශ්‍රිත ස්වභාවයෙක් ඇත්තේවේද (හෙවත් බො
හෝදෙන රැස්ව කථාකරණතැනට එලඹ තන්නිශ්‍රිත කථාංවහි ඇ
ලුනේ නැවතනැවත යෙදේද) "පච්මෙ භික්ඛවෙ ආදීනවා
බහුභාණිස්මිං පුග්ගලෙ" යනාදීන් වදාළ බැවින් පමණ නොදැන
බොහෝකොට කථාකරන්නාවූ සත්වයෝ මුසාවාදකේලාම් පරුෂ
වචනසම්ඵප්‍රලාපකියන්නාහුය ඒ අකුසලයෙන් මරණින්මත්
තෙහි අපාය දුර්ගතිවිනිපාතසඞ්ඛ්‍යාතනරකයෙහි උපදනාහුය ඒ
බැවින් කඩුගත් අත්ඇති විද්‍යාධරයෝ සතරදෙනෙකු පිරිවරා අත
සළුව පලක් බැඳ හිඳ බොරුවත්කියා අහසින් බිමට වැටී පෙළොව
පලාගෙණ අවීචියටගිය මහාතෙජස්ඇති චෙතියරජසේ නොව පේ
සලගුණඇති එකතුව විසූ සහදෙනමක් ඔබ්නොබ කේලාම් කියා
බිඳුවා අපායට ගිය කූටතවුසා සේ නොව නන්දිවිසාල ජාතකයෙහි
වෘෂභරාජත්ව උපන් අපමහ බෝසතානන්ට කුලුවාදයෙන් පරුෂ
වචනකියා බැන දහසකින් පැරදී පිරිහුණු පුරුෂයා සේ නොව බො
හෝකොට කථාකරණහෙයින් බරනැස් මහරජහුවිසින් අතකුරු
ගැසීමෙහි දක්ෂ පිලෙනුයෙන්වා තිරයඇතුලේ හිඳුවා එලු ... පි..
පමණට කතුරෙන් තිරෙහි කල සිදුරෙන් අතකුරුකොට ගස්පන
ලද එලුබෙටි නැලියක් පමණ ගැල ලදජාවට පැමුණුනු පොරෙ
හිත බ්‍රාහ්මණයාසේ නොව පමණ දැන කථාකිරීමෙන් වාක්සුචරිත
ධර්මයන් පුරා ස්වර්ගාපවර්ග සම්පත්ති ප්‍රතිලාභයට පැමිණෙන්ට උත්
සාහ කටයුතු.

අනුද්ධාතාව, වීර්‍ය්‍යතෙජස් නැත්තේද (හෙවත් උවමනා කාලයට
නැගීසිටිනා සුලුනොවේද අනුන්විසින් වෙහෙසනුලබනුවම කිසි කි
සිකලෙක ගිහි ගිහි කම් පැවිජි පැවිජිකම් කෙරේද;) අලසො, ස්වභා
වයෙන් කුසී තාද (හෙවත් සිටිතැන සිටියේ හුන්තැන හුන්නේම
වූයේ තමාගේ බලයෙන් අන්ඉරියව්වක් නොකෙරේද) මෙහි දක්ව
නලද කුසීතබවෙහි ආදී නව කෙසේද යත්? හේ මේ චරණජාතක
යෙහි කියනලද ක්‍රමයෙන් සංක්‍ෂෙපයෙන් අසා දතයුතු.

සටගිසදවස ගන්ධාරරට තක්ෂලානුවර දිසාපාමොක් ආචාර්වූ අපමහ බෝසතානන් සමීපයෙහි සිල්පඋගන්නාවූ පන්සියයක් පමණ මානවකයෝ එක්දවසක් දර ගෙණෙනපිණිස වලට ගොස් දර කඩන්නාහුය ඔවුන් අතුරෙන් එක කුසීතමානවකයෙක් කොලවතුල මහත්වූ ලුනුවරණ ගසක් දක මලදර ගසෙකැයි සිතා මදක් මෙහි නිද ඉද පසුව ගසට නැගී දරකඩා ගෙණ යෙමියි සිතා උතුරුසළුව අතුට වැදහෙව තාසා හඬව හඬවා නිදන්ට වන සෙසු මානවකයෝ දරකඩා ගෙණ මිටිබැඳගෙණ යන්නාහු නිදන්නාවූ මානවකයා දක පිටිපත්ලෙන් ගසා පුබුදුවා ගියාහුය ඒ කුසීතයා නැගිසිට ඇසතිදි පිසපිස නිදිමතනොයාදීම ලුනුවරණගසට නැගී අත්තක් අල්වාගෙණ තමාදසාවට ඇද බිදීමෙන් බිදී නැගී අතුකෙළවරින් තමාගේ ඇස සිල්කොට ගෙණ එක්අතකින් ඇස වසා එක් අතකින් තොමලදරකඩා මිටියක් බැඳ ඔසවා ගෙණ ගොස් මානවකයන්විසින් එලවනලද දරමිටිමත්තෙහි එලූයේය එදවස්ම දනව් ගමෙක මිනුෂ්‍යයෝ බමුණන්ලවා සාතාතිකරවා දනුත් දක්ෂිණාවත් දෙමිහයි ආචාරීන් පැවරූය එකල්හි ආචාරී මානවකයන්ට කියන්නාහු දරුවෙනි සෙව එක් ගමෙකට යාහුතුය එසේහෙයින් තෙපි නිරාහාරව යන්ට අසමත්ථයව උදසනම කැඳපිසවා අනුභව කොට තොප ලබන කොටසත් අපට පැමිණි කොටසත් එක්කොට හැරගෙණ එවයි කීයේය එබස්ඇසූ මානවකයෝ කැඳ පිසනුපිණිස තෙල්ල පුබුදුවා නගා සිටුවා වහා අපට කැඳ පිසවයි කීවාහුය. කෙලීද කැඳ පිසනුපිණිස දරගණිමියි දරගොඩමත්තෙහි තුබූ අමු ලුණුවරණදඬුගෙණ ගින්නේලාපිඹින්නී ගිනිදල්වාගත නොහී හිරුනැඟුය මානවකයෝ ඉතාදවල්වගියේය දන් යන්ටනොපිළිව නැසී කියා ආචාරීන් සමීපයට ගියෝය ඒ දක දරුවෙනි කුමක්නිසා නොගියෝදැයි විචාලෝය එසේය ආචාරීන්වහන්ස නොගියම්හයි කිවූය කුමණකාරණවක් නිසාදැයි විචාලකල ස්වාමිනි අසවල් කුසීතමානවකයා අපහාසමග දරට ගොස් ලුණුවරණ ගසක්මුල වැදහෙව නිදපියා පසුව ගසට නැගී ඇසක් සිල්කොටගෙණ අමු ලුනුවරණදර ඇරගෙණ අපවිසින් පළමුකොට ගෙණවිත් එලනලද දරමත්තෙහි එලීය කැඳ පිසන තැනැත්තී ඒ වියලි දරයයි යන සංඥාවෙන් ගින්නේලාපිඹිනී හිරු නැගෙණතුරු ගිනිමොලවාගත නුහුනීය මේකාරණයෙන් අපගේ ගමනට බාධාවියයි කීහ ආචාරී මානවකයා කල කාරිය අඥතයන්ගේ කායකිතිසා මෙබඳු ලාභහානියක් වියයි කියා මානවකයන්ට මෙසේ කාරණ කීවාහුය. යම්කිසි පුද්ගලයෙක් මේ පළමුකොට කලමනාදෙය මේ පසුව කළමනා

දෙයයි පරීක්‍ෂානොකොට පළමුකොට කලමනාදෙය පසුව කෙරේද ඒ අඥාන පුද්ගලතෙම අමු ලූනුවරණ දරකඩා ගෙණවාවූ අපගේ මේ මානවකයාමෙන් පශ්චාත්තාපයට පැමිණ සොකකොට හඬන්නේයයි මෙසේ මහබෝසතානෝ අතවැස්සන්ට මේ කාරණය කියා දනාදී පින්කම් කොට ජීවිතාවසානයෙහි කම්වූපරිද්දෙන් මිය පරලොව ගියෝය එබැවින් පින්වත් සත්පුරුෂජනයන් විසින් කුසීතභාවයෙන් දුරුව අප්‍රමාදව මෙලොව පරලොව දෙකට උවමනා කටයුතුකිරීමෙන් ස්වර්ගාපවර්ගසම්පත්ති ප්‍රතිලාභයට පැමිණෙන්ට උත්සාහ කටයුතු.

කොධමක්ඛුද්දණෙ,*(ධජරථයටමෙන් දුම්ගින්නටමෙන්)ක්‍රොධය ම ලකුණුකොට ඇත්තේවේද (හෙවත් මෙබවරීතද වහාකිපෙන සුලුද ඕහට)ක්‍රොධකිරීමෙහි ආදීනව නම් කවරේද යත්? ඒ මේ සෙරිවාණිජ ජාතකයෙහි කියනලද ක්‍රමයෙන් සංක්‍ෂෙපයෙන් අසා දතයුතු.

යටගියදවස කච්ඡපුට වාණිජනම්වූ අපමහ බෝසතානෝ සෙරිවාණිජනම් කූටවෙළඳෙක් හාසමග නීලවාහනනම් ගඟින් එතරව අන්ධපුරනම් රට වීථිබෙදාගණ වෙළඳාම්කරණසේක එකල සෙරිවාණිජවෙළඳ, වෙළඳාම්කරණ වීථියෙහි දුක්පත්වූ සිටුකුලයක ශෙෂව සිටි මහලු ස්ත්‍රියකගේ ලදරු මිනිබිරියක් සෙරිවාණිජ වෙළඳා දැක මේ වෙළඳාගෙන් කදවළලු ඇරගෙණ දුනමැනවැයි මුත්තනියන්ට කීව ඒ අසා මුත්තනියෝ අපි දුක්පත් අය කුමක් දී වළලු ගණුමෝදැයි කීකල අපගේ මේ තලියෙක් ඇත ඉන් අපට කිසි ප්‍රයොජනයෙක්නැත ඒ තලිය දී පියා වළලුගතමැනවැයි කනගාටු බොහෝහෙයින් වෙළඳා කැඳවා ස්වාමීනි මේ තලිය හැරගෙණ තුබගේ නැගනියන්ට කිසිපලඳනාවක් දුනමැනවැයි කීවුය. ඒ ලොභීවූ වෙළඳා ඉදිකටුවෙන් සීරක් හැඳ රන්තලියබව දැන කිසිවකුත් නොදී වඤ්චාවෙන් ගණිම්යි සිතා මේ තලිය කුමක් අගීද අඩමදටකුත්පමණ මිලනැත්තේයයි කියා බිමට දමා හුනස්නෙන් නැගිට පලාගියේය ඒ නොබෝවේලාවකින් කදවළලු ගණුවයි කියමින් එතනට පැමිණි බෝසතානන් දැක කුමාරිකාතොමෝ මෑනියෙනි මේ වෙළඳානෝ පළමු ආ වෙළඳාසේ නොවෙයි ප්‍රියමොලොක්වූ කථාඇත්තේය එහෙයින් මේ තලිය දී මට පලඳනාඇරගණ දුනමැනවැයි කිය

* කොධසඤ්ඤණො — සමහර පොත්.

නහෙයින් බෝසතාණන්ට තලිසදී මේ තලිය හැරගෙණ නුඹගේ නැගනියන්ට කඳවලලූ දූනමැනවැයි කීවුය, බොධිසත්වයෝ ඒ තලිය රත්තලියකියාවදහා මෑතියෙනි මේ තලිය අගනාබඩු මා අත නැතැයි කීවුය ඒ අසා මැහැලි ස්වාමිනි පළමු අ වෙළඳ මේ තලිය අඩමස්සකුත් නොවටනේයයි බිම දමා ගියේය. දූන් නුඹගේ පිනෙන් රන්තලියවිය අපට යම්තම් දෙයක් දී ගෙණයය මැනවැයි කීවුය බොධිසත්වයෝ අතතුබූ කහවණුපන්සියයහා පන්සීයයක් වට නා බඩුත් ඈමවාම දී ගඟින් එතරගාමට කහවණු අටක් පමණ දූනා මැනවැයි ඉල්වා ගෙණ වහවහා ගංතෙරට ගොස් කහවණුඅට තොට වියාට දී ඔරුවට පැනනැංගාහුය ඉක්බිත්තෙන් ලොභී වෙළඳ නැවත ඒ ගෙට ගොස් යන්තම් මිලයක් දෙමි මා පළමු බලා දමාපියා ගිය තලිය ගෙණෙවයි ඉල්ලා බෝසතාණෝ ලක්ෂයක් වටනා ඒ තලිය දහසක් දී ගෙණ ගියබව අසා ලක්ෂයක්වටනා රන්තලියෙන් පිරිහී ගියෙමි මට වූයේ මහත් හානියෙකැයි ශොකයට පැමිණ සිත උමතුව අතතුබූ බඩුත් එම ගේ දොරම දමා හිනපිළිත්හෙලා පළන් දඬු මුගුරක්සේ අල්වාගෙණ වහවහා ගංතෙරට දිවගෙණ ගොස් ඔරුව මෙගොඩට පදුවයි කියා නොපදිනා හෙයින් එතර යන බෝ සතාණන් බලබලාසිට මහත්වූ සොකයට පැමිණ ලයහුනුව හුනු ලේ මුඛයෙන් නැගී ලයපැලී බෝසතුන් කෙරෙහි නිස්කාරණ යෙහි වෛර බැඳ මිය ගියේය. එතැන්පටන් පස්කල්පයක් මුලුල් ලෙහි ඒ බැඳගත් වෛරය නොහැරම සසරඇවිදිනාහු නො යෙක්වර ස්වකායෙන්ම නිරය ගැලිගැලී මහත්වූ සතර අපාදුක් විඳවිඳ අවුත් මහිමිවූ බුදුරජාණන් මුලුලොව සනහා බුදුවූජාතියෙහි පවා තුන්ලොව එකහෙලා බබලන බුදුසිරි දූක දූකත් සිත පහදවාගතනොහී මහමෙරවිද සිඳුරුකරන්ට උත්සාහකරණ මඬු රුමෙවකුසේ දිනූ පස්මරුන්ඇති තිලෝගුරු සොඳුරු බුදුරුව විදි නපිණිස දුනුවායින් යවීම් නාලාගිරිතු මෙහෙයීම් හිසමී ගල් පෙරළීම් ආදී නොයෙක් අනර්ථකොට ගෙණ පොළොව පලාගෙණ නැගී ගිනිදලින් සීපලඟ වෙළතලදුව ස්වකායෙන්ම අවීචිමහ නරකයට ගියේය.

තවද යටගියදවස මගදමවලනම් ගම ස්වගීයට මාගීය නානා මඝමානවකාදීන් තිස්තුන්දෙනෙක් දූක තොපට මේ නිෂ්ප්‍රයො ජන කම්ස්ථානයෙන් කුමන ජීවිකාවෙක්ද ගා මස්වෙළඳාම් කොට ජීවත්වෙවයි කීබස් ඒ තිස්දෙනා නොගත්හෙයින් එපමණකටම කිපී බරනෑස්රජ කරා ගොස් ස්වාමීනි නුඹට සතුරුවූ සොරු තිස්තුන්

මදමනකු දුර්භික්ෂ බොරු ගතුකියා ගෙන්වා මරවන්ට උත්සාහ කළ ගම් මුදලියෙක් එම රජහුවිසින්ම නැවත කාරණ සොයා එම තෙතිස්දෙනා දස්කොට දී ඔහුගේ ගමත් දුන්නේය මදකින් කිපී කරන්ට උත්සාහ කල අපරාධය නිසා එමජාතියෙහි අනුන්ට දසව ගමත් නැතිව පිරිහීමට පැමුණුනේය.

තවද දත්දෙන්ට කිසිවක්නැති දුක්පත්වූ දෙමහල්ලෝ දෙදෙනෙක් තමන් වදගත් දරුවෙක් විකොට දෙනාක් ගෙණවාහුය ඔවුන්ගේ ශුබාබලයෙන් ඒ දෙන දවසකට තෙල්ම නැලි සතරක් දෙන්නීය ඒ දෙන දෙන තෙල් ගෙණ දන් දෙමින් බුදුන් උදෙසා පහන් දල්වමින් කල්යවන අතරට ඒ ගම ගම්මුදලියා එපවත් අසාගොස් රාජසන්තක වසතුව සඟවා ගෙණ තෙපි ප්‍රයොජනවිඳිනේ ඇයිදැයි භයගැන්වූහෙයින් මේ රාජපුරුෂයා කිපී අපගේ දූනයට හානියක් කොළේවිනම් නපුරැයි සිතා ඔහටත් දවස්පතා තෙල්කාලක් දෙමින් සිටියදීත් ඔහු රාජකාරියකට ගිය අතරක දවස්කීපයක් තෙල් දෙන්ට බැරිඋනුහෙයින් එපමණකටම කිපී තෙල්කවම් කියාගොස් රජහට ගතුකියා ඒ දෙන බැඳගෙණ ගියේය දෙන ඇති දුක්පත් සත්‍රියද පසුපස්සේ ගියාය රාජදෙවී සව්බරනින් සැරසී තෙල් දෙනාපිණිස දෙනගේ තානය ඇද පොදකුත් දෙවගතනොහී වෙහෙසී දෙනඇති දුක්පත් සත්‍රිය සොයා කැඳවා ගොණ තෙපිවත් තෙල්දෙව දෙවහී කීයේය නොදෙව දවස්ගණනක් පසුවූහෙයින් සැලිතාලිකීපයක් උවමනාවේදැයි ගෙන්වා ගෙණ තනයට අතගෑසූ කණියෙහිම තෙල්වැගිර සැලි තාලිකීපයම පිරී ඉතිරී ගියේය ඒ ආශ්චර්යය දැක සතුටුවූ රජ මෙතෙක්කල් මේ තෙල් තෙපි කුමක් කලාදැයි විචාළකල දරුවා විකොට දෙනගත් තැන්පටන් පැවත් සිගලු පවත් කියා මේ තෙල් දන්දෙමින් පහන් දල්වමින් කල් යවන අතරට මේ ග්‍රාමභොජකයා අප භයගන්වා දන්දෙන තෙල් පැහැර සුභක්කල් කාත් මදකින් කිපී අපට කළ මේ නපුරැයි කීය ඒ ඇසූ රජ කිපී ඒ තෙල්කාල් සොරා කෑ තෙල්කාල් ගණනට වඩා වාල්වැඩ කරණපිණිස ඒ දුක්පත් ගැහැනියට වාල්ව ගමත්නැතිව මහත් පිරිහීමට ලජ්ජාවට නින්දාවට පැමුණුනේය ගම්මුදලියා වහල්කොට දී ඔහුගේ ගමත් දුන්නේය දුක්පත් ගැහැනිය වදගත් දරුවා විකොට ගෙණ දෙනගෙන් දෙනාදෙන පමණක් කා ඉවසා ගතනොහී මදකින් කිපී ගතුකියා එම දුක්පත් ගැහැනියට වහල්ව ගමත් නැතිව මහත් පිරිහීමට ලජ්ජාවට පැමුණු

හේය එබැවින් ක්‍රොධයෙහි ආදීනව මේ ආදී වශයෙන් නොයෙක් තැන වදාළ බුඬවචන දැන හැඳින ගෙණ පෘථග්ජනසිත ස්වභාවට කිපුනේවීනමුත් කාරණා සලකා වහාම ක්‍රොධය සංසිඳුවා ගෙණ සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රීකිරීමෙන් ස්වර්ගාපවර්ග සම්පත්ති ප්‍රතිලාභයට පැමිණෙන්ට උත්සාහ කටයුතු.

තං, නිදන සුලුබව දොඩන සුලුබව වීර්‍ය නැතිබව කුසීතබව කිපෙනසුලුබව යන මේ පස; පරාභවතො මුඛං, (එයින් යුක්ත සත්වයාට දෙලොවින්ම) පිරිහීමට කාරණයයි (වදාළ සේක.)

ශරීරක්ලාන්ත දුරුකරණපිණිස උචිතවූ කාලයට මදක් නිදිම කනොවී අකාලයෙන් නිතරම නිදන ස්වභාවයට එළඹ නිෂ්ප්‍රයොජන කථාවෙන්ම දවස් යවන ගොවිතැන්වෙළඳාම්කරණ දනාදී කුසල්කරණ උචිතවූකාලයක් පැමිණිවිට වීර්‍ය තෙජස් නැතිකමෙන් සිහිමඳව පමාවන කුසීතබැවින් හුන්තැන සිටිතැනම සිටින සිහිමඳව කීබස් පමණකටත් කාරණා කාරණා නොලසකා වහාකිපෙන සත්වයා මෙලෝ පරලෝ දෙකින්ම කිසි වැඩකට නොපැමිණ පිරිහීමට විනාශයට පැමිණෙන්නේයයි මෙසේ වදාළකල්හි තෙතිය සිටානන්ගේ බත් කුසපිරෙණතෙක් කාත් රසබෝහෙයින් තෘප්තියකට නොපැමිණ තව තව කැමතිවූ බිම්බිසාර මහරජසේ කාරණා තුණක් අසාත් තව තෘප්තියකට නොපැමිණ සතරවෙනි කාරණය කවරේද ? වදාළමැනවැයි යාඥකරන්නාවූ දිව්‍යපුත්‍රතෙම "ඉතිහෙතං" යනාදී ගය කීයේය.

ඉතිහෙතං විජානාම තතියො සො පරාභවො
චතුත්ථං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

එතං, මේ (ත්‍රිවිධ පරිහානි) කාරණය; ඉතිහි, වදාළපරිද්දෙන්ම; විජානාම, දනගනුම්හ; සො තතියො පරාභවො, ඒ තුන්වෙනි පරිහානිකාරණය; භගවා, (නසනලද ප්‍රමද සඳුන්ජබාදුආදී ගන්ධරාග ඇති නොහොත් යහපත් සුගන්ධරාගනැසූ) භාග්‍යවතුන්වහන්ස; චතුත්ථං, සතරවෙනි පරිහානිකාරණය: බ්‍රෑහි, වදාර; පරාභවතො මුඛං, සත්වයා පිරිහීමට කාරණය; කිං, කවරේදැයි; ? (විචාළේයි).

මෙසේ විචාළ දෙවියාට සතරවෙනි කාරණය ප්‍රකාශකොට වදාරණ අනාථපිණ්ඩනාථවූ භාග්‍යවතුන්වහන්සේ "යො මාතරං වා" යනාදී ගය වදාළේයි

යො මාතරං වා පිතරං වා ජිණ්ණකං ගතයොබ්බනං
පහුසන්තො න භරති තං පරාභවතො මුඛං.

යො, (ක්‍ෂත්‍රිය බ්‍රාහමණාදී) යම් කිසිවෙක්; ජිණ්ණකං, (ශරීර ශෛථිල්‍යයෙන්) දිරූණු (හෙවත්) මහලුවූ; ගතයොබ්බනං, ගිය යොවුන් ඇති (හෙවත් අසූඅනූවයස්ඇති හෙයින් සියඅතින් කම්මාන්තනොකොටහෙන); මාතරං වා, වැදූමෑනියන් හෝ; පිතරං වා, පියානන් හෝ; පහුසන්තො, පොහොසත්වූයේ (හෙවත් සමර්ථව සුවසේ ජීවත්වන්නේ); නභරති; පොෂණය නොකෙරේද; (ඔහට) තං, ඒ (මව්පියන් පොෂණය නොකිරීම); පරාභවතො මුඛං, (දෙලොවින්ම) පිරිහීමට කාරණයයි (වදාළසේක).

තමන් පොහොසත්ව සිටගෙණ දෙමව්පියන් රක්‍ෂානොකිරීමෙන් වන ආදීනව කවරේද යත් ?.

“තාය නං පරිචරියාය මාතාපිතුසු පණ්ඩිතා
ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙව මොදති”.

යනු හෙයින් “යමෙක් දෙමව්පියන්කෙරෙහි ආදරගෞරව උපදවා අත්පාමෙහෙ කිරීමෙන් හා කෑඳබත් දීමෙන් යහපත් කොට රක්‍ෂාකෙරේද ඔහට බුද්ධාදී මහොත්තමයෝ ප්‍රසංසාකරන්නාහුය හෙතෙම මිය පරලොව ගියකලත් දිව්‍යලොකයෙහි ඉපද අපමණවූ දිව්‍යසූරෙන් ප්‍රමුදිත වන්නේමැයි” දක්වනලද මේ අනිසංසයටත් නොපැමිණ දෙමව්පියන් නොරක්නේ අන්කාරණ කිම්දැයි කියා සියල්ලන් විසින් හළයුතුබවටද මතු නරකාදි සතරඅපායටද පැමිණෙන්නේය.

කෙසේද යත් ?.

එකාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක් වමත්සවූ තනතුර පතා ආ මුගලන් මහතෙරහු එක්ජන්මයෙක අඳවූ දෙමව්පියන් රක්නාසේක් ගිහිබන්ධනයෙන් බැඳී බිරින්දගේ මුන්දා හා මා එක්ව රඳාලතොත් නොපිළිවනැයි එක්වන්ව කියනා වචනය අසා ඈගේ සිත බිඳී ගිසේදෝ යනා හයින් අඳවූ දෙමව්පියන්ටත්වඩා අඳවූ හෙතෙම දෙමව්පියන්කෙරෙහි බිඳී ඊට නිස්ස දනිම්යි කියා දෙමව්පියන් කවා පොවා දෙමව්පියනි මුඹගේ අසවල්තැන හිඳින නෑයෝ මුඹ දක්නාකැමැත්තෝය ඔබ යම්හයි කියා ගැලකට නන්වාගෙණ වලවු ගොස් මේ වළ සොරු ඇත බලන්ට යෙම්යි ගැලින් බැස ගොස් කෙලෙස්සොරුන්විනා අන්සොරකෙනෙකුන් එහෙ නැතත් සොරහඬක් කෙ



ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

රලා සොරුන් ඇවිත් වත්සැටියක් කළහ දෙමව්පියෝත් අරගල
අසා සොරුදෝහෝයි සිතා පුතාඬ අපි මහලුව ගියම්හ අපි මලත්
මලේය යලවුනු ගමනේ මුබගැලවෙන්නේයයි කීවය ඒ වචන
යටත් මෑදු මොලොක් සිතක් නොසිතා ඇමතිගෙන්ගේ අදහස්ම
රකිණ්ඩින්ස සොරුන් ආලෙස අරගලකොරමින් අවුත් දෙ
මව්පියන් තලා මරා වල්ලෙ දමාපියා ගෙට ගොස් ඇඹනියන්ගේ
සිත්ගෙණ වාසයකොට එයින් චුතව නොයෙක් අවුරුදු ලක්ෂග
ණන් නරකයෙහි පැසී පියා තව අකුශලය නොගෙවුනුහෙයින්
අත්බැව් සියයක තැලුයත්කා මරණට පැමිණ ක්‍රමයෙන් අවුත් මහ
පින්ඇතිහෙයින් අපබුදුන්ගේ ශාසනයෙහි පැවිදිව සෑහිමතුන්
කෙරෙහි අගතැන්පත්ව වසන සේක් එක්සමයෙක තිස්ථකයෝ
එකතැන්වපියා දෙව්ලොවට ගොස් කුසල් කළවුන් බලා අවුත්
නරකයට ගොස් අකුසල් කළවුන් බලා අවුත් මිනිසුන්ට කියාලා
පාඋළපදවන මුගලන් මහතෙරහු මරපිමෙර් නම් ඒ ලෝහසත්කා
රයට ගොස් බලා යන දිය වඩදිය වේලාවට උඩුගං බලා යන්නාසේ
අපසරා එයි කිසා ඔවුනොවුන් කඩාකොට මිනීමරණ සොරුන්ට
මිසුදසක් දී කලුගල්ලෙන වසන මුගලන්මහතෙරහු මරවයි කී
හෙයින් සොරු ගොස් ගල්ලෙන වටකොට සෑහියෙන් වඩනාහෙ
යින් අල්වාගතනොහී දෙමසක් උත්සාහකොට තුන්වෙනිමස
උන්වහන්සේ කළ කම්මය දිවයින් දැක සෑහියෙන් නොවැඩ වැඩ
උන්දෑ අල්වා ගෙණ සියල් සිරුරෙහි ඇටතලා පසියක පුරා දු සාල්
මෙන් සිඳ සුණුකොටපියා මලහයි සිතා එක්කැලයකට දමාපියා
ගියහ මහතෙරුන්වහන්සේ බුදුන්දැක පිරිනිවන්පාම්යි සිතා
තමන්වහන්සේගේ අත්බැව් බුන් වළදක් වැලින් වෙලා තරකරන්
නාසේ ධ්‍යානයෙන් වෙලා තරකොට ගෙණ අහසින් බුදුන්ලඟට
ගොස් බුදුන් වැඳලා ස්වාමීනි පිරිනිවන්පාමියි කීසේක පිරිනිවන්
පාමුදැයි බුදුන්විචාරා එසේය ස්වාමීනියි කීකල්හි කොයිදීදැයි විචාළ
සේක ස්වාමීනි කලුගල්ලෙනදීයයි කීකල්හි එසේවීනම් අපට බණක්
කියාලා යව මෙවක්පටන් නොපවැනි සව්කෙනෙකුන් දක්නටත්
නැත්තේ වේදැයි වදාළසේක යහපත ස්වාමීනි එලෙසම කෙරෙ
මියි කියාලා බුදුන්වැඳගෙණ අහසට පැනනැගී ශරියුත් මහතෙ
රුන්වහන්සේ පිරිනිවන් පානාදවස් පෙළහර දැක්වූවාසේ පෙළ
හර දැක්වීමට තමන්වහන්සේ බුදුන්ට ඉක්බිතිහෙයින් විශෙෂ
කොට පෙළහරක් දක්වා බුදුන්ගේ ආරාධනාවෙන් බණත් වදාරා
අහසින්බැස කලුගල්ලෙනට වැඩ පිරිනිව් සේක.

තවද සැවැත්නුවර වසන අටලක්ෂයක් වස්තුඇති බ්‍රාහ්මණ
යෙක් තමාගේ වැඩිවිය පැමිණි පුතුන් සතරදෙනාට සාරලක්ෂ
යක් වස්තු දයාදකොට දුන්පසු ඔවුන්ගේ මවුබැමිණියද මලක
ඉක්බිති පුතුන් එකතුව කථාකරන්නාහු ඉදින් මුන්ද අනික් බැ
මිණිකෙනෙක් ගෙණද්දවිනම් උන්ද වැදූ දරුවන්ට දයාද උවම
නාකලට සම්පත් අපට අපවත්වෙයි කියා සම්ප්‍රහකීර්මෙහි තර අද
හසක් නැතත් වස්තුලෝභයෙන් පලදනිසා ගසට පැන්දෙන්නා
සේ පියානන්වහන්ස නුඹට සියලුම උපස්ථානකොට රකුම්හ සෙ
සුවස්තුවත් අපට දිප්‍රවමැනවැයි කිවුය බමුණනෝත් වස්තුවෙන්
ප්‍රයොජන මෙපමණෙක් වේදැයි සිතා අදින්ට පිළිසගලක් විනර තබා
ගෙණ මසුරන් සාරලක්ෂයත් ඇතුලුවූ සියලු වස්තුව සතරකොට
සක්කොට බෙදා දීලුය කීසාලු ලෙසට වැඩිමාලු පුතානුවෝ දවස්ගණ
නක් උපස්ථානකළහ එක්දවසක් ගඟට ගොස් නාපියා එනකලට
දොරටුවෙහි සිටි යෙහෙලි වැඩිමහලු පුතානුවෝය යි කීසා වැඩිකොට
දීලු දෙයක් ඇද්ද මේ ගෙට එනගමන් සෙසු පුතුන්ගේ ගෙවලට
මං නොහඳුනන්නෝ ඇසිදැයි කිවුය සෙසු පුතුන්ගේ ගෙවල්වල
දීත් ඒ ඒ ලෙසම කොට ගිනිපිඹගෙණ පෙණෙල්ල දුම්වාසේ ඉනු
නගසා දෙකිමෙන් හෙරනාලදුව මහත්වූ ලජ්ජාවට පැමිණ කිසි
පිහිටක් නැතිව සිතාකා ඇවිදුනෝ කල්ගිය කලට ජරාදුබ්ලව ගො
සින් සියාත් ජීවත්වීම දුක්හෙයින් පිලක වැදගෙව නිදාපියා නැ
ගිසිට පුතුන්ගෙන්ද කිසිම රක්ෂාවක් නැතිහෙයින් රැකෙණ උප
දෙස් සිතන්නාහු මහණ ගොදුම්හු සම්බුරුන් දුටත් මුහුනජී බැණ
නැගෙනොත්මුත් කරබානා කෙනෙක් නොවෙති උන් ගි
ගියොත් රැකීගත හැකැයි යනාදීන් සිතා පවුලු සකසා හැද ගෙණ
සැරයටිගසා බුදුන්ලගට ගියාහ ගොසිනුත් සිටින්ට බලමදහෙයින්
වැදහුන්හ බුදුහුත් බමුණතෙනි තොපිත් දුම්ලය අ දී පවුලුත්
තොපටත්වඩා දුම්ලය රැකලන කෙනෙක් නැති නිගොම්දැයි වදා
ලසේක බමුණහෝ හවත්ගෞතමයානෙනි මාගේ පුත්තු සතර
දෙන තොප රකුම්හයි කියා මාසතු අටලක්ෂයක් පමණ වස්තුව
හැරගෙණ නිමවාලා තුමූ නොපෙනී අඹුවන්ලවා දෙඩවා බිණවා
නෙරතිසි කීහ. බුදුහුත් "යම් දරුකෙනෙකුන්ගෙන් ප්‍රයොජනයක්
විඳිමියි සිතා වඩා වඩිනය කලේ නම් උ දූ ය් සෙසු සම්පත්හැර
රනින් අටලක්ෂයක් පමණ වස්තුව හැරගෙණ බල්ලන්ලවා හුරන්
ලුහුබඳනාසේ තුමු නොපෙනී අඹුවන්ලවා දෙඩවා නෙරති දුදකල
වැඩිමහලු නෑකම් කියන පමණක්මුත් ඉතා දුර්තමයෝය රැක්ක

මනා අවදියෙහිදී මා අත්හලුවාවූ ඔහු පුත් සැටියේ අඳුදින් පෙණීගිය යක්කුය ඒ මාගේ අසත්පුරුෂ දරුවන් බලාත් මම් සැරසපිදණවම ඉතා යහපත කුමක්හෙයින්ද යත්? අන්ට ආ ගෙරිසරක් උවත් කඩාකන්ට ආ බල්ලන් උවත් රඳවාලයි අඳුරුතැනදී පෙරාතු වෙයි ගැඹුරුදියයෙහි යනකල පිටිවහල් වෙයි යනකල පැකිල පැකිලී ගියාත් සැරයටිය අල්වාගෙණ සිටිපිය හැක්ක'' යන මේ අභිප්‍රාය ගාථාවලින් බැඳ දී * බමුණානෙනි එසේවීනම් මේ ගාථා ඉගෙණ ගෙණ බොහෝදෙනා රැස්වූ තැනදී පුතුන්මධ්‍යකොට ගෙණ කියවයි වදාලසේක බමුණානෝ බුදුන්ගෙන් ඒ ගාථා ඉගෙණ ගෙණ බමුණන් රැස්වන දවසෙක සව්බරණින් සැරහී සතරදෙනාත් අවුත් සභාමධ්‍යයෙහි හුත්කලට මහලුබමුණානෝද සභාමධ්‍යයට වැදලා අතලඩ ඔසවාගෙණ පින්වත්නි මම ගාථාබිඳක් කියනු කැමැත්තෙමියි කියා හැමදෙනාහට අස්වා කියාලූය එසමයෙහිද පොහොසත්ව හිඳගණ දෙමවුපියන් නොරක්නා දරුවන් මැරියයුතුයයි මිනිසුන්ගේ පනතක්හෙයින් ඒ බමුණාගේ පුතුන් සතරදෙනාම ගාථාවල අර්ථතෝර් මරණභයින් භයපත්ව පියානන් වැඳගෙණ වැදහෙව වඩා වඩිනය කලාසේම මේ මරණීනුත් ගලවාපුව මැනවැයි කීහ දරුවන්ගේ තාදකම් කෙසේවූවත් දෙමවුපියන්ගේ සිත් මොලොක්හෙයින් මම නිකම් කියාපීමි උං අප රකිත් නොමරවයි කීහ මිනිස්සුත් මූ පෙරලා මෙසේ කියද්දී කුමක් කොට හැකිද අදවගියේ ගියේමය මෙවක්පටන් එබන්දක් කලොත් මරම්හයි භයගන්වා නින්දකොට හැරපුහ එතැන්පටන් පියානන්ට බොහෝසේ උපස්ථානකෙරෙමින් පියානන්ගේ සභායෙන්ම

---

* ඒ ගාථා මෙසේයි.

"යෙහි ජාතෙහි නන්දිස්සං යෙසං ච භවමිච්ඡිසං
තෙ මං දාරෙහි සම්පුච්ඡ සාවරංව ජහන්ති සූකරං,
අසන්තා කිර මං ජම්මා තාත තාතාති භාසරෙ
රක්ඛසා පුත්ත රූපෙන තෙ ජහන්ති වයොගතං,
අස්සොව ජිණ්ණො නිබ්භොගො ඛාදනා අපනීයති
බාලා තම්පි තථා ථෙරො පරාගාරෙසු භික්ඛති.
දණ්ඩොව කිර මෙ සෙය්‍යො යෙ මෙ පුත්තා අනස්සවා
චණ්ඩම්පි ගොණං වාරෙති අථො චණ්ඩම්පි කුක්කුරං
අන්ධකාරෙ පුරෙ හොති ගම්භීරෙ ගාධමෙධති
දණ්ඩස්සානුභාවෙන ඛලිත්වා පති තිට්ඨති." යි

ලෝකාග්‍රවූ බුදුරජානන්වහන්සේට දනුත්දී බණත් අසා කෙළවර බ්‍රාහමණ භාතිය හැර පියානෝද භාගිනේයවෝ සතරදෙනා ඇතුළුවූ නවදෙනම සෝවාන්ව සසරදුකින් මිදී ගියාහුය.

එසේ හෙයින් පින්වත් සත්පුරුෂ ජනයෙනි දසමසක් දුකසේ උසුලා ඉඳ වදා සෙනහයෙන් ඇඟ ලේ කිරිකොට පෙරලා පොවා පිළිකුල් නොසිතා මලමුත්‍ර අත්නම පහකෙරෙමින් කවා පොවා වඩා වර්ධනය කල දෙමවුපියන්ගේ ගුණ සලකා රක්‍ෂාකරන්ට තමන්ට පොහොසත්කමක් නැතිවීනමුත් සිඟා සොයා සපයාවත් කෑද බත් පිළී දීමෙන් උනුපැන් සිහිල්පැන් දර ගිනි දීමෙන් රක්‍ෂාකොට දුස්සීලවූ ශ්‍රද්ධානැති මසුරුවූ දෙමව්පිය කෙනෙක් වූයේ වීනම් සීලයෙහි ශ්‍රද්ධාවෙහි ත්‍යාගවනනා භාවයෙහි පිහිටුවා කුසල් රැස් කොටගෙණ සගමොක් සිරිසැපත් අත්පත්කොට ගන්ට උත්සාහකටයුතු.

යම් කිසිවෙක් තමා වදා වඩා වර්ධනය කල දෙමවුපිය දෙදෙනා මහලුව ගිය කල පොහොසත්ව සිටගණිත් කෑද බත් දීමෙන් අත් පා මෙහෙකිරීමෙන් රක්‍ෂා නොකෙරේ නම් ඒ ඔහට දෙලොවින්ම පිරිහීමට කාරණයයි මෙසේ වදාලකල්හි මුතු මැණික් සොයා ගිය පුරුෂයෙක් කෙතෙක් සමහවූවත් නොනැවත තව තව සොයත් නාසේ මෙහි වදාලකාරණ සතරෙන්ම නොනැවත තව පස්වෙනි කාරණයත් අසා දැනගන්නාපිණිස ඕවාරන්නාවූ දිව්‍යපුත්‍රතෙම "ඉතිහෙතං" යනාදී ගය කීයේය.

ඉතිහෙතං විජානාම චතුත්ථො සො පරාභවො
පඤ්චමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

එතං, මේ (සතරවෙනි) කාරණය; ඉතිහි, වදාලපරිද්දෙන්ම; විජානාම, දැනගතුම්හ; සො චතුත්ථො පරාභවො, ඒ සතරවෙනි කාරණයා; භගවා, (නසනලද කාමිනීරස ක්‍ෂීරමධුමුද්දිකාදිරසයගඇති නොහොත් මධුරරසයගනැසූ) භාග්‍යවතුන්වහන්ස; පඤ්චමං පරාභවතො මුඛං, පස්වෙනිවූ පරිහානිකාරණය; බ්‍රෑහි, වදාරා; කිං, කවරේදැයි; ?(විචාලේයි).

මෙසේ විචාල දෙවියාට පස්වෙනි කාරණය ප්‍රකාශකොට වදාරණ ශාක්‍යකුලතිලකවූ භාග්‍යවතුන්වහන්සේ "යො බ්‍රාහමණං වා" යනාදී ගාථාව වදාලසේක.

යො බ්‍රාහ්මණං වා සමණං වා අඤ්ඤං වාපි වනිබ්බකං
මුසාවාදෙන වඤ්චෙති තං පරාභවතො මුඛං.

යො, ක්ෂත්‍රියාදී) යම් කිසිවෙක්; බ්‍රාහ්මණං වා, (පහකරණලද කෙලෙස්ඇති නොහොත් පිටත්කරණලද පවු ඇති ක්ෂීණාශ්‍රවවූ) බ්‍රාහ්මණයෙකු හෝ; සමණං වා, සංහිඳුවනලද පවු ඇති එබඳු (ශ්‍රමණයෙකු හෝ) නොහොත් බමුණුකුලෙහි උපන් බ්‍රාහ්මණයෙකු හෝ ප්‍රව්‍රජ්‍යාවට පැමිණි ශ්‍රමණයෙකු හෝ); අපි, නැවත; අඤ්ඤං වනිබ්බකං වා, අන්කිසිවක් ඉල්වන යාචකයෙකු හෝ; මුසාවාදෙන, බොරුකීමෙන්; වඤ්චෙති, වඤ්චා කෙරේද; (හෙවත් මායෙන් සිවුපසයෙන් කැමතිදෙයක් ඉල්වාගන්ට කැප යයි කියා ආරාධනාකොට නැවත යමක් ඉල්වූවිට නොදීමෙන්හෝ දෙමියි පසු නොදීමෙන් ඔවුන්ගේ ආශා විසංවාදනය කෙරේද ඔහට) තං, ඒ (ආශාව වළකාපීම) පරාභවතො මුඛං, (දෙලොවින්ම) පිරිහීමට කාරණයයි (වදාළසේක).

යමක් දෙමි කියා මුසාවාදයෙන් වළකා ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ගේ ආශාව විසංවාදනය කිරීමෙන් වන පිරිහීම ආදීනව මේ මතුකියන කථාවෙන් සංක්ෂෙපයෙන් අසා දතයුතු.

කෙසේද යත්?.

පෙරගියදවස කලිඟුරට නාලිකීරනම් රජකෙනෙක් රාජ්‍යය කරණ සමයෙහි හිමාලවනයෙහි බොහෝ කාලයක් වනමුල් පලාඵල අනුභවකොට වැස ලුනුඇඹුල් සොයා ඒ නුවරට ආ පන්සියයක්පමණ තාපසවරු දැක ප්‍රසන්නවූ සිත්ඇති ඒ නුවරවැසි ජනයෝ තාපසවරු පන්සියයම උයනේ වඩා හිඳුවා දන්දෙමින් බණ අසන්නාහුය. එසමයෙහි එක්දවසක් බොහෝදෙන සැදී පැහැදී එකතුව බණ අසන්ට යනකල නාලිකීරනම් රජතෙම ඒ දැක මෙතෙක්දෙන එකතුව කොතනකට යෙද්දැයි විචාරා බණ අසන්ටයයි කීකල්හි මමත් යෙමි මාසමග යවයි කීයේය. ඒ ඇසූ ජනයෝ මේ පවිටුවූ අධර්මිෂ්ට රජතෙම බණ අසා ධර්මයෙහි පිහිටිසේක් වීනම් යහපතැයි සිතා සතුටුව ඒ රජ හා සමගම උයනට ගොස් තාපසවරුන් හා සමග පිළිසඳර කථාකොට එකත්පස්ව හුන්නාහුය. තාපසවරු රජ දැක ධර්මකථාවෙහි දක්ෂවූ එක්තාපස කෙනෙකුන්ට රජහට බණ කියන්ට සංඥාදුන්හෙයින් ඒ තාපසතෙම රජමුහුනබලා ප්‍රාණඝාතාදීවූ පඤ්චදුස්සීලයෙහි ආදීනවද පඤ්චශීලයෙහි ආනිසංසද නොයෙක්ලෙසින් ප්‍රකාශකොට බණ කීයේය. ඒරජවනාහි ප්‍රකෘතීන්ම ශ්‍රද්ධාවක් නැති

දුශ්ශීලයෙක. ඔහට ඒ සීලකථා කණෙහි ඇනී උලක්මෙන් විය. එහෙයින් මොහුවනාහි මම අා වේලෙහි පටන් පිරිසමැද නොයෙක් ලෙස ගටා වෙහෙසා කීයේය. ඔවුන්ට කටයුත්තක් කෙරෙමියි සිතා ධර්මදෙශනාවගේ කෙළවර ආචාර්ය්‍ය සෙට මාගේ රජගෙට වළඳන්ට වැඩිය මැනවැයි ආරාධනාකොට ගොස් දෙවෙනි දවස් මහත් මහත් සැලයෙන්වා අසූචිපුරවා කදලිපණ්ණයෙන් වුවා බැඳ ඒ ඒ තැන තබ්බවා නානුබෙලසුල් සැලවල පුරවා ගිනි හිස තබවා මල්ලයන් පෙළ මුගුරු ගන්වා ඊයේ මා වෙහෙසූ කූටතාපසයෝ ආකල නානුබෙලසුල් ගිනිපෙත් පිට වත්කොට හිසට මුගුරුවලින් ගසා බොටුවගෙණ ගිනිමගින් හෙලවයි කියාද ගිනිපාමුල වණ්ඩ සුනඛයන් බඳුවයි කියාද නියොග කෙළේය. තාපසවරු සෙටදවස රජ්‍යගෙදී උලෙදනට යම්හ රජගෙය නම් භය සහිතයයි ඔවුනොවුන් අවවාදකරගණ වැහැරි සිවුරු හැඳ අඳුන් දිවි සම් ඒකාංශකොට පොරවාගෙණ ජටාමඩුලු බැඳගෙණ භික්ෂාභාජන අතින්ගෙණ සන්සුන්ලීලාවෙන් රජගෙට වැඩියාහුය. රජතෙම තාපසවරු ආබව දැන අවුත් අසුචිසැලවල මුවගෙයන් කෙහෙල්කොල පහකෙළේය. දුර්ගන්ධය තාපසවරුන්ගේ නාසය වැද හිස්මොල කඩාහෙන්නාක් මෙන් විය. එවිට මහාතාපසතෙම රජ මුහුණ බැලූයේය. රජතෙම පින්වත්නි මෙයින් කැමති පමණක් අනුභවකරව ගෙණ යව මේ තොපටම සුදුසුය ඊයේ මම තොපට මෙලෙස කෙරෙමියි සිතා ආම් තොපි වනාහි මා ගටා වෙහෙසා පිරිස්මැද කීයේය. එහෙයින් මේ තොපටම සුදුසුය අනුභවකරවයි කියා මහාතාපසයන්ට සැන්දකින් අසූචි ඵලවූයේය. තාපසතෙම ඕ ඕ යනුවෙන් පිළිකුල්කෙරෙමින් නැවතුනේය මෙපමණකින්ම තොපි සෙවසීකියා හිනෙහි කලයෙන් නානුබෙලසුල් වත්කරවා මල්ලවයන්ට සංඥ දුන්නේය, මල්ලවයෝ මුගුරුවලින් හිස් ගසා ගසා බොටුවගෙණ තාපසවරු ගිනිපෙත්පිට හෙළුවාහුය එක් කෙනකුදු හිනෙහි පයගසා සිටින්ට නොහැක්ව වැටෙන්නාහු ගිනි පාමුලම වැටුනාහුය වැටෙන වැටෙන අයද ගිනිපාමුල සිටිනා සුනඛයෝ පට පටයන අනුකරණ පවත්වමින් අනුභවකළාහුය එයින් යමෙක් නැගී ගැලවී ගියේ නම් හෙද සුනඛයෝ එක්වම දිව දිව හෙලහෙලා කන්නාහුම වෙති. මෙසේ පන්සියයක් තාපසවරුන්ගේ මස් සුනඛයෝ අනුභවකොට ඇටසැකිලි පමණක් අවශෙෂ කළාහුය. සංසාර තීරයෙහිම අනුධාවනය කරණ ඒ නාලිකීරනම් පව්වූ රජතෙම එකදවසෙහි දීම තවනලද කෙලෙසුන්ඇති සීල සම්පන්නවූ පන්සියයක් තාපසවරුන්ගේ ජීවිත විනාසය කෙළේය.

ඉක්බිති ලොකපාල දෙවතාවෝ ඒ රජුකෙරෙහි කිපී සුමන මල් වැසි කහවණු වැසි ආදී මිනිසුන්ගේ සිත් සතුටුවීමට නිසි වැසි පල මුකොට වස්වා නැවත එකපිට දෙපිට මුවහත්ඇති ආයුධවැසිවෙන් පුවරුවක තබා මස් කොටන්නාක්මෙන් සඹයන්කොටා සුණුවිසුණුකොට නැවත දිලිසෙන අඟුරුවැසිවක්ද කූටාගාර ගෙවල්වැනි ගල්වැසිවක්ද මිටට ගත නොහැකි තරම් වූ පාෂාණවැසිවක්ද ඊට සිහින් වැලිවැසිවක්ද වස්වා සමතලා කෙරෙමින් ඒ රජ විසූ රට විනාසකොට අරණ්‍යකෙළේය, දන් දෙමි කියා මුසාවාදයෙන් තාපසවරු වඤ්චාකොට ජීවිත විනාසයට පැමිණවූ ඒ නාලිකීරනම් සාජී යාද ඊට සමාදන්වූ පිරිසත්සමග දිවිකෙළවර අපායට ගියේය, එසේහෙයින් මේ ආදී වශයෙන් යමක් දෙමිකියා නැවත නොදී මුසාවාදයෙන් ශ්‍රමණ බ්‍රාහ්මණාදීහු වඤ්චාකිරීමෙන් වන ආදී නව දූන හැඳිනගෙණ සත්‍යවාදීයෙහි පිහිටා තමහට ශක්තිපමණකින් දනාදී කුසල්කොට ස්වර්ගාපවර්ගසම්පත්තිප්‍රතිලාභයට පැමිණෙන්ට උත්සාහ කටයුතු.

යම් කෙනෙක් ශ්‍රමණබ්‍රාහ්මණයාචකාදීන්ට යමක් දෙමි කියා ආශා උපදවා නැවත නොදී මුසාවාදයෙන් වඤ්චාකෙළේ වීනම් ඔහට දෙලොවින්ම පිරිහීමට කාරණයයි මේ ගාථාවෙන් වදාලකල්හි අවුතුන්කෙළක් දෙවගනන් සිටියදීත් තව තෘප්තියකට නොපැමිණි දෙවතාවන් සතරදෙනෙකුගේ සීමාවක උපන් නඩුවට ගෙණයිය දෙවගනක් දක නොපගේ නඩුව තබා මෑ නොලදෙත් මාගේ දිවි නොතිබෙයි කියා ඒ රෙහිණිනම් දෙවගන ප්‍රාර්ථනා කළ ශක්‍රදිව්‍යරාජයාසේ පස්වෙනි කාරණයත් අසාත් තව තෘප්තියකට නොපැමිණි සවෙනි කාරණයත් අසා දැනගන්නා කැමතිවූ දිව්‍යපුත්‍රතෙම "ඉතිහෙතං" යනාදී ගය කීයේය.

ඉතිහෙතං විජානාම පඤ්චමො සො පරාභවො
ඡට්ඨමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

එතං, මේ (පස්වෙනි පරිහාණි) කාරණය; ඉතිහි, වදාළ පරිද්දෙන්ම; විජානාම, දනගනුම්හ; සො පඤ්චමො පරාභවො, ඒ පස්වෙනි පරිහාණි කාරණය; භගවා, (නසනලද ශුවතිතනුසාත සයනාදී එසසරාගඇති නොහොත් ශහපත් කායශපනී නැසූ) සර්වඥයන්වහන්ස; ඡට්ඨමං පරාභවතො මුඛං, සවෙනි පරිහානිකාරණය; බෲහි, වදාරා; කිං, කවරේදැයි; ? (විචාළේය).

මෙසේ විචාළාවූ දෙවියාට සවෙනි කාරණය ප්‍රකාශකොට දත් වන්නාවූ ධර්මස්වාමීන්වහන්සේ "පහූතවිත්තො" යනාදී ගාථාව වදාළසේක.

පහූතවිත්තො පුරිසො සහිරඤ්ඤො සභොජනො,
එකො භුඤ්ජති සාදූනි තං පරාභවතො මුඛං.

පහූතවිත්තො, (තුෂ්ටිජනනාර්ථයෙන් විත්ත නම්වූ) බොහෝ රන් රිදී මිණිරුවන් ඇත්තේ; සහිරඤ්ඤො, (බොහෝ) කහවණු සහිතවූ; සභොජනො, (නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්තවූ) බොජුන් ඇති; පුරිසො, පුරුෂයෙක් තෙම; සාදූනි, මිහිරු රසඇති භොජන; එකො, (නොපෙණෙන ස්ථානයෙක) හුදකලාවම හිඳ; භුඤ්ජති, (තමාගේ අඹුදරුවන්ටත් නොදී තනිවම) අනුභව කෙරේද, (ඕහට) තං, ඒ (යථොක්ත ගිජුබව මසුරුබව); පරාභවතො මුඛං, (මෙ ලොව නින්දාවටද පරලොව අපාය දුකටද පැමිණෙන හෙයින්) පරිහානි කාරණයයි (වදාළසේක).

බොහෝ රන්රුවන්ආදී සම්පත් ඇතිවත් මිහිරිවූ භොජනය තමන්ගේ අඹුදරුවන්ටත් නොදී අනුභවකිරීමෙන් වන පිරිහීම ආදීනව කෙසේද යත්?. සතාසූකෙළක් ධනඇති නොදෙයස නම් බ්‍රාහ්මණයෙක් වස්තුලොභයෙන් කිසිවක්හට කිසිවක් නොදී දානාදී කුසලකුත් නොකොට අභිමානයෙන් මිය තමාගේ ගෙයි බලුව ඉපිද එසිනුත් මිය ගොස් අපායෙහි උපන්නේය. එසේම වස්තු ඇති ආනන්ද සිටානකෙනෙක්ද කිසි කුසලක් නොකොට වස්තුලොභයෙන් මිය දහසක් චණ්ඩාලයන්ගේ අතර කාලකන්නිව ඉපද ඒ චණ්ඩාලයෝ දහස අනුන්ට බැලමෙහෙකොට ලබන බතුත් නැති කෙළේය.

තවද කුලියක් දෙන්ට වෙසී යන හයින් බඩාලෙකුට නොකියා තමා විසින්ම වට මට සිළුවූ කොට කුණ්ඩලාභරණයක් තනා පුතාට දුන්හෙයින් මට්ටකුණ්ඩලී නම් වූ කුමරුවාගේ පියාද එම පුත්‍රයාට පැමිණි රොගයකට ලොභයෙන් බෙහෙතකුත් නොකරවා ඔහු මළ පසු මහත්වූ සොකයකින් පැමිණ බොහෝ දෙනාගෙන් නින්දාගර්හාවටත් පැමුණුනේය.

තවද මච්ඡරිය කොසිය සිටානෝ කෙලවර සෝවාන් ඵලයට පැමුණුනේ වී නමුත් ලොභය නිසා පළමුවෙන් පැමුණුනු හානි නින්දා ගර්හා ඉල්ලීසජාතකයෙහි කියනලද ක්‍රමයෙන් සංක්ෂෙපයෙන් අසා දතයුතු.

කෙසේද යත්:-

තුන්ලොවට කල්පදෘමවූ අප බුදුරජාණන්වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසන සමයෙහි රජගහනුවර සක්ඛර නම් නියම්ගම වසන අසූකෙළක් ධන ඇති තණඅග ගලා තෙල්බිඳක් පමණ වත් කිසිවක්හට නොදෙන මච්ඡරිය කොසිය නම් සිටාණෝ එක් දවසක් රජගෙට ගොස් එන වේලෙහි කුස සාගිනි ඇති පුවක්කන එකෙක් දැක තමන්ටද පූ අනුභව කිරීමෙහි තෘෂ්ණා ඉපද සම්පත් වියදම් වෙයි යන ලෝභයෙන් තමාගේ අඹුවට වත් නොකියා ඉවසා කල්යාමෙන් ඇඟනහර ඉපිල සුදුමැලිව දුර්වලව ගොස් මාලිගාවට වැද ඇඳ වැලඳ ගෙණ හොත්තේය ඒ දුටු සිටුදූ තොමෝ ස්වාමීනි නුඹට අඵාසුවෙක්ද රජඋදහසෙක්ද කිමෙක්ද යනාදීන් විචාරා ගොස් පූ අනුභවකරන්ට තෘෂ්ණා උපන්බව අසා දැන මෙතෙක් කල් මට නොකීවේ ඇයිද මේ ගම වසනවුන්ටත් කන්ට සෑහෙන්ට උයම්දැයි විචාළීය. එබසට උන් අපට කුමක් කරද්දැයි කීය එසේ වීනම් මේ වීථියේ වසනවුන්ට සෑහෙන්ට උයම්දැයි කීය නී එබඳු අදහස් ඇත්තියක්බව දනිම් කීය එසේ වීනම් මේ ගෙයි කෙලි කොලු ආදීන්ට සෑහෙන්ට උයම් දැයි විචාළීය. උන් කිට කුමක් කරද්දැයි කීය එසේ වීනම් නුඹවහන්සේටත් මටත් උයම් දැයි විචාළීය. නී කුමක් කරද්දැයි කීය. එසේ වීනම් නුඹට සෑහෙන්ට උයම් දැයි විචාළීය යහපතැයි කියා ඉඳිනී ගිණි වලන් සුන් සහල් තෙල් කිරි සීනි මී ගෙන්වා ගෙණ සත්මහල් ප්‍රාසාදයට වැද දොරවල් වසා ගණ කබලූ පූ පිසවන්ට පටන්ගත්කල්හි සකල සත්වසමූහයා කෙරෙහි පතල මහාකරුණාසමාපත්තියක් ඇති අප බුදුරජාණෝ ඒ බව දිවසින් දැක වදාරා මුගලන් මහතෙරුන්වහන්සේට ආමන්ත්‍රණය කොට මෞද්ගල්‍යායනයෙනි මෙයට එක්සිය අසූගව්වකින් ඈත කිරිකබලූ පිසවන කොසිය මච්ඡරිය සිටාණන්ගේ කබලූ පූ තොපගේ සෘද්ධිබලයෙන් ඔසුලවා ගෙන්වා ගෙණ එව පන්සියයක් භික්ෂූන් පිරිවරා පූ වලඳන්ට විහාරයෙහිම හිඳිමියි වදාළසේක යහපතැයි කියා එකෙණෙහි ආකාශයෙන් වැඩ සිටාණන්ට පෙණී සිව්මැදුරු කවුළුව සමීපයෙහි අහස වැඩසිටිසේක ඒ දුටු සිටාණෝ ගින්නට දැමූ ලුනු පුපුරන්නාසේ ක්‍රෝධයෙන් තට තට යන අනුකරණ පවත්වමින් මහණ පද ලකුණු දක්වා අහස සක්මන් කළත් මාගෙන් යමක් නොලබන්නෙහි යයි කීය එවිට සක්මන් කොට වදාළසේක. ඒ දැක අහස පලක් බැඳ හුන්නත් නොලබන්නේ යයි කීය. ඒ අසා පලක් බැඳ වැඩ

හුන්සේක. පලක් බැඳ හුන්නාට කුමක් ලබව්ද කවුළු දොර එළි පතපිට සිටියත් කිසිවක් නොලබන්නෝයයි කීය ඒ අසා එළිපත අවුත් වැඩසිටි සේක. ඒ දැක එළිපතපිට සිට කුමක් ලබනසේක්ද දුමාගියත් නොලබන්නෝ යයි කීය, ඒ අසා දුමාගිය සේක. ධූම යෙන් සියලු ප්‍රාසාදය එකාන්ධකාරව සිටානන්ගේ ඇස් ඉදිකටුවලින් අන්නාක් මෙන් විය. ගේ ගිණිවැද යේ දෝ යන හයින් ඉදින් දිලී ගියේ වීනමුත් නොලබන්නා වාදැයි නොකියා මේ මහණ එකාන් තයෙන් පූ නොලැබ නොයන්නේ යයි සිතා කුඩාකොට පූවක් පිස දී යවා පියවයි අඹුවට කීය ඹතොමෝ සැදිඅගින් පිරිසුහක් කබලේ වත්තළ කල කබලපුරා මහත් පූයක් පැසුනේය ඒ දැක තී විසින් බොහෝ පිටි වත්කරණ ලදැයි කියා සිටානෝ සැන්ද ගෙණ සැදිඅගින් ඉතාම පිටි පොඩියක් වත්කොළේය ඒ පූව ඊටත් වඩා මහත්ව ගිය හෙයින් පෙට්ටියෙන් පූවක් දී මේ මහණ යවා පියවයි අඹුවට කීය ඹතොමෝ පෙට්ටියෙන් එක් පූවක් ගන්ට වන්කල්හි සියලුම පූ එකාබඩව ගියේය. එව්ට සිටුදු සවාමීනි එකක් වෙන් කොට ගත නොහෙමි යි කීවාය. මම වෙන් කොට දෙමි කියා සිටානෝත් උත්සාහ කොට වෙන්කොට ගත නොහී ඇඟ ඩාසෙල්වෙන තෙක් දෙදෙනම කෙළවරඅල්වා ඇදත් වෙන්කොට ගතනොහී පූ කන්ට උපන් තෘෂ්ණාවත් සිඳී සො දුර මට පූයෙන් කම්නැත මේ මහණට පෙට්ටිය පිටින් දී පියවයි කිවුය සිටුහායශ්‍රීනොමෝ කබලූපෙට්ටි පිළිගන්වන්ට ගෙණ ගිය තෙරුන්වහන්සේ තුනුරුවන්ගේ ගුණ සහ දානානිසංස ප්‍රකාශ කොට සඳමඬල ගෙණහැර පාණසේ නොයෙක්ලෙස ධර්ම දෙශනා කොට වදාළසේක. සිටානෝ බඬ ණි අසා ප්‍රසනනව සවාමීන් මෙහි මේ ආසනයෙහි වැඩහිඳ වලඳ වදාළමැනවැයි ආරාධනා කෙළේය තෙරුන්වහන්සේ සිටානෙනි අප බුදුරජානන්වහන්සේ මෙයට එකසිය අසූගව්වකින් ඇත දෙව්රම් වෙහෙර සහ පන්සි යයක් පිරිවරා කබලූ පූ වලඳන්ට වැඩහුන්සේක තෙපි පොහො සත් නම් මේ තෙල්කිරි සහ පූ ගෙණගොස් බුදුපාමොක් මහ සඟ නට දන් දෙවයි වදාළසේක සවාමීනි දැන් එතෙක්දුර කෙසේ යෙමුදැයි විචාළකල මාගේ ආනුභාවයෙන් ගෙණ යෙමි තොපගේ මාලිගාවෙහි හිණි පා මුල දෙව්රම්වෙහෙර වෙයි වදාරා එනම චිත්තක්ෂණයකින් සිටුහායශ්‍රීව හා සිටානෝ දෙව්රම්වෙහෙරට පැමිණ වූ සේක. සිටානෝ ලොවුතුරාබුදුන් ප්‍රධානකොට ඇති පන්සියයක් මහසඟහට පූ වලදවා සිටුහායශ්‍රීව හා තෙමේත් කා

තව බොහෝ දෙනාටත් දී පෙට්ටියෙහි කබලු පූ නොනිමෙණ
හෙයින් ස්වාමීනි මේ පෙට්ටියෙහි පූ අඩුනොවෙයි කියා බුදුරජා
ණන්වහන්සේට සැලකොළේය එසේ විනම් සිට ඒ පූ ජේතවන
දොරටුව සමීපයෙහි ලා පියවයි වදාළහෙයින් එහි ගොඩගසා
ගොස් බුදුන් වැඳ එකත්පස්ව හුන්කල්හි ඔවුන්ට අනුරූපවූ
ධර්මදෙශනා කොට වදාළසේක දෙශනාව කෙළවර සිටුහායනීව
හා සිටාණෝ දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටි
යේය, එදවස් සවස්වේලෙහි දම් සභාමණ්ඩපයේ රැස්වූ මහාසංඝයා
වහන්සේ ඇවැත්නි මුගලන් මහතෙරහු තදමසුරුවූ මච්ඡරිය
කොසිය සිටානන් පහදවා කිරිකබලු ගෙන්වා ගෙණ අයේ වේ
දසි යනාදීන් ගුණ කිය කියා උන් තැනට සර්වඥයන්වහන්සේ
වැඩවදාරා පනවනලද බුද්ධාසනයෙහි වැඩහිඳ මහණෙනි මා එන්
නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි වදාරා
මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි සැළකළ කල්හි මහණෙනි
දැන් මතුනොවේ මුගලන් මහතෙරහු පෙරත් ඒ සිටා දමණය
කෙළේ වේදැයි වදාරා ඒ කෙණේදැයි භික්ෂූන් විසින් ආරාධිතවූ සර්ව
ඥයන්වහන්සේ අතීතකථාව ගෙණහැරදක්වා වදාළසේක. ඒ
කථාවද මෙහි සංක්ෂෙපයෙන් කියමි.

කෙසේදයත් ?.

යටගියදවස බරනැස්නුවර අසූකෙළක් ධන ඇති සිහින් කකුල්
ඇති කුදු වමරැස් ඉල්ලීස නම් සිටානකෙණෙක් වූයේය හෙතෙම
එක් දවසක් රජගෙට ගොස් එන වේලෙහි කුහුම්ස් හා රා බොන
මිනිසෙක් දැක ඔහටද රා බොන්නම් තෘෂ්ණාව ඉපද ගෙට ගොස්
කොල්ලකු වීථියට හැර රා ගෙන්වා කිසිකෙණෙක් දුටුවොත්
ඉල්වති යන ලොභයෙන් කොලු ලවාම රා ගෙන්වාගෙණ ගසක්
අසබඩ කැලයකට ගොස් ඒ කොලුවාද යවා හුදකලාව හිඳගෙණ
රා බොන්නට පටන් ගත එවේලෙහි ශක්‍රදිව්‍යරාජයා මාගේ දන්
වැට පවතී දෝ නොපවතීදෝයි දිවසින් බලා සත්මුතුන් පරම්ප
රාවක සිට පැවත ආ දන්වැට නසා දන්සැල් සිඳ බිඳ දමා කිසි
වක්හට කිසිවකුත් නොදී තදමසුරුව රා ටිකක් ගෙණ ගොස් කැ
ලයක තනිවම හිඳ ගණ බොන බව දැක ඔහු දමනය කොට කුශ
ලධර්මයෙහි පිහිටුවා එම් සිතා ඉල්ලීසස්ටු වෙස්ගෙණ අවුත්
රජගෙට ගොස් දෙවයන්වහන්ස මාගේ වස්තු රජගෙට ගෙන්වා
ගත වදාළමැනවැයි කීය තොපගේ වස්තුවෙන් අපට කම්නැත

තොපගේ වස්තුවට වඩා මාගේ වස්තු බොහෝයයි කී කල්හි එසේවීනම් මාගේ වස්තුව දන්දෙන්ට අවසර දුනමැනවැයි කියා අවසර ගෙණ සිටානන්ගේ ගෙට ගොස් මාලිගාවට වැද සිටුභාර්‍ය්‍යාව කැඳවා මාගේ වස්තුව දන්දෙනුකැමැත්තෙමියි කීහ ඒ අසා සිටුභාර්‍ය්‍යාතොමෝ සිටානෝ ර බී මත්ව වස්තුදන්දෙන්ට කැමතිවූ සේකැයි සිතා සතුටුව යහපතැයි කීවාය එසේවීනම් වස්තු කැමති කෙනෙක් ගෙණ යෙත්වයි කියා නුවර බෙරකරවයි කීයේය සිටුදූතොමෝ යහපතැයි කියා නුවර බෙරලැවීය ඒ දැන ගත් මනුෂ්‍යයෝ මලු පැස් ආදිය ගෙණවුත් රැස්වූකල්හි සත්රුවන් ගබඩාවල දොරවල් හරවා මනාපලෙස ගණුවයි කියා දොරටුපාලයා කැඳවා මම ඉල්ලීස සිටානෝය කියා ගෙට වදින්ට ආ කෙනෙක් ඇත්නම් බැටදී එන්ට නෑර පහකරවයි කීහ මනාපලෙස වස්තු ගෙණ යන මිනිස්සු අතුරෙන් එක මිනිසෙක් සිටානන්ගේම ගැලක සිටානන්ගේම ගොන්බානක් බැඳ සත්රුවනින් ගැලපුරවාගෙණ සිටානෝ ර බොන සමීපයෙන් යමින් සිට ඉල්ලීස සිටානෝ නිදුක් නිරෝගි සුවපත් වෙත්වයි බොහෝකාලයක් ජීවත්වෙත්වයි සිටානෝ මාගේ පියානකෙනෙක අවශෙෂ නැසිය කෙනෙක් නොවෙයි මට මේ දුන් වස්තු මාගේ දිවිහිම් යෙන් රැකෙන්ට ඇත යනාදීන් කියා ගෙණයක වචනය ඇසී ර බොමින් සිටි සිටානෝ ඇවිත් බලා දැන හැඳින මාගේ ගොන්බාන සහ ගැල කොසී ගෙණ යෙද්දැයි කියා ගැලසමීපයට ගියේය දුෂ්ටවූ කොල්ල ඉල්ලීස සිටානෝ මට දුන් දේ තට කොසින්ද කියා පිට මැදට සෙනහබසේ පහරක් දී බිමහෙලා ගියේය.

නැවත සිටානෝ නැගී සිට බලා දිවගෙණ ගොස් මාගේ ගැල නොගෙණයයි කියා අල්වාගත් වේලෙහි ඉසකෙස් අල්වා ගෙණ බිමහෙලා දෙවැලමිටි දෙකෙන් ඇන බැට දී වෙහෙසූකල්හි ර මදත් සිඳී ගොස් රජ්ජුරුවෝ මාගේ ගෙය කොල්ලකවන සේකැයි සිතා නැගී සිට ඇඟවැලි පිස දමා ගෙට එනුයේ අතරමගදී බඩු ගෙණ යන දුටු දුටු අය ගෙන් බැටකකා දොරටුවට අවුත් පැමිණි කල්හි දොරටුපාලයා මේ ගෙට නොවදුවයි කියා හුනපත්තෙන් පිටට සම් ඉගිලෙන සේ පාරක් දින ඒ පාරකාගෙණ මෙවිට මට රජ්ජුරුවන්වහන්සේ හැර වෙන නැතැයි සිතා රජගෙට ගොස් දෙවයන්වහන්ස මාගේ ගෙය කොල්ලකවන සේක්දැයි විචාළේය. මම එසේ නොකෙළෙමි තොපගේ වස්තු දන්දෙන්ට මාගෙන් අවසර ගෙණ ගියේ වේදැයි කී කල්හි දෙවයෙනි නානඅග ගලා

තෙල්බිඳක් පමණවත් කිසිවක්හට නොදෙන මාගේ තදමසුරු කම නුඹවහන්සේම දනවදුරණසේක් නොවේද එහෙයින් මාගේ වෙසතු යම් සිටානකෙනෙක් දන්දෙත් නම් ඔහු ගෙන්වා පරීක්ෂා කරවුව මැනවැයි කීවුය එබස් ඇසූ රජ්ජුරුවෝ ශක්‍රයා ගෙන්වා දෙදෙනාගේ වෙනස රජ්ජුරුවෝ නොදන්නාහෙයින් දෙදෙනාගේ වෙනස අමාත්‍යයෝත් නොදන්නාහෙයින් සිටානන්ගෙන් තොප අඳුනන කිසිකෙනෙක් ඇද්දැයි විචාළෝය. ස්වාමීනි මාගේ භාර්‍ය්‍යාව අඳුනන්නේ වේදැයි කීවුය රජ්ජුරුවෝ සිටුභාර්‍ය්‍යාව ගෙන්වා තීගේ ස්වාමිපුරුෂයා අඳුනන්නා කවුරුදැයි විචාළේය ඔතොමෝ මේ මාගේ ස්වාමියා නොවේදැයි කියා ශක්‍රයා සමීපයෙහි සිටියාය දූදරු දසකම්මකරාදීහුද ගෙන්වා විචාළ කල මේ අපගේ පියානෝය ස්වාමිපුත්‍රයාය කියා ශක්‍රයා සමීපයෙහි සිටියේය ඒ දැක සිටානෝ සිතන්නාහු මාගේ ඉසේ කැලලක් ඇත ඒ කැලල කපුවා මිස වෙන කෙනෙක් නොදතිති කපුවා ගෙන්වා විචාළ මැනවැයි රජ්ජුරුවන්ට කීය රජ්ජුරුවෝ සිටානන්ට කපුව සිටි බොධිසත්වයෝ ගෙන්වා විචාළේය බොධිසත්වයෝද සිටානන්ගේ ඉස කැලලක් ඇත බලාලා කියම්යි දෙදෙනාගේම ඉස කැලල තිබෙන හෙයින් මහරජ්ජුරුවන්වහන්ස දෙදෙනාගේම ඉස කැලල තිබෙන හෙයින් මමත් මොහු ඉල්ලිස සිටානෝය කියා වෙන්කොට දැන ගත නොහෙම් දෙදෙනම කොරවූය දෙදෙනම පිළිවූය දෙදෙනම වමරුස් ඇත්තෝය දෙදෙනම පිළිකා ඇතැයි මෙසේ කීවුය සිටානෝ බොධිසත්වයන්ගේ වචනය අසා කම්පිතව සොකයෙන් සිහිඑලවා ගත නොහී එතනම වැටී උන්හ එවේලෙහි ශක්‍රයෝ ආකාශයෙහි සිට රජ්ජුරුවෙනි මම ඉල්ලීස නොවෙමි ශක්‍රදෙවෙන්ද්‍රයෙමි කීහ. මසුරුසිටානන්ගේද මුහුන ඩා පිස දමා පැන් ඉස සනහාපීණිය කළාහුය එකල සිටානෝ නැගිට ශක්‍රදෙවෙන්ද්‍රයන්ට නමස්කාර කොට සිටියේය ශක්‍රදෙවෙන්ද්‍රයෝ සිටානෙනි මේ සම්පත් මා සන්තකනොවේද මම තොපගේ පියානෝය තොපි මාගේ පුතනුවෝය මම දනාදී කුසල් කොට ශක්‍රදෙවෙන්ද්‍රව උපන්මි තෙපි මාගේ දන්වැට නසා පන්සැල් දවා තද මසුරුව සම්පත් උපදවමින් කිසිවක්හට කිසිවකුත් නොදී තොපිත් අනුභව නොකොට රාක්ෂසාධිගෘහීත විලක් ලෙස් කෙළේය ඉදින් දැන් තෝ දන් නොදෙන්නේ වීනම් තාගේ සියලු සම්පතුත් අන්තර්ධාන කොට මේ වජ්‍රායුධයෙන් තාගේ හිස කපා ජීවිතක්ෂයටත් පමුණුවම් යනාදීන් භයගන්වා සිටානෝ දනසීලාදී

කුශලධර්මයෙහි පිහිටුවා ශක්‍රයෝ දිව්‍යලොකයටම ගියේය. සිටානෝද එතැන්පටන් දනාදී කුසල්කොට දෙව්ලොව උපන්නේය යනාදීන් මහණෙනි දන් මතුනොවෙයි මෞද්ගල්‍යානයෝ පෙරත් මසුරුසිටානෝ දමනය ලූවෝ වේදැයි යනාදීන් වදුරා එසමයෙහි සිටානෝ නම් දන් මේ මසුරුසිටානෝය එසමයෙහි ශක්‍රදෙවෙන්ද්‍රයෝ නම් දන් මේ මෞද්ගල්‍යානස්ථවිරයෝය එසමයෙහි රජ්පුරුවෝ නම් දන් මේ ආනන්දස්ථවිරයෝය එසමයෙහි කපුව උපන්නෙම් ලොව්තුරාබුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ මේ ධර්මදෙශනාව දක්වා වදාළසේක.

එබැවින් පින්වත් සත්පුරුෂජනයෙනි මසුරුබවෙහි ආදීනව මේ ආදී නොයෙක් බුධවචන අසා දැන හැඳින ගෙණ ඉල්ලීස සිටානන්සේ ගෙඩිබැට කෑමට නිඳුගණිවට නොපැමිණ ත්‍යාගිවනතබවෙහි පිහිටා දනාදී කුසල්කොට සගමොක් සිරිසැපත් අත්පත්කරගන්ට උත්සාහකටයුතු.

බොහෝ රන්රුවන් ආදී සම්පත් තිබැදීත් අනුන්ට කිසිවක් දීම තබා තමාගේ අඹුදරුවන්ටත් නොදී මිහිරිවූ භොජනයක් තනිවම ඉඳ අනුභවකෙරේ නම් ඒ ඕහට දෙලොවින්ම පිරිහීමට කාරණයයි වදාළකල්හි කෙනෙක් ධන රැස්වූවත් තෘප්තිය කට නොපැමිණෙන මහරජකෙනෙකුසේ කාරණ සගක්අසාත් තව තෘප්තියක් නැතිව සත්වෙනි කාරණයත් විචාරන්නාවූ දිව්‍යපුත්‍රතෙම "ඉතිහෙතං" යනාදී ගය කීයේය.

ඉතිහෙතං විජානාම ඡට්ඨමො සො පරාභවො,
සත්තමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

එතං, මේ (සවෙනිපරිහානි) කාරණය; ඉතිහි, වදාළපරිද්දෙන්ම; විජානාම, දනගතුම්හ; සො ඡට්ඨමො පරාභවො, ඒ සවෙනි පරිහානිකාරණය; භගවා, (නසකලද අනිෂ්ටඅකාන්තරූපාදී දෙෂ ඇති නොහොත් සියලුම දෙෂයන් නැසූ) භාග්‍යවත් සර්වඥයන්වහන්ස; සත්තමං පරාභවතො මුඛං, සත්වෙනි පරිහානිකාරණය; බ්‍රෑහි, වදුර; කිං, කවරේදැයි ? (විචාළේය).

මෙසේ විචාළ දෙවියාට සත්වෙනි පරිහානිකාරණය ප්‍රකාශකොට දක්වක බුදුරජානන්වහන්සේ "ජාතිත්ථද්ධො" යනාදි ගාථාව වදාළසේක.

**ජාතිත්ථද්ධො ධනත්ථද්ධො ගොත්තත්ථද්ධො ච යො නරො,**
**සඤ්ඤාතිං අතිමඤ්ඤෙති තං පරාභවතො මුඛං.**

යො නරො, යම්සනෙක්; ජාතිත්ථද්ධො, ජාතිය කරණකොට ගෙණ තදමන් ඇත්තේද (හෙවත් මම ක්ෂත්‍රියාදී ජාතිසම්පන්නයෙමියි මානය උපදවා ගෙණ කිසිවක්හට නොනැමේද); ධනත්ථද්ධො, (රන්රුවන්ආදී ධන ඇත්තෙමියි) ධනය හෙතුකොට ගෙණ තදමන් ඇත්තේවේද; ගොත්තත්ථද්ධොච, (උත්තම ගොත්‍ර ඇත්තෙමියි) ගොත්‍රය හෙතුකොටගෙණ මතින්තදද; සඤ්ඤාතිං, තමාගේ අවශෙෂ නෑයන්; අතිමඤ්ඤෙති, ජාතිධනගොත්‍රමානවශයෙන් තදහෙයින් යටත්කොට දකීද (හෙවත්) සිතාද; තං, ඒ ජාත්‍යාදී මානවශයෙන් සියනෑයන් යටත්කොට දැකීම; පරාභවතො මුඛං, (ඒ සත්වයාහට ශාක්‍යයන්ට මෙන්) පිරිහීමට කාරණයයි (දෙවියාට වදාළසේක).

ජාතිධනගොත්‍රමානවශයෙන් තමන්ගේ අවශෙෂ නෑයන් යටත් කොට සිතීමෙන් වන ආදීනව විඩූඩභජාතකයෙහි කියනලද ක්‍රමයෙන් සංක්ෂෙපයෙන් අසා දතයුතු.

කෙසේද යත් ?.

පසෙනාදි කොසොල්මහරජ්ජුරුවෝ අනඳමහතෙරුන්වහන්සේ ප්‍රධානකොට සඟ පන්සියයකට ආරාධනා කොට දෙන දන් ආදරගෞරවයෙන් සකස් කොට නොදෙන හෙයින් භික්ෂූන්වහන්සේලා දවසක් දෙකක් රජගෙට වැද බලාසිටලා කැමති කැමති තැනට වැඩපිසේක්ලාය අනඳමහතෙරුන්වහන්සේ පමණක් නොවැඩ හුන්සේක රජ්ජුරුවෝ දනසාලාවට අවුත් සංඝයා නොදැක නොසතුටුවූ සිත්ඇත්ව බුදුන්කරාගොස් ස්වාමීනි පන්සියයක් දෙනාවහන්සේට ඉදිකළ දන්වලදන්ට එකම අනඳමහතෙරුන්වහන්සේ පමණක් වැඩහුන්සේක රජව සිට ගෙණිත් මා කළ ආරාධනා නොඉවසන්ට කාරණ කවරේදැයි විචාළේය. බුදුරජානන්වහන්සේත් සංඝයා අත වරදනැතිසැටි දැක වදාරා සංඝයාගේ වරද නොවදාරණසේක් මහණෙනි යම් කුලයකට එළඹුනුකල ඒ කුලයෙහි වසන ජනයෝ සංඝයාදැක හුනස්නෙන් නැගී නොසිටිද්ද හසුන්පනවා නොදෙද්ද දෙනදෙයක් ආදරගෞරව ඇත්ව සකස් කොට නොදෙද්ද එබඳුකුලයකට දැන දැන එළඹෙන්ටවත් එළඹ වැඩඉන්ට වත් සුදුසුනැත යනාදීන් නොයෙක් කාරණ දක්වා ධර්මදෙශනා කොට මහරජ මාගේ සවුවෝ

ගොත්‍ර හා සමාන පුරුදුකමක් නැතිහෙයින් දන් නොවළඳා වැඩසු සේකැයි වදාළසේක, රජ්ජුරුවෝ සංඝයා හා පුරුදුව ගන්නා සැ මතිව මා හා පුරුදුකොට ගණිම්දෝහොයි සිතා ඉදින් බුදුන්ගේ නෑවූ ශාක්‍යරජදරුවන්ගෙන් කිසිවෝ එක්කෙනෙකුන් ගෙනවා අග මෙහෙසුන් කොටලනම් බුදුහු මට නෑවනසේක එසේ කළ බුදුන් ගේ නෑ රජ්ජුරුවෝයයි කියා සංඝයා නිතරම මා ලඟට වඩනාසේ කැයි සිතා ශාක්‍යරජදරුවන්ට දූදරුවෙකෙණෙකුන් සරණ එවන්ට කියා යවූය ශාක්‍යරජදරුවෝද සවාපසබලු ඇති රජ්ජුරුවෝය ජාතිමදයෙන් මත්ව අපි සරණක් දුන්නොමු නම් දුර්වලවූ අප නසාපියති කුමක්කරමෝද රජ පමණින් මුත් අපහා සමාන ජාති නැත්තෝයයි කථාකොට මහානාමරජ්ජුරුවෝ අප කෙල්ලකගේ දුවක් අපට දුන ඈ සරණකොට දෙම්හයි නියම කොටලා මෙ හෙවරට ආවුන්ට යනපත කොසොලගේ රජ්ජුරුවන්ට අපගේ දුවක් සරණකොට දෙම්හයි කිවුය කාගේ දුවක්නොකෙණෙක්දැයි විචාළ කල බුදුන්ට කුඩාපියවූ අමිතෝදන ශාක්‍ය රජ්ජුරුවන්ගේ පුත්වූ මහානාමරජ්ජුරුවන්ගේ දූවූ වාසභඛත්තියාදේවියයි කිවුය එපවත් ගොස් රජ්ජුරුවන්ට කිවුය කොසොල රජ්ජුරුවෝ එපවත් අසා වහා ගොස් ගෙණෙව රජදරුවෝ නම් ගොලොහෝ මායම් දනිති තමන්ගේ දූයයි කියා කෙල්ලකගේ දුවකුන් එවාලනසේ දනිති බුදුන්ට නැවත සිතා කොල්ලන්ට නැවූවොත් නපුර පියානන් හා සමග හිඳ බත්කනකෙණෙකුන් ගෙණ එවයි ඒ දූතයනට යවූය උයින් ගොස් එපවත් මහානාමරජ්ජුරුවන්ට කිවය මහානාම රජ්ජුරුවෝ වාසභඛත්තියාවෝද සව්බරණින් සරසා ගෙන්වා එක්ව කෑමක් නැතත් මායමින් එක්ව කෑ ලෙසක් හඟවා රට සරණපාවා දූතයා උයින් කැඳවා ගෙණ ගොස් රජ්ජුරුවන්ට එප වත් කිවුය රජ්ජුරුවෝත් සතුටුව උන්ට පන්සියයක් බිසෝවරුන්ට නායක කොට අගබිසෝ තනතුරෙහි තුබූහ උයින් නොබෝ කලකින් ඔවුනුපලඳන පින් ඇති රන්වන් පුතකෙණෙකුන් වැදූහ උන්ට නම් තබන දවස් වාසභඛත්තියාවෝ වැදූ කුම රුවාට පඬුවමනා නමක් කියා එවන්නෙයි ශාක්‍යරජදරු වන්ට කියා යැවූය ඒ අසා වාසභඛත්තියාවෝ පුතුන් නො වදුත් රජ්ජුරුවන්ට වල්ලභයෝය දරුවන් වැදූ පසු වල්ලභ කම් කියනුම කවරේදැයි කිවය මෙහෙවර ගිය පුරුෂයාගේ මදක් කණ බිහිරිහෙයින් "වල්ලභ" යයි යන නම පෙරළා "විඩූඩභ" යයි සිතා ගොස් කුමාරයන්ට "විඩූඩභ" යයි යන නම තබාලුව මෑ නවෑයි කීහ රජ්ජුරුවෝද උන්ට පැළඹ එන නාමය කැයි සිතා

F

"විඩූඩභ"යයි නම් කුඹුහ (මෙහි මුල්පටන් විස්තරවශයෙන් විඩූඩභ ජාතකයෙන් රතන වලියෙන් අසා දතයුතු. විඩූඩභ) කුමාරයෝ සොළොස් ඇවිරිදි කල මුතුන් මිත්තන් දකින්ට ගොස් එන ගමනේ එක්ව ගිය සේවකයෙක් තමාගේ ආයුධයක් සිහිමදව ගොස් පෙරලා අනැනැගමෙන් දසයක් කෙල්ලකගේ පුතු හුන් පුවරුයයි බැණ බැණ කිරි පැනින් සඳුන් පැනින් සෝදනු බව දුක අසා ගොස් එපවත් සේනාවට කියා කොලාහලකෙළේය විඩූඩභකුමාරයෝ එපවත් අසා මා හුන් පුවරුව කිරි පැනින් සඳුන් පැනින් සේදූපසු මා රජපැමිණිකල උන්ගේ නලලෙහෙයෙන් මා හුන් පුවරුව සෝධාමියි වෛර බැඳ හිඳ බන්ධුල මල්ලුව සෙනෙවිරදුන්ට බෑනවු දීඝකාරායන නම්වූ සෙනෙවිරදුන්ගේ සහායෙන් රාජ්‍යයට පැමිණ ශාක්‍යරජදරුවන් කෙරෙහි බැඳගත් වෛරය සඳහන්ව (තවද මෙහි විස්තර ධම්මචේතිය සූත්‍රයෙහි පෙණෙන්නේය) විඩූඩභයෝ ශාක්‍යයන් මරම්හ සෙනාව සන්නද්ධකොට ගොස් නික්මුණු වන හ බුදුන් කරුණාවෙන් වැඩ අතරමඟ වැඩහුන් බුදුන් දුක තුන්වාරයෙක වැලක සතරවන වාරයෙහිද සේනාව ගෙණ නික්මුණේය බුදුරජාණන්වහන්සේ විඩූඩභයා තුන් වාරයකම මා දුක වැලක ශාක්‍යයන් මරන්ට දුන් සතරවෙනි වරද නික්මින පෙර පූර්ව කළ අකුශලය කවරේදෝහෝයි දිවැසින් බලා වදාරණසේක් සසර වසන කල ගඟෙක කුඩමස් සන්ට වස යොදා මැරූ අකුශලය දුක නෑගත් නිසා එදා නොවැඩ වැඩඋන්සේක ශාක්‍යරජදරුවෝද දිවිනසියේ විනමුත් ප්‍රාණඝාතාදී අකුසල් නොකරන්නාහුය බොරුවක් නොකියන්නාහුය එහෙයින් මරණින් ගැලමෙඩ තුප්පිණිස තෘණ අල්වාගෙණසිට මේ ශාක්‍ය නොවෙත් තෘණයයි කී අයද හුණ්ගස් අල්වා ගෙණ සිට මේ ශාක්‍යයෝ නො වෙසි හුණයයි කී අයද හැර එකල්ලක්ෂ සැටදාහක් ශාක්‍ය රජදරුවන් මරා ලේ ගඟක් කොට ඔවුන් බොටුඇල ලෙහෙයෙන් තමාහුන් පුවරුව සෝධායා පුදරුව ශුධදිදුව මෙස් නොමේත් ශුධව ගත නොහී මහනාම ශාක්‍යයන් ඩැඳවා ගෙණ යන්නෝ පෙරවරු වේලෙහි බත් කන්ට හිඳ නොගසත් සම මූත් තාගේ තරම නොසලකා කැවුව හිඳ කන්ට මහානාමශාක්‍යයන්ට එන්ට කියා ගවුය සැබෑරජදරුවෝ මිනසත් නාමූත් ගල්නා එක්ව හිඳ නොකන්නාහුය මහානාමරජ්ජුරුවෝ තෙලු වලට බැස නාගෙණ එම් කියා යනුහ විඩූඩභයෝත් මෙවූපක්ෂය පිරිසිඳුනැති හෙයින් රජමායන් නොදුන සගපනැයි කීය මහානාමශාක්‍යයෝද ඉදින් විඩූ

ඩහසා හා කැරිව හිඳ නොකෑවොත් මරයි උංඅත නැසීයාමට වඩා තමාම මියයාම යහපතැයි සිතා හිසකේ උනා අග ගැට ගසා දියට බැසලා පය මාපටඇඟිලි හිසකේ අග ගසා ලූ ගැටෙහි අවුළුවා ගෙණ දියෙහි ගිලුනාහුය උන්ගේ ගුණානුභාවංයෙන් විලුපල්ලෙහි වූ නාගභවනය හුණුවිය නාරජ්ජුරුවෝ කුමක්දෝහෝයි විමසන් නෝ එපවත් දැන අවුත් පෙණයෙහි හිඳුවා ගෙණ ගොස් නාගසම්පතෙහි පිහිටුවූහ විඩූඩභයෝත් ඌගේ මුත්තනුවන් වහන්සේ දූත් දූත් එනසේකැයි බලා හිඳ වෙහෙසී සොයා බලාත් නොදක පලාගිය නියායයි තුමූත් නික්ම අචිරවතී ගඟතර අවුත් සවස් වේලෙහි ගඟබඩ කඳවුරු බැඳගත්හ රෑයං සමගං ගඟී... සමහරකෙණෙක් ඇතුළුගඟ වැලිතලායෙහි වැදහොත්හ සමහරකොංණෙක් ගොඩ වැදහොත්හ ගඟඇතුලත වැදහොත්තවුන් ගෙන් එදු මිසන්ට තිස් අකුසල්නැති සත්‍යන් වැදහොත් තැන කඩියෝ නැඟී කනහෙයින් ගොඩගොස් වැදහොත්හ ගොඩ වැදහොත්තවුන් ගෙන් එදු මියන්ට කල පවුඇත්තවුන් වැදහොත් තැනින් කඩියෝ න ගී කනහෙයින් ගංඉවුලෙල් ගොසින් වැදහොත්හ මෙසේ කළ පින්ඇත්තවුන් තෙර් ගොඩට වූ කලුව කළ පවුඇත්තවුන් තෙරී ගංවැල්ලට වූ කලට ගඟකිස මහාමෙසයක් නැඟී වැස මහවතුරු අවුත් ශාක්‍යරජදරුවන්ට සතුරුවූ විඩූඩභයා හා සමග වැල්ලේහොත් අය අතුරක නොරඳම ගෙණ ගොස් මහමුහුදලාපීහ.

ඒ ජාතියෙහි ප්‍රකෘතිසාගරයට වැද නැසුනුපමණක් නොවෙයි එතැන්පටන් අනන්තකාලයක් මුළුල්ලෙහි සංසාරසාගරයෙහිම ගැලී ගැලී නසිසී දුක් අනුභවකෙරෙයි සංසාරසාගරයෙන් ගොඩයාම කවරකලෙකද නොදනෙයි.

තවද දිඝමඞගලිකානම්වූ සිවුදුව බලුමස් අනුභවකරණ රොඩී කුලයෙහි උපන් මාතඞග පඬිතයන්ට දකොට වැදූ මණ්ඩව්‍යකුමාර සිනට අවවාදදෙනපිණිස ආ එම මාතඞගතාපසයින්ට දෙඩා බැණ මේ කාලකන්නයා නලා මින් පහකර-යි කී පමණට දෙවතාවෝ කිපී ඒ මණ්ඩව්‍යකුමරුවා ඇතුළුවූ අසූදහසක් බ්‍රාහ්මණයින්ගේ බෙංවුපිටුව කරකවා ඇස්උඩ ඉදවා මුර්ඡාකොට බිමහෙලුවාහුය දිඝමඞගලිකාව එපවත් අසා අවුත් දැක අඩා වැලප මෙහි ආකෙණෙක් ඇද්දැයි සිටිවුන් අතින් විචාලකල්හි කසලගොඩදපු රෙදිවැරලි ගොතා හැඳි පාංශුපිසාචයකුවැනි ජටාමඬුළු බැඳි තාපසයෙක්

ආශ්චර්ය්‍ය මහත්ව දෙඩා බැණ තලන්ට උත්සාහ කළකල අහසට නැඟී
ගියේයයි කීවාහුය එබස් අසා මාගේ පුතුට අවවාද දෙනපිණිස
මාගේ ස්වාමිවූ මාතඞ්ගපණ්ඩිතයෝ ආසක්වනැයි සිතා සොයා
බලාගෙණ වැඩිහුන් තැනට ගොස් නමස්කාර කොට ස්වාමීනි
මාගේ දරුවා නොදන කළ වරදට ක්ෂමාකොට වදාළමැනවැයි
යාඥා කළාය ඒ දිට්ඨමඞ්ගලිකාවගේ ජාතිධනරූපමදමානමර්දනය
කරණුපිණිස ඈගේ පිඬුවූ බත්තැන් සිටානන්ගේ යොට ගොස් දිට්ඨම
ඞ්ගලිකාව නොලමදුන නැසීයෙන්නමුන් මෙතනින් නැඟී නොසිටිමියි
වැදහොව ඈ ඉල්වාගෙණ පිටකොටස්කාව නැගී නුවර සතරවීථි
යෙහි ඇවිදුවා රොඩීකුප්පායමට ගෙණ ගොස් තබා හිමාලවනයට
වැදන පසව ධෘ නලපදවා ගෙණ ඇට සඞ්ග්‍රහයක් කෙරෙමියි සිතා
ආ දූ දූය ස්වාමින් උබදුදෙයක් සිතාගෙණ මට මෙබඳු අසරණ
යක් කෙලේ ඇසිදයි අඩාවැටුණු කල කාරුණිකව උපදවා තොපි
ශඞ්කා නොකොට පසුමෙද්දි පැරා දඹදිව සියලුරජුන්ගේ හිස
ජලාභිෂේකයට ගන්නාසේ සුසිඩ කෙරෙම් බලඑකක් ඇත තෙපි
ක්ෂණනතල මාගේ ස්වාමියා රොඩියෙක් නොවෙයි මහාබ්‍රහ්මරාජ
යාය පසලොස්වකදා සඳ පලාගෙණ එන්නේයයි මෙසේ නුවර
කියා ඇවිදු-යි උගන්වා ගොස් පසළොස්වකදා සියලුජනයා
බලබලා සිටියදීම සඳමඬල පලාගෙණ වලාමඬුන් මහාබ්‍රහ්ම
රාජයා මෙයෙන් කුප්පායමට වැද ජාතිභේදයක් නොකොට දරු
වකු හටගන්නාසේ නාභිය පිරිමැද මහාබ්‍රහ්මරාජයාගේ දෙවියයි
ලොව ප්‍රසිද්ධකොට ගිය මහත්තෝ එද තමන්වහන්සේගේම
පුතාට පැමිණි හානියට කුමකින් ක්ෂමා නොකරණසේක්ද කුමට ප්‍රති
කාර නොකරණසේක්ද එවිටින් දිට්ඨමඞ්ගලිකාවකී මාවිසින් කළ
දෙයෙක් නොවෙයි එතකුදුලවත් මේ බත්ගෙණ ගොස් මණ්ඩව්‍ය
කුමා සින්ගත් කවා ඉතිරිබත් පැනට එක්කොට අසූදහසක්
බ්‍රාහ්මණයින්ගේ මුඛ ල විකවියා වත්කරවයි කියා වලඳා ඉතිරිව
තිබූ ඉඳුල්බත් දුන්සේක දිට්ඨමඞ්ගලිකාද ඒ බත් ගෙණ ගොස්
වදාළලෙසම් කළාහුය එවිට මාතඞ්ගතාපසයෝ ක්ෂමාවූසේකැයි
දෙවතාවෝ මිනිසුන් හැරපුහෙයින් සියල්ලම නිදුක් නිරෝගිව
නැගී සිටියාහුය ඉක්බිති මණ්ඩව්‍යකුමාරයන් හැර සෙසු අසූදහසක්
බ්‍රාහ්මණයෝ රොඩීකුලයෙහි උපන් මාතඞ්ගතාපසයන්ගේ ඉඳුල්
කා මේ නුවර සිඳ නින්දගණිවිදින්ට නොපිළිවනැයි කියා ජාති
ගොත්‍ර මානයෙන් අසූදහසම ඒ නුවර හැර මෙධ්‍යකම් රටට
ගොස් විසූවාහුය මාතඞ්ගතාපසයෝද එසින් වැඩ ජතිමාතතාප

සයාගේද ජාතිමානාවමර්දනය කොට බරනැස්නුවර හැර ගිය අසූදහසක් බ්‍රාහ්මණයින්ගේ තව මානාභිමර්දනකරණ පිණිස මෙධ්‍ය නම් රටට වැඩිසේක. එකල්හි ඉඳුල්කා ගොස් සිටි බ්‍රාහ්මණයෝ තාපසයන් දැක හැඳින දෙවියෙනි මේ නුවරට මායාකාරයෙක් ආයේය සිතුවොත් මේ නුවර නුමුත් වනසයි රජහට කියා මරවා පුහ එවිට සිල්වත් ගුණවත් තාපසයන් මැරූ රජුගේ රට වනසම්හයි කියා දෙවියෝ කිපී ගල්වැලිආදී නවවිධවර්ෂාවක් වස්වා කාලිකීර නම් රජවිසූ කලිඟුරට සේ නසා මෙධ්‍යකාරණ්‍ය කළාහුය.

එබැවින් පින්වත් සත්පුරුෂජනයෙනි මානයෙන් තදව කෝසොල් රජහට දැසියකදී නැවත විඩූඩභයා අතින් නැසීගිය ශාක්‍ය රජදරුවන්සේද මාතඞ්ගතාපසයන්ගේ ඉඳුල් කෑවුයේයයි ජාතිගෝත්‍රමානවශයෙන් තදව උපන් රටත් හැරගොස් සිටිය රටත් නසාගෙණ විනාශයට පැමුණුනු අසූදහසක් බ්‍රාහ්මණයන්සේද ජීවිත විනාශවීමට නිසුවට ගණිවට නොපැමිණ ජාතිධනගෝත්‍රමානවශයෙන් තදනොව නිහතමානීව දුක්පත් ඥාතිමිත්‍රාදීන්ට සඞ්ග්‍රහකිරීම් වශයෙන් කුසල් රැස්කොට ගෙණ සගමොක් සිරිසැපත් අත්පත් කරගන්ට උත්සාහ කටයුතු.

යමෙක් ජාතිසම්පන්නයෙම් මහත්වූ ධනඇත්තෙම් උතුම්වූ ගෝත්‍රඇත්තෙම්යි තදමන්උපදවා තමාගේ දුක්පත් අවශේෂ නෑයින් යටත් කොට සිතාද ඒ හිතට දෙලොවින්ම පිරිහීමට කාරණයයි මෙසේ මේ ගාථාවෙන් වදාලකල්හි එකෙකු දෙන්නකු වදගතිම් මට මෙපමණඇතැයි කියා තෘප්තියකට නොපැමිණ තව තව දරුවන් කැමති මවකසේ සත්කාරණයක් අසාත් තව තෘප්තියකට නොපැමිණ අටවෙනි කාරණයත් අසා දැනගන්නා කැමතිවූ දිව්‍යපුත්‍රතෙම "ඉතිහෙතං" යනාදී ගය කීයේය.

ඉතිහෙතං විජානාම සත්තමො සො පරාභවො,
අට්ඨමං භගවා බ්‍රූහි කිං පරාභවතො මුඛං.

එතං, මේ සත්වෙනි පරිහානි කාරණය; ඉතිහි, වදාලපරිද්දෙන්ම; විජානාම, දැනගතුම්හ; සත්තමො සො පරාභවො, යේ සත්වෙනි පරිහානි කාරණය; භගවා, (නසනලද මොහගනඳුරුඇති හෙවත් මොහනැමති ගනඳුරු නැසූ) භාග්‍යවතුන් වහන්ස; අට්ඨමං පරාභවතො මුඛං, අටවෙනි පරිහානිකාරණය; බ්‍රෑහි, වදාර; කිං, කවරේදැයි ? (විචාලේය )

මෙසේ විචාළ දෙවියාට අටවෙනි කාරණය තට කියමි දනාගනුවයි වදාරණ තුන්ලොවට සිතුමිණක්වැනි මුනිතුමානන්වහන්සේ “ඉත්ථිධුත්තො” යනාදී ගාථාව වදාළසේක.

ඉත්ථිධුත්තො සුරාධුත්තො අක්ඛධුත්තො ච යො නරො,
ලද්ධං ලද්ධං විනාසෙති තං පරාභවතො මුඛං.

යො නරො, යම් සත්වයෙක්තෙම; ඉත්ථිධුත්තො, පරස්ත්‍රීන් සේවනය කෙරේද (නොහොත් තමාගේ සියලු සම්පත්දී නැවත නැවත මාගම සිත්ගන්නේද); සුරාධුත්තො, රා බීමෙහි ලොල්වූයේද (නොහොත් තමාසතු සියල්ලදීත් රා බීමෙහි ඇලුනේද); අක්ඛධුත්තො ච, (හඳින ශිණපිළි උනස්කොට තබාත්) දූකෙළියෙහි ලොල්වූයේ; ලද්ධං ලද්ධං, ලද ලද සම්ක්සි වස්තුවක්; විනාසෙති, (ඒ ඒ තැන දීමෙන්) නසාද; තං, ඒ යථොක්ත ත්‍රිවිධය; පරාභවතො මුඛං, (ඔහුට ධනහානියෙන්නා නරකයෙහි ඉපදීමෙන්ද) පිරිහීමට කාරණයයි (වදාළසේක.)

පරස්ත්‍රීසේවනය කරණ රා බොන දූකෙළින සත්වයා මෙලොව පරලොව දෙකින්ම මහත්වූ ධනහානියට පිරිහීමට පැමිණෙන බව මේ භද්‍රඝටජාතකයෙහි කියනලද ක්‍රමයෙන් සංක්ෂෙපයෙන් අසා දතයුතු.

කෙසේද යත් ?.

මා නිසාම බුදුවූ සර්වඥයන්වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසන සමයෙහි අනේපිඬුමහසිටානන්ගේ එක්පුතෙක් අක්ෂධූර්ත සුරාධූර්ත ස්ත්‍රී ධූර්තවූ නොයෙක් දෙයෙහි යෙදී වාසය කොට ඇතිසම්පත් නසා දුක්පත්ව තමාගේ පියානන් කරා අවුත් දුඃඛිතයෙමි කියන්නා පියාණෝ මසුරන් පන්සියයක් දුන්නාහ ඒ මසුරන් පන්සියයත් වෙළඳාම් ආදිවූ දෙයක් කොට සම්පත් උදවා නොගෙණ එයිත් ධූර්තකමින් නසා පෙරලා අවුත් පියානන් අතින් සම්පත් ඉල්වූහ පියාණෝ පෙරලා සම්පත් දී ඒ බව සර්වඥයන්වහන්සේට දන්වූහ සර්වඥයන්වහන්සේ පළමුත් උත්තමයෝ මුන්ට දුන් සම්පත් නසා ගියේ වේදැයි වදාරා කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගියදවස බරනැස බඹදත්නම් රජකෙණෙක් ජනරජනය කරණසමයෙහි බොධිසත්වයෝ ඒ නුවර සිටුවව ඉපද සඳන්හල් කරවා මහදන් දී මිය ගොස් ශක්‍රදෙවෙන්ද්‍රව තමාගේ පුත්‍රයා කුමක්

කොට වාසයකෙරේදෝහෝයි බලා දුඃඛිතව සිහා සා වාසයක රණතියාව දක දයාවෙන් මොහුට මා විසින් සම්පත් දෙන්ට උව මැනවැයි කියා භද්‍රඝටයක් දී කියන්නාහු මේ සම්පූර්ණඝටය ඉඳුරා තබාගෙණ උණුනම් තොපට කිසි සම්පතකිහුත් අඩුවෙක් නැත කියා පූර්ණඝටය දී දෙව්ලොවටම ගියේය. ඒ තෙම පූර්ණඝටයෙන් උපන් සම්පත් ඈරගෙණ සුරාව අනුභවකොට මත්ව එක්දවසක් තෙමේම පූර්ණඝටය ආකාශයට දමදමා උන් කලට පූර්ණඝටය බිම වැටී බිඳිනා එතැන්පටන් බොහෝසේ තවත් දුඃඛිතවීයයි කියා ඒ අර්ථය ප්‍රකාශකොට ධර්මදෙශනා කර වදරන්නාවූ සර්වඥයන්වහන්සේ කැමති කැමති සම්පත් දෙන්නාවූ පූර්ණඝටය ධූර්තයෙන්මිදී යම් පමණ කලක් රක්‍ෂාකොරේද එතාක්කල් සැපවබන්නේය යම්කලෙක්හි සුරාමදයෙන් මත්ව ප්‍රමාදව ඒ ඝටය බින්දේද එතැන්පටන් නගනාව දුඃඛිතව ඒ අඥානබාලසත්වතෙම ශොකයෙන් තැවෙන්නේය එපරිද්දෙන්ම යමෙක් වස්තුයෙහි පමණ නොදන රාපීම් ආදියට වියදම් කෙරෙමින් නිස්කාරණයට පමුණුවා ප්‍රයොජන විඳිද ඒ ධූවනමද සත්වයා පූර්ණඝටය බිඳ ශොකයට පැමුණුනු ධූර්තයාමෙන් පශ්චාත්තාපයට පැමිණෙන්නේයයි වදාරා එසමයෙහි ධූර්තයා නම් දන් මේ සිටුපුත්‍රයාය එසමයෙහි ශක්‍රදෙවෙන්ද්‍රව උපන්නෙම් බුදුවූ මම්මවේදයි වදාරා මේ භද්‍රඝටජාතකය නිමවා වදාළසේක.

මේ ආදිවශයෙන් පරස්ත්‍රී සෙවනාදියෙහි ආදීනව වදාළ තොරයෙක් බුඩවචන අසා දන හැඳික දහැමෙන් සෙමෙන් සොයාගත් ධනයක් ඇත්නම් පරස්ත්‍රීසෙවනයට රාපීමට දූකෙළියට වියදම් කොට විනාශභාවයට නොපමුණුවා ශක්තිපමණින් දානාදී කුසල් කොට ස්වර්ගාපවර්ග සම්පත්තිප්‍රතිලාභයට පැමිණෙන්ට උත්සාහ කටයුතු.

යමෙක් පරස්ත්‍රීසෙවනයට රාපීමට දූකෙළියට තමා ලදසම්පත් වියදම් කොට විනාශකෙළේවී නම් ඒ ඔහුට දෙලොවින්ම පිරිහීමට කාරණයයි කියා මෙසේ මේ ගාථාවෙන් වදාළකල්හි ලක්ෂව ඇත්පමණ ජනයෝ එකවිට රැස්වූවත් නොපිරෙණ ජිනවරපදල කුණුපිහිටි කලවිටක් පමණ ඇති සංඝාලගල මුදුනසේ මෙපමණ් කාරණාදැදන් තව සිත නොපිරි නවචන කාරණය විචාරණ දිව්‍ය පුත්‍රතෙම "ඉතිගෙතං" යනාදී ගය කීයේය.

ඉතිහෙතං විජනාම අඩමො සො පරාභවො,
තවමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

එතං, අට්ඨමෙන් හේතුකාරණය; ඉතිහි, වදළපරිද්දෙන්ම; විජානාම, දැනගනුමිහ; සො අට්ඨමො පරාභවො, හෙ අටවෙනි පිරිහෙනකාරණය; භගවා, (නසන්ලද දෙසැටදෘෂ්ටිඇති නොහොත් දෙසැටදෘෂ්ටි භග්නකළ) භාග්‍යවතුන්වහන්ස; නවමං පරාභවතො මුඛං, නව වැනි පරිහානිකාරණය; බ්‍රෑහි, වදාර; කිං, කවරේදැයි ?(විචාළේය).

මෙසේ විචාළාවූ දෙවියාට නවවැනි කාරණය ප්‍රකාශකොට දක්වන ත්‍රෛලෝක්‍ය නායකවූ ජිනෙන්ද්‍රොත්තමයානන්වහන්සේ "ෂෙහි දාරෙහි" යනාදි ගාථාව වදාළසේක.

> සෙහි දාරෙහි සන්තුට්ඨො වෙසියාසු පදිස්සති,
> දිස්සති පරදාරෙසු තං පරාභවතො මුඛං.

සෙහි දාරෙහි, තමාගේ භාර්‍ය්‍යාවන් හෙතුකොට ගෙණ; අසන්තුට්ඨො, නොසතුටුවූ යමෙක්; වෙසියාසු, වෙශ්‍යාවන්කෙරෙහි; පදිස්සති, දක්නාලැබේද; පරදාරෙසු, (එසේම අසන්තුෂ්ටවූයේ) පරස්ත්‍රීන්කෙරෙහි; දිස්සති, දක්නාලැබේද; තං, ඒ (වෙශ්‍යාවන්ද පරදාරවන්ද කෙරෙහි දැකීම් සඞ්ඛ්‍යාත යථොක්ත ප්‍රකාරය); පරාභවතො මුඛං, (ඒ වස්තු ක්‍රමයෙන් රජුන්විසින් දඬුවම් ඇණීම් ආදීවූ) පිරිහීමට කාරණයයි (වදාළසේක.)

සියඹුවන්කෙරෙහි නොසතුටුව වෛශ්‍යාවන් පරදාරවන් කරා එළඹීමෙන් වන ආදීනව මේ අභිනාඹුජාතකයෙහි කියනලද ක්‍රමයෙන් අසා දතයුතු.

කෙසේද යත් ?.

සද්ධර්මාම්බඝාප්‍රවාහවූ සර්වඥයන්වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසනසමයෙහි එක් කුලස්ත්‍රියක් ඔබ්බෙහි ගේකට පාවාදුන්නාහ පාවාගත් කොලෙඹිපුත්‍රද එකියන කුමාරිකාව කෙරෙහි නොසතුටුව පරදාරවන්කෙරෙහි ඇලී ඇවිදිනේය ඒ කුමාරිකාත් දශබලයන්වහන්සේලාගේ උපාසිකාකුලෙහි උපන්හෙයින් ස්වාමිපුරුෂයාගේ අනාචාරයට නොකිපී සැරියුත් මුගලන් දෙදෙනාගේ අවවාදයෙන් දනාදිකුසල් කොට සෝවාන්ව සසුන් වැද මහණව විදර්ශනාවඩා රහත්වූසේක. ඒ බව දම්සභාමණ්ඩපයෙහි රැස්වූ මහාසංඝයාවහන්සේ කථාකොටකොට හුන් තැනට සර්වඥයන්වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුන්දැයි විචාරා වදාරා එපුවත් අසා මහණෙනි පෙරත් මේ ස්ත්‍රිය තමන්ට වැඩසාදනත්තේමැයි වදාරා ඒ කො

සේදැයි ආරබ්බවූ සර්‍වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාරණ
සේක් මහණෙනි යටගිය දවස බරනැස බඹදත් නම් නරපතිකෙ
ණෙක් ජනරජනය කරණකල බොධිසත්‍වයෝ බ්‍රාහමණකුලෙහි
ඉපද හිමාලයවනයට ගොස් සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධ්‍යානලා
භිව වැඩවාසයකරණසේක, එසමයෙහි බරනැස්රජ්ජුරුවන්
ගේ වැඩිවිය පැමිණි රාජකුමාරයෙක් ඇත්තාහ ඒ රාජකුමා
රයෝ තමාගේ අභිතාප නම් බිසවුන් හා හිමාලයවනයට ගොස්
බොධිසත්‍වයන්වසන්නාවූපන්සැල සමීපයෙහි ඉන්නාහ. එසම
යෙහි එක්තරා ලියකින්නරඟනාවක් රජ්ජුරුවන්ගේ ඉදිරි
යෙන් නික්මෙන්ට එන රජ්ජුරුවෝ ඈ කෙරෙහි පිළිබඳ සිත්
ඇතිව බිසවුන්කෙරෙහි නොසතුටුව ලියකින්නරාව අල්වමි සිතා
පසුපස්සේ නික්මුනාහ ඒ දැක බිසවු සිතන්නාහු මේ රජ්ජුරුවන්
හා දුග් ගෙණ ආ මා නොබලා මේ පක්‍ෂිධෙනුවක පස්සේ නික්මු
නාහ එබැවින් රජ්ජුරුවන්ගෙන් මට කාරණකිම්දැයි සිතා තාප
සයන්කරා ගොස් ස්වාමීනි මා තාපසකරන්නේ යයි යාච්ඤාකොට
තාපසව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ගෙණ තාපසයන් ලඟම
සිටියාහ එවෙලාවට රාජකුමාරයෝත පක්‍ෂිධෙනුව සොයා ඇවිද ඈ
නොදැක තාපසයන් සිටිය තැනට අවුත් සිටියාහ එවිට බිසෝ
කියන්නාහු රජ්ජුරුවෙනි තෙපි මා හැර පක්‍ෂිධෙනුව බලා ගිය
විසින් මම ධ්‍යානලාභිව ගියෙමි එසේහෙයින් නුඹවහන්සේ නිසා
බොහෝසේ ලාභ මට වූයේය ඉතින් නුඹවහන්සේ හා මාහා සං
වාසයක් නැතැයි කියා ආකාශයට පැනනැගී සෘඩියෙන් ඔබ්බකට
ගියාහ රජ්ජුරුවෝත් බොහෝ විශෙෂපයට පැමිණ කියන්නාහු
යම් පුරුෂකෙණෙක් බොහෝ තෘෂ්ණාවට පැමිණ බොහෝදුකට
පැමිණෙද්ද ඒ කාරණය මාගෙන්ම දිටිමි යම්සේ මේ අභිතාප
නම් බිසවුන්ගෙන් වියෝවූ මා වැන්නැයි කියා රාජකුමාරයෝ
තමන්ගේ පියානන් මලපවත් අසා බරනැස් නුවරට ගොස් රා
ජ්‍යයට පැමිණියහයි යනාදීන් මේ ධර්‍මදෙශනාව නිමවා වදාළ
සේක.

එබැවින් මෙලොව සොකයට පිරිනීමට නොපැමිණෙනු කැමති
සත්‍වයන් විසින් අභිතාප නම් බිසව හැර කින්නරඟනාව කෙ
රෙහි බැඳී ගොස් ඈත් නොලැබ බිසවත් නොලැබ සොකයට
දුකට පැමිණි බරනැස්රජසේ නොව සියඹුවන් කෙරෙහි සතුටුව
පරදාරාවන් නොසොයා කල් යවමෙන් කුසල්කොට ගෙණ

ස්වර්ගාපවර්ග සම්පත්ති ප්‍රතිලාභයට පැමිණෙන්ට උත්සාහ කටයුතු. සියඹුවන් හෙතුකොට නොසතුටුවූ යමෙක් වෛශ්‍යාවන් පරස්ත්‍රීන් කෙරෙහි සතුටුව ඔවුන්කරා එලඹීමෙන් දවස් යවා නම් ඕහට මෙ ලොවත් දඬුදීම් ආදිවූ ධනහානියටද පරලොවත් සතරඅපායකට පැමිණීමෙන් මහත්වූ පිරිහීමද වන්නේ යයි කියා මේ ගාථාවෙන් වදාළකල්හි දෙදහසක් කොදෙව් පිරිවරකොට ඇති සතරමහාදිවී පයට සප්තවිධරත්නයෙන් යුක්තවූ සක්විතිරජව ඒ රජසිරිසැප තිබුත් තෘප්තියකට නොපැමිණ තරුපෙණෙන දෙව්ලොවට ගොස් දිවසිරි සැපතට පැමිණ එත් තෘප්තියකට නොපැමිණ තව්තිසා දෙව්ලොවට ගොස් ශක්‍රසම්පත් දෙකට බෙදූගණ දිව්‍ය රාජ්‍යසම්පත් අනුභවකොට ඒත් තව තෘප්තියක් නැතිහෙයින් සක්දෙව්රජ මරා සියලු දිව්‍යරාජ්‍යය ගණ්මියි සිතූ මහාමන්ධාතු මහ රජසේ මෙතෙක් මෙතෙක් පරිහානිකාරණ අසාත් ඒ ඒ තැන දීම තෘප්තියකට පැමිණ නොනවැත්තවද දසවෙනි කාරණයත් කවරේදැයි ? විචාරන්නාවූ දිව්‍යපුත්‍රතෙම "ඉතිහෙතං" යනාදී ගය කීයේය.

ඉතිහෙතං විජානාම නවමො සො පරාභවො,
දසමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

එතං, මේ නවවැනි පරිහානිකාරණය; ඉතිහි, වදාළපරිද්දෙන්ම; විජානාම, දැනගතුම්හ; සො නවමො පරාභවො, හේ නවවැනි පරිහානි කාරණය; භගවා, (නසනලද කෙලෙශයන් ඇති හෙවත් සකලකෙලෙශයන් නැසූ) භාග්‍යවතුන්වහන්ස; දසමං පරාභවතො මුඛං, දසවෙනි පරිහානි කාරණය; බ්‍රෑහි, වදාරා; කිං, කවරේ දැයි ? (විචාළේය).

මෙසේ විචාළ දෙවියාට දසවෙනි කාරණය ප්‍රකාශකොට විදූ රණ සාධුජනමනකමලවනවිකාශකාංශුමාලීවූ සර්වඥයන්වහන්සේ "අතීතයොබ්බනො" යනාදී ගාථාව වදාළසේක.

අතීතයොබ්බනො පොසො ආනෙති තිම්බරුත්ථනිං,
තස්සා ඉස්සා න සුපති තං පරාභවතො මුඛං.

අතීතයොබ්බනො, ඉක්ම ගිය යෞවනවයස් ඇති (හෙවත් අසූ-අනූ වයස් ඇති); පොසො, පුරුෂයෙක්තෙම; තිම්බරුත්ථනිං, තිඹිරිඵලයක් වැනි තනඇති ලඳරියක්; ආනෙති, (කලතුවශයෙන් තමා) ගෙණ එද ඒ තෙම; තස්සා, ඇට; ඉස්සා, ඊර්ෂ්‍යාවෙන්; න සුපති, රාත්‍රියෙහි නොනිදාද (ලඳරියගේ මාල්ලා හා කාම

රතියක් සහ වාසයක් නොවනහෙයින් ලදරුවකු පතාද්‍යෙ හෝසි ඊර්ෂ්‍යාවෙන් ඈ රක්නේ නොනිදන්නේය), තං, ඒ (යථොක්ත ඊර්ෂ්‍යාවෙන් නොනිදීම් සඞ්ඛ්‍යාත ඒකප්‍රකාරය); පරාභවතො මුඛං, (කාමරාගයෙන් හා ඊර්ෂ්‍යාවෙන් නොනිදන්නේ ගොවිතැන් වෙළඳාම් ආදී පිටත කර්මාන්ත නොයදීමෙන් ඔහට) පිරිහීමට කාරණයයි (වදාළසේක).

මහලු පුරුෂයෙක් තරුණ වනිතාවන් සරණකොට ගෙණ තරුණපුරුෂයන් පතාද්‍යෙ යන ඊර්ෂ්‍යාවෙන් නොනිදා ඇගේ සිත නොබිඳ ඇට යටත්ව භයපත්ව දවස්හරි නම් ජූජක බ්‍රාහ්මණයාටවූ ජීවිතහානිය මෙන් මහත්වූ විනාශය පැමිණෙයි.

කෙසේද යත් ?.

කලිඟුරට දුනුවිට්ඨ නම් ගම වසන ජූජක නම් මහලු බ්‍රාහ්මණයෙක් තමා සිඟාලත් මසුරන් සියක්කලඳක් එක් අනාථබමුණකු වෙත තබා ඔහු අනාථ විසින් ඒ රන් විකොට කෑ නිසා ඔහුගේ අමිත්තතාප නම් දුවක් ගෙණ ගොස් තමාට අඹුකොට ගෙණ වසන කල්හි ඒ ගම සෙසු බමුණෝ ඔවුනොවුන්ගේ බැමිණියන්ට කිපී තෙපි අපට කුමක්කරවුද මහලු ජූජක බමුණාගේ තරුණඅඹුවක් සියලු අත්පා මෙහෙකෙරෙමින් ඕහට කීකරුව වසන්නී යයි කියා වෙහෙසූහ එකල්හි ඒ ගම බැමිණියෝ අමිත්තතාපනම් බැමිණිය පැන්තොටදී දැක එම්බා පවුකිනිය තී මේ දත්හුණු බමුණුමහල්ලකුට කුමට මෙහෙ කෙරේද ඌ කඩදත් දල්වා සිනාසෙන වේලෙහි තිට කවර නම් සමාධියෙක්ද තී දුන් දෙමව්පියෝ තිට සතුරෝ නොවේද එසේහෙයින් මේ බමුණුමහල්ලා හැර තී සේ රුවඇති සැමියකු සොයා ගණුවයි යනාදී නොයෙක් නින්දා කියා වෙහෙසූහ එකල ඒ අමිත්තතාප නම් බැමිණිය පැනට ගෙණගිය කලය ගලක ගසා බිඳ බමුණුමහල්ලා කෙරේ ක්‍රොධයෙන් ගෙට අවුත් කොල නපුරු බමුණුමහල්ල තෝ සේවූ කෙලතොල්ලෙකුට අඹුවූ විපාක අදම දිටිමි මේ ගම බැමිණියෝ එක්ව මා හිස බොල්කෙලහෙලන්නාසේ බොලු මට නොකී නොකලදෙයෙක් නැත තා කෙරේ ඉඳ මෙසේවූ බස් අසන්නාට වඩා කරවැල්ලාගෙණ මිය යාම යහපතැයි කී බස් අසා බමුණුතෙම කියනුයේ සොඳුර තෙපි රැහැණ්නොවව දරත් මම්ම ගෙණෙමි දියත් මම්ම ගෙණෙමි සෙසු කලමනා යම්දෙයෙක් ඇත්නම් මම්ම කෙරෙමි තොපි අදපටන් කිසිවක් නොකරවයි

කී හෙයින් බැමිණී කියන්නී සැබව සැමියන් අතින් මෙහෙගන්නා කුලයෙක මා උපන්නෙන් නැත එබලු නපුරු බමුණ තට මම උපායක් කියමි වෙස්සන්තර රජුනෝ වඞ්කගිරියෙහි තපස්කෙරෙති ඔබට ගොස් එහලුක් ගෙණ අයිනම් හිඳිමි නැතහොත් මාගේ දෙමව්පියන්ගේ ගෙට යෙමි ක්වාය. එබස් අසා බමුණු තෙම සොකපත්ව වලින් දරඇද ගෙන පුරා දිය ඇද වලන් පුරා බත් බුලත් සපයාදී අඹුව සිඹ සනහා පියා වැඳ සමුගෙණ සතර තැනෙක සිට වදිමින් ඈ කෙරේ හයින් පසු පෙරළි පෙරළි සිට වදිමින් යනුයේ (මෙහි විස්තර වෙස්සන්තරජාතකයෙන් අසා දත යුතු) ඒ බමුණ මහදුග් ගෙණ ක්‍රමයෙන් ගොස් වංකගිරිපර්වතාසන්නයෙහි වසන වෙසතුරු මහරජකරා පැමිණ ප්‍රියකරු සුරතල් වදන් දෙන සොඳුරු රූඇති බාලදරු දෙදෙනා වාලුව ගෙණ දෙවතානුභාවයෙන් ක්‍රමයෙන් අවුත් සඳමහනුවරට පැමිණිකල්හි මුනුන්මිත්තෝ දැක හැඳින අඹා වැළප මුණුබුරන් බරට රන්කිරාදී ගෙණ නැවත බමුණාට රසමසවුලෙන් යුත් බත් අනුභවකරන්ටත් දුන්නාහුය ඔහු ඒ බත්කා දිරාගතනොහී එතනම මිය ගියේය. එබැවින් අඹුවනිසා අනාථව මිය ගිය ජූජක නම් බමුණසේ නොව මහලුවූ හෝ තරුණවූ හෝ සත්වයන් විසින් ගුරුළුබවනෙහි පවා ලා රැකගතනුහුනු ප්‍රමදාවන් රකිමිසි කියා ප්‍රමාද නොව අප්‍රමාදව කුසල්කොට සංසාර සයුරෙන් එතරවීමට උත්සාහ කටයුතු.

ඉක්මුනු යෞවනවයස් ඇති මහලුපුරුෂයෙක් යෞවන ස්ත්‍රියක් තමාට කලත්‍ර කොට ගෙණ ඈ කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් යෞවනයන් පතාද්දේ සිතා නොනිඳා නම් ඔහට දෙලොවින්ම වන වැඩ නොව පිරිහීමට පැමිණෙන්නේ යයි මේ ගාථාවෙන් මෙසේ වදාලකල්හි පඨමභාගඬගාදීන්ගේ ජලකඳ වැදත් තෘප්තියකට නොපැමිණෙනා මහාසාගරයසේ දසවෙනි කාරණයක් අසාත් තව සිත නොපිරී එකොළොස්වෙනි කාරණයත් කවරේදැයි ? විචාරණ දිව්‍යපුත්‍රතෙම "ඉතිහෙතං" යනාදී ගය කීයේය.

ඉතිහෙතං විජානාම දසමො සො පරාභවො,
එකාදසමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

එතං, මේ දසවෙනි පරිහානිකාරණය; ඉතිහි, වදාළපරිද්දෙන්ම; විජානාම, දැනගතුම්හ; දසමො සො පරාභවො, ඒ දසවෙනි පිරිහීම් කාරණය; භගවා, (ප්‍රවරතරනිරුත්තරධර්මරත්නය

භජනය කළ) භාග්‍යවතුන්වහන්සඃ එකාදසමං පරාභවතො මුඛං, එකොළොස්වැනි පරිහාන් කාරණය; බ්‍රෑහි, වදාරඃ කිං, කවරේ දැයි? (විචාළේය).

මෙසේ විචාළදෙවියාට එකොළොස්වෙනි කාරණය ප්‍රකාශකොට වදාරන්නාවූ සනරාමරලොකාභිවන්‍දනීයවූ බුදුරජානන්වහන්සේ "ඉත්ථිසොණ්ඩං" යනාදි ගාථාව වදාළසේක.

ඉත්ථිසොණ්ඩිං විකිරණිං පුරිසං වාපි තාදිසං,
ඉස්සරියස්මිං ඨපාපෙති තං පරාභවතො මුඛං.

සොණ්ඩිං, මත්ස්‍යමාංස සුරාවෙහි ලොල්වූ තෘෂ්ණා ඇති; විකරණිං, (ඒ මත්ස්‍යමාංසාදිය නිසා සම්පත් පස්මෙන්) විසුරුවන සුලුවූ (නසන); ඉත්ථිං වා, ස්ත්‍රියක හෝ; අපි, තවද; තාදිසං, එබඳුවූ (හෙවත්) ස්ත්‍රියවැනිවූ; පුරිසං වා, පුරුෂයකු හෝ; ඉස්සරියස්මිං, (යතුරු මුද්‍රාආදියෙහි භාණ්ඩාගාරාදියෙහි හෝ කර්මාන්තාදියෙහි හෝ වෙළඳාම්ආදියෙහි හෝ) ඉසුරුබවෙහි; ඨපාපෙති, තබාද (හෙවත් එහිගෙහි නියුක්තයා කෙරේද); තං, එබඳුහු (ඉසුරෙහි සිටුවීම් සඞ්ඛ්‍යාත එකප්‍රකාරය); පරාභවතො මුඛං, (ඔහට ඔහුගේ වශයෙන් ධන හානිය වන හෙයින්) පිරිහීමට කාරණයයි (වදාළසේක).

සුරාපානාදියෙහි සොඬවූ සම්පත් පස්මෙන් විසුරුවන ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ඉසුරක තිබූයේවී නම් ඒ ස්වාමියාටද ඔවුන් වද වන හානිය මේ මහාධනසිටානන්ගේ කථාවෙන් සංක්‍ෂෙප යෙන් අසා දතයුතු.

කෙසේද යත්?,

බරණැස අසූකෙළක් ධනඇති මහාධනසිටානකෙණෙක් මේ අසූකෙළක් පමණ ධන[illegible]මාගේ පුත්‍රයාට දිවිහිමියෙන් ආයාසයක් නැතිව[illegible]රැකීමට ඇතැයි සිතා කිසි සිල්පයක් නූගන්වා ගීතැවුම් පමණක් උගන්වා එම නුවර එපමණ ධනඇති සිටානකෙණෙකුන්ගේ එසේම නැටීමෙහි ගී කීමෙහි හික්මවා සිටි කුමාරිකාවක් සරණපාවා ගෙණදී දෙපක්‍ෂයෙහිම දෙමව්පියෝ දරුදෙදෙන සියලු සිටුසැපතට ඉසුරුකොට තබා මිය පරලොව ගියාහුය. ඉක්බිති දවස තුන්විටෙක රජසේවයට රජගෙට ගොස් එන යන ඒ සිටුපුත්‍රයා දුටු රාසොඬහු ඉදින් මේ සිටුපුත්‍රයාත් රාසොඬවූයේ නම් අපට මහත් සැපතෙක් වෙයි සිතා උපායෙන්ම සිටානන්ගේ

සිත්ගෙණ රා පොවා තමන්ට එකතුකොට ගත්හ. ඒ සිවා
ගෝද නැටීමෙහි ගී කීමෙහි දක්ෂහෙයින් රා බී මත්ව නටන
ගී කියන මද්දල ගසන අය රැස්කොට ගෙණ ඔවුන්ට සියදහස්ග
ණන් වස්තු බෙදා දීමෙන් හා පැලඳීමට සුවඳමල් සඳුන් ආදිය ගැ
ණීමට වස්තු වියදම්කිරීමෙන් නොබෝකලකින් ඒ සිටුපුත්‍රයා
සතු අසූකෙලක්ධනද සිටුභාර්‍ය්‍යාව සතු අසූකෙලක් ධනද
විනාශයට පමුණුවා ජීවත්ව ගතනොහෙන හෙයින් කෙත්
අරන් රන්රිදී වලන් ඇඳපුටු කොට්ට කළාල ආදිවූ දෙදෙනා
සතු සියලු වස්තුවම විකොට කා කෙලවර මහලු අවස්ථාවෙහි
හුන් ගේත් විකොට ඒ ගෙය ගත්අය එයිනුත් නෙරපූහෙයින්
භාර්‍ය්‍යාවත් කැඳවා ගෙණ අනුන්ගේ බිතක්කනට පලාගොසින්
රඳාහිඳිනාහු කබල්කැටි හැරගෙණ සිඟාඇවිද බොහෝදෙනා කා
අත්තයෙහි ලූ බත්කන්ට පටන්ගත්හ. එතෙක් ධනරාසියක් නාසා
කොටගත් නින්දිත ක්‍රියාලෙසටම නින්දිතවූ ජීවිකාවිය එක්දවසක්
සංඝයා වලඳන තැනට ගොසින් බාල වහන්දෑ පාත්‍රාවලින් ඉලන
බත් නොමැලිව ලවාගන්නවුන් දැක පලමු පොහොසත්කලදී
ලූ නියාවට ලබනසැටි ඉතා නින්දිතහෙයින් පහලකර වදාරණ
සිනාවෙන් බුදුහු සිනාපහලකර වදාලසේක. ඒ දැක අනඳම
හතෙරුන්වහන්සේ සිනාපහලකරවදාරන්ට කාරණ කවරේදැයි
විචාළසේක. බුදුහුත් සිනාපහල කිරීමට කාරණ වදාරණසේක් අන
ඳයෙනි මහාධනසිටානන්ගේ පුතනුවන් දුටුවාවාද තුලූ මෙම
නුවරදී තමන් සන්තක අසූකෙලක් හා සිටුදුවනියන් සන්තක
අසූකෙලක් හා මෙලොව පරලොව දෙකින් කිසි ප්‍රයෝජනයක්
නැති අකාරිය නිසා වියදම් කොට නසාපීශ දූන් සිඟා කා ඇවි
දිති ඉදින් මුතුමු පලමු මධ්‍යම අන්තිම යන මේ තුන්වයසෙහි
දීම සම්පත් ප්‍රයෝජනවත් ලෙස යෙදූනම් පළමුවෙනි දෙවෙනි
තුන්වෙනි සිටුතනතුරු ලබති එසේ නොව සසුන් වැද මහණවූ
නම් ක්‍රමක්‍රමයෙන් රහත් අනාගාමි සකෘදගාමි ඵලයට පැමිණෙති
සිටුභාර්‍ය්‍යාවද අනාගාමි සකෘදගාමි සෝවාන්ඵලයට පැමිණෙන්
නීය. දූන් දෙදෙනාගේම සම්පත් නිස්කාරණයෙහි නසාගත්හෙ
යින් දුක්පත්ව සිඟා කා ඇවිදිත්තේය යනාදීන් ධර්‍මදෙශනාකර
වදාලසේක. දෙශනාව කෙලවර බොහෝදෙනා සෝවාන් සකෘද
ගාමි අනාගාමි රහත්වූහ.

එහෙයින් ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් විසින් මේ ආදී වශයෙන්
නොයෙක් බුද්ධවචනය අසා දැන ඉගෙණ සුරාපානාදියෙහි සො
ඬව සම්පත් පස්මෙන් විසුරුවා හැර අසූ අසූකෙළ ධනඇති

සිවුකුල දෙකක් නසා විනාශයට පැමුණුනු මහාධනසිටානන්ගේ පුතුයා හා ඔහුගේ භාර්‍ය්‍යාව වැනි සොඬවූ අසත්පුරුෂයන් ගම්ඩාකමට ගම්විදනකමට නොපමුණුවා සිල්වත් ගුණවත් සත්පුරුෂයන් භාණ්ඩාගාරාදිවූ ඉසුරුබවෙහි තබා ඔවුන්ගේ සහායත් මුල්කොට ගෙණ දානාදී කුසල්කිරීමෙන් ස්වර්ගාපවර්ගසම්පත්ති ප්‍රතිලාභයට පැමිණෙන්ට උත්සාහ කටයුතු.

යමෙක් මත්ස්‍යමාංසාදිය අනුභවකිරීමෙහි රා පීමෙහි ලොල්ව සම්පත් පස්මෙන් විසුරුවා නසන්නාවූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ භාණ්ඩාගාරාදිවූ යම් ඉසුරුබවෙක තිබූයේ වීනම් ඕහට ධනහානිවශයෙන් පිරිහීමට කාරණයයි කියා මේ ගාථාවෙන් මෙසේ වදාලකල්හි එක්සමයෙක්හි බරනැස බඹදත් නම් රජවූ අපමහබෝසතාණෝ සතරවියටෙක පමණ බර රන්පිකක් ගෙණ එන්ට යන දොරටුපාලයකු දැක තැඳවා කොනනකට යේදැයි විචාළකල දකුණුවහසල සමීපයෙහි මාගේ නිධානයක් ඇත සැනකෙළියකට ඒ ගෙණ එන්ට යෙමියි කීය කොපමණ වස්තු ඇති නිධානයක්දැයි කීකල්හි සතරවියටෙක බරනැයි කීය ඒ සතරවියටට මාගෙන් අටවියටෙක සොළොස් වියටෙක බර රන් දෙම් නොගොස් නවතුවයි යනාදීන් වඩ වඩා ගණන් කියා ගොස් නොනවත්නා හෙයින් දහසක් දෙම් දෙදහසක් දෙමියි වඩවඩා ගොස් කෙළක් දෙමියි නොගොස් නවතුවයි කීකල්හි මුලපටන් මේ කෙළදක්වා මට නියමකළ සියල්ලත් ගණිමි මාගේ සතරවියටෙක බර රන් පිකත් නොහැර ගොස්ගෙණ එමියි කීය. ඉක්බිති රටදෙකට බෙදා දී අධිරාජ්‍යයෙහි පිහිටුවූ සේක. එබඳු රජසිරි සැපතකටත් පැමිණ අර සතරවියටෙක බර රන් පිකත් නොහැරම ගත් අඩිමාසක නම් මහරජසේ පළමුවෙනි දෙවෙනි තුන්වෙනි සතරවෙනි පස්වෙනි සවෙනි සත් අට නවවෙනි දස එකොළොස්වෙනි පරිහානිකාරණය දක්වාම අස අසා ඒ ඒ තැනදීම නොනැවත අවුත් දොළොස්වෙනි කාරණයත් නොහැරම අසා ගෙණ නවතිනුකැමතිවූ දිව්‍යපුත්‍රතෙම "ඉතිහෙතං" යනාදී මේ කෙළවර ගය කීයේය.

ඉතිහෙතං විජානාම එකාදසමො සො පරාභවො,
වාදසමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

එතං, මේ එකොළොස්වෙනි පරිහානිකාරණය; ඉතිහි, (තුන්ලොවට නිවන්නැමති අමාරස බෙදා දෙන මහිමිවූ බුදුරජාණන් වහන්සේ විසින්) මේ වදාළපරිද්දෙන්ම; විජානාම, දැනගතුම්හ;

(එසේ සිතනබම්හ); සො එකාදසමො පරාභවො, (අපට දැනගන් නාපිණිස වදාළහෙයින්) ඒ එකොළොස්වෙනි පරිහානිකාරණය (හෙවත්) එකොළොසෙක; භගවා, (සියලු දෙවිමිනිසුන් සෙවනාය භජනය පර්‍ය්‍යුපාසනය කරණ මහිම්වූ) බුදුරජානන්වහන්ස; වා දසමං, (මාවිසින් කෙළවරකොට අසන්නාවූ) දොළොස්වෙනි පරිහානි කාරණය; බ්‍රෑහි, (අප සියල්ලකෙරෙහි කරුණාකොට) වදාර; පරාභවතො, මෙලොව පිරිහෙන්නාවූ සත්වයාට; මුඛං, වාරය; (හෙවත්) කාරණය; කිං, කවරේද ? (හෙවත් පිරිහීමට කාරණ කවරේදැයි විචාළේය).

මෙසේ යාච්ඤාකොට විචාළ දෙවියාට දොළොස්වෙනි කාරණය ප්‍රකාශකොට දක්වා වදාරන්නාවූ සද්ධම්මකුසුමඵලපත්‍රාලඞ්කෘත සුරද්‍රැමායමානඅපතථාගතගෞතමදිපදොත්තමවූ ත්‍රිලෝගුරුබුදුර ජානන්වහන්සේ ''අප්පභොගො මහාතණ්හො'' යනාදී ගාථාව වදාළසේක.

අප්පභොගො මහාතණ්හො ඛත්තියෙ ජායතෙ කුලෙ,
සො ච රජ්ජං පත්ථයති තං පරාභවතො මුඛං.

අප්පභොගො, (රැස්කොට තබනලද භොග කෙණෙකුන්ගේද අයම්බයක් නැතිහෙයින්) මදවූ උපභොග පරිභොග වස්තුවක් ඇති; මහාතණ්හො, මහත්වූ භොග තෘෂ්ණා ඇති (ලදදෙයකින් සතුටු නොවන); ඛත්තියෙ, ක්‍ෂත්‍රිය රාජකුමාරයෙක්; කුලෙ, ක්‍ෂත්‍රියකුලයෙහි; ජායතෙ, උපදීද; සො ච, ඒ ක්‍ෂත්‍රියජාති ඇති අල්ප භොග මහාතෘෂ්ණා ඇත්තෙක් වනාහි; රජ්ජං, තමාසතුවූ හෝ තමාට නොලැබෙන අනුන්සතුවූ හෝ රාජ්‍යය; පත්ථයති, ප්‍රාර්ථනාකෙරේද; තං, ඒ (යථොක්ත රාජ්‍යය පැතීම); පරාභවතො මුඛං, (ඒ අල්පභොගියා ස්වල්පවූ ධනයත් සහිතවම නස්නාහෙයින්) පිරිහීමට කාරණයයි (වදාළසේක).

අල්පභොගීවූ මහත් තෘෂ්ණාඇති යමෙක් අනුන්සතු රාජ්‍යයක් ප්‍රාර්ථනාකෙළේ වී නම් ඔහට වන හානි මේ සිරිනාගවස්තුවෙන් අසා දතයුතු.

කෙසේද යත් ?.

සුරපුරනිභසව්සිරිසැපතින් ශ්‍රීමත්වූ මේ සිරිලක්දිව එක් සිරිනාගනම්වූ බ්‍රාහ්මණ පුත්‍රයෙක් වූයේය ඒ තෙම ධන සොයා සප යාගෙණ එයින් ජනසඞ්ග්‍රහකොට සිත්ගෙණ අනුරාධපුරනුවර

මෙස්සත් නගා රජවෙසි සිතා ධන උපදවන උපායක් සොයන්නේ දකුණුමහවෙහෙර ථූපයක් දැක මේ වෙහෙර බිඳ වස්තුගෙණ පිරිස් සඞ්ග්‍රහකෙරෙම්යි සිතා බොහෝ මිනිසුන් රැස්කොට ගෙණ ඒ ඒ තැන වෙහෙරවල් බිඳිමින් දකුණුමහවෙහෙරට ගොස් මේ වෙහෙර බිඳුවයි මිනිසුන් යෙදූයේය ඔවුන් වෙහෙර බිඳින සැටිය නොදක්නා ස්වාමීනි මෙහි සැටිය නොදක්නුම්හයි කීවාහුය ඉක්බිති සිරිනාගයා විසින් මෙහි සැටිය කවරෙක් දනීද්දැයි විචාරණලද්දාවූ මනුෂ්‍යයෝ ස්වාමීනි හෙල්ලෝලිය නම් ගම බහුල නම්වූ චණ්ඩාලයෙක් ඇත ඔහු වෙහෙර සැටිය දන්නේයයි කීවාහුය ඉක්බිති හෙතෙම ඔහු ගෙන්වා පින්වත තෙපි මේ වෙහෙර සැටිය දන්නාබව මනුෂ්‍යයෝ බොහෝසෙයින්ම කියන්නාහුය එහෙයින් මෙහි සැටිය දැන බිඳුවයි කීයේය. ඉක්බිති හෙතෙම ස්වාමීන්වහන්ස මම දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිතවූ ප්‍රජාව ඇති සියලු ලොකයාට අග්‍රවූ ශ්‍රෙෂ්ඨවූ භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධවූ බුදුරජානන්වහන්සේගේ සරණ දිවිකෙලවරකොට හෙවත් දිවිහිමියෙන් මට සරණයයි කියා සරණ ගිය උපාසකයෙක් වීමි එහෙයින් දෙවාතිදෙවවූ ඒ ලොකස්වාමීන්වහන්සේගේ ධාතු පිහිටුවාකරණලද වෙහෙර බිඳින්ට නොහැකි වෙමි ස්වාමීනි වෙහෙර බිඳීම නම් ආනන්තර්‍ය අකුශලකර්මය හා සාදෘශ්‍යවන්නේයයි කීය, ඉක්බිති එබඳුවූ බුදුගුණ ඔහුගේ කනඇණේ යකඩඋලක් වැන්විය එහෙයින් කිපී මොහු ගෙණ ගොස් දිවස්හුල හිඳුවවයි කියා උල තිබ්බවූයේය නැවත මනුෂ්‍යයෝ ඔහුගේ පුතුන් සත්දෙනෙක් ඇත ඔහු මේ වෙහෙර සැටිය දන්නාහුයයි කීවාහුය එහෙයින් ඔවුන් සත්දෙනාද ගෙන්වා වෙහෙර බිඳුවයි කී කල්හි ඔහු සත්දෙනාද පියානන් කී ලෙස කියා වෙහෙර බිඳින්ට නොකැමැතිවූවාහුය සිරිනාගයා ඔවුන්ටද කිපී සත්දෙනාම දිවස්හුල තිබ්බවූයේය.

සත්‍යපත් සුවඳ වහනය වන්නාවූ සඳුන් අගරුආදී සුවඳෙහි නොඇලී කුණපයෙහි ඇලෙන නීලමක්ෂිකාදීන් සේ සංසාරබාණ්ඩභූතවූ අසත්පුරුෂයෝ කර්ණරසායනවූ විශුද්ධබුද්ධවචනය අසාත් දැකත් සිත පහදවා ගතනොහී නොයෙක් අවැඩ කොට ගෙණ සතර අපායකට පැමුණුනාහුය.

ඉක්බිති උලතිබූ උපාසකවරු අටදෙනාගේ ගුණානුභාවයෙන් දෙවුලොවින් දෙවියෝ රථ ගෙණවුත් සියලු සත්වයන් බලබලා

සිව්යදීම උල්පිට උන් අටදෙනම රථවල නංවා ගෙණ දිව්‍යසෙනාග හා සමග තුෂිතදිව්‍යලොකයට ගෙණ ගියාහුය, එහි රැස්ළනාවූ මහජනයෝ ඒ ආශ්චර්ය්‍ය දැක ප්‍රසන්නවූ සිත්ඇතිව දෙවයෙනි වෙහෙර නොබිඳුවයි කියා සිරිනාගයාට දන්වූවාහුය හෙතෙම ඔවුන්ගේ වචන අසා ඒ වෙහෙර නොබිඳ හැර මාවැලිගඟ සමීපවූ මධුපිඨික නම් ග්‍රාමය පැහැර කොල්ලකා හැරගෙණ එහි මධුපිඨික නම් වෙහෙර බිඳුවා වස්තුව ගෙණ සේනාවට දී යුද්ධකොට රාජ්‍යය ගෙණ අනුරාධපුරනුවර සේසත් නගා රාජ්‍යයට පැමිණියේය, ඔහුට වෙහෙරවල් බිඳුවා නැසූ ඒ අකුශලයෙන්ම නොබෝකලකින් පිළිසම්කොට ගතනොහැකි තරම් කෘරතර උදර බාධයෙක් වූයේය බොහෝසේ වෛද්‍යාචාරීහුද වෙදකම් කොට ඒ රොගය සුවකොට ගතනුහුනුවාහුය, ඉක්බිති හෙතෙම වස්තුව එක්කොට ගෙණ වෙහෙරතබා බැඳ ප්‍රකෘතිකරවාත් රොගය සන්සිඳුවාගන්ට නොහැකිව එම රොගයෙන්ම මහත්වූ දුකට පැමිණ බඩපැලී කාලක්‍රියාකොට ඌර්ධ්වපාදව ගොස් අතිභයානකවූ දිලී නැගී අග්නිජ්වාලමාලාවෙන් ආකුලවූ අවීචිමහානරකයෙහි උපන්නේය.

එසේ හෙයින් උභයලොකාර්ථකාමීවූ සත්පුරුෂජනයන් විසින් අනුන් සතු රාජ්‍යයකට හෝ ගමකට බිමකට වස්තුවකට හෝ තෘෂ්ණා නූපදවා තමන්ට දැහැමෙන් සෙමෙන් ලදදෙයකින් ජීවත්ව සිරිනාගයාසේ අපායදුකකට නොපැමිණ දානාදී කුසල් කොට ස්වර්ගාපවර්ගසම්පත්තිප්‍රතිලාභයට පැමිණෙන්ට උත්සාහ කටයුතු.

මහත්වූ තෘෂ්ණා ඇති ලදදෙයකින් සතුටුනොවන ක්ෂත්‍රියකුලයෙහි උපන් අල්පභොගීවූ යම් ක්ෂත්‍රියයෙක් අනුන් සතු රාජ්‍යය ගණිමියි සියා පතා නම් උත්සාහ කෙරේනම් ඒ ඔහුට පිරිහීමට කාරණයයි මෙසේ මේ ගාථාවෙන් වදාළ ඉක්බිති දෙවතාවා "තෙරසමං" යනාදීන් මාවිසින් ලක්ෂණයන් කාරණ විචාළේ වීනමුත් අමිතගුණරත්නාකර සද්ධර්මසාගරවූ බුදුරජාණන්වහන්සේ විසඳා වදාරණසේක්ම යයි විපිළිසරබවට පැමිණ මුවෙන් නොබිණියේ හෙවත් කථානොකළේය. ඒ දැන සූත්‍රය නිමවන අසරණජනසරණ කරුණානිධානවූ දශබලධාරීන්වහන්සේ "එතෙ පරාභවෙ ලොකෙ" යනාදීන් ගාථාව වදාළසේක.

එතෙ පරාභවෙ ලොකෙ පණ්ඩිතො සමවෙක්ඛිය,
අරියො දස්සනසම්පන්නො සලොකං භජතෙ සිවන්ති.

පණ්ඩිතො, (විමසන නුවනින් යුක්තවූ) ප්‍රඥාඇත්තේම; ලොකෙ, ("සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකං ලොකෙතීති ලොකො" යනුහෙයින් සුකෘතදුෂ්කෘත සංඛ්‍යාත කුශලාකුශලයන්ගේ කර්ම

ඵලවිපාකය බලානුයි අනුභවකෙරේනුයි යනාර්ථයෙන් ලොක නම්වූ) මේ සත්ත්වලොකයෙහිවූ; එතෙ පරාභවෙ. යථොක්තවූ විසිතුණක් පමණ පරිහානිකාරණයන්; සමවෙක්ඛිය, නුවනැසින් පරීක්ෂාකොට දැන; අරියො. (මාර්ගඵලාධිගමයකින් ආර්යවූ හෙවත් මේ පරාභවමුඛයයි කියනලද අකාරණයෙහි නොපවත්නාහෙයින්) ආර්යවූ; දස්සනසම්පන්නො, (මේ පරිහානිකාරණයන් දන්නා සම්යග්ඥානකින් දුරුකෙරේද) ඒ දර්ශනඥානයෙන් යුක්තවූ; සො, ඒ ප්‍රඥාවන්තවූ පුද්ගලතෙම; සිවං, ක්ෂෙමවූ (උතුම්වූ උපද්‍රව දුරුවූ); ලොකං, දිව්‍යලොකය; භජතෙ, සෙවනය භජනය කරන්නේය (හෙවත් ආයුවර්ණ සැපයසආධිපත්‍යය රූපශබ්ද ගන්ධරස ස්පර්ශය යන දශප්‍රකාරයකින් දිව්‍යාත්මභාව ප්‍රාප්තවන හෙයින් ශ්‍රෙෂ්ඨවූ ගතිඇති උතුම්වූ දිව්‍යලොකයෙහි උපදනේයයි වදාළසේක).

දිව්‍යලොකයෙහි උපදනේයයි වදාළ මේ වචනය ගැණ යථොක්ත තෙවිස්සක් පමණ පරාභවකාරණයෙන් දුරුවූ සත්ත්වයාට දිව සිරිසැප පමණක්මිස නිවන්සිරිසැප නැත කියා සැක නොසිතියයුතු. මේ විසිතුණක් පමණ පරාභවකාරණයෝද අමාමහනිවන්පුර පමුණුවන ආර්යඅෂ්ටාඞ්ගික මාර්ගයට ඇතුළත්හෙයින් කාරණ විසිතුණක් තබා මෙහි මුලකී ධර්මකාමීබවය යන එකම එක කාරණයෙන්ම අමාමහනිවන් සිරිසැප ලැබෙමය මේ සූත්‍රයෙහි වදාළ පරාභවකාරණ විසිතුණෙන් දුරුවූ සත්ත්වයෝ නිවන්සිරි සැපතට පැමිණෙනබව කුමන විශ්‍රමයෙක්ද සූත්‍රදෙශනාවගේ කෙළවර පරාභවකාරණ ඇසූ පමණකටම දසදහසක් සක්වළින් රැස්වූ දෙවි සත් අතුරෙන් සඞ්ඛ්‍යාපථාතික්‍රාන්තවූ දෙවියෝ සතරමග සතර ඵලයට පැමිණ සසරදුකින් මිදී ගියාහුය. මෙසේ අමාමහනිවන් සිරිසැපතට පැමිණ නිවී සැනහී ගිය දෙවියෝ දෙලොස් අවුරුද්දක් මුළුල්ලෙහි කොලාහලකෙරෙමින්. අප කිසිකෙණෙකුන් විසිනුත් එකක් නියමකොට කියාගත නොහැකිව තිබුනු මඞ්ගල ප්‍රශ්නය ඊයේ දවස් විචාළකල දෙතිසක් පමණ මඞ්ගල්‍ය කාරණ වන් තෝරා වදාරා ගණන්වශයෙන් මෙපමණකැයි කියාගත නොහැකි අප අමාමහනිවන් සිරිසැපතට පමුණුවා වදාළසේක. අද පරාභවකාරණ විචාළකල විසිතුණක් පරාභවකාරණ තෝරා වදාරා දසදහසක් සක්වළ නිවන් නොදක සේසව සිටි ගණන්නැති අප අමාමහනිවන් සිරිසැපත්ට පමුණුවා වදාළසේක.

පරාභව සූත්‍ර සන්නය නිමි.

---

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය